# ශ්‍රී ලංකා පුස්තකාල සංගමය
# (SLLA)

උපායමාර්ගික සැලැස්ම
2016-2022

උපායමාර්ගික සැලසුම්කරණ සහ උපායමාර්ගික
මාර්ගෝපදේශක කමිටුව
(SPSDC)

**SPSDC කමිටුව**

උපාලි අමරසිරි මහතා (කැඳවුම්කරු)
ශිවන්ති වීරසිංහ මිය
ඩිල්මිනි වර්ණසූරිය මිය
ආචාර්ය ප්‍රදීපා විජේතුංග මිය
ආචාර්ය චත්මානෙල් සෙනෙවිරත්න මිය
ඩොලිතා අන්ද්‍රාදි මිය
මහාචාර්ය රසල් බෝර්ඩින් මයා
ඩබ්. සුනිල් මයා
පී.බී. ගල්ලබ මයා
වරුණි ගහබඩආරච්චි මිය

**SPSDC කමිටුව සඳහා මාර්ගෝපදේශ**

(2014.10.13 දින පැවති ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාලක මණ්ඩල රැස්වීමේ දී අනුමත කෙරිණි.)

1. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සංවිධාන ව්‍යුහය සහ ක්‍රියාකාරකම් පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් කිරීම

2. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පිළිබඳ SWOT විශ්ලේෂණයක් කිරීම

3. පුස්තකාල සංගම් සඳහා අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA) විසින් නිකුත් කර ඇති නියමු, උපදෙස්, මාර්ගෝපදේශ සහ ප්‍රමිති අධ්‍යයනය කිරීම

4. ප්‍රමුඛ පුස්තකාල සංගම්වල විශිෂ්ට ව්‍යවහාරයන් (Best practices) අධ්‍යයනය කිරීම

5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සීඝ්‍ර සංවර්ධනය සැලකිල්ලට ගනිමින් නූතන යුගය තුළ පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ නියත අවශ්‍යතා සහ ශ්‍රී ලංකාවේ පුස්තකාල හා තොරතුරු සේවා අවශ්‍යතා අධ්‍යයනය කිරීම

6. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සඳහා උපායමාර්ගික මාර්ගෝපදේශ හා උපායමාර්ගික සැලැස්මක් සැකසීම

2016 ජනවාරි 15

ශිවන්ති වීරසිංහ මිය
සභාපති
ශ්‍රී ලංකා පුස්තකාල සංගමය
වෘත්තියවේදී සංගම් සංවිධාන මධ්‍යස්ථානය
කොළඹ 07.

හිතවත් වීරසිංහ මහත්මිය,

**ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ උපායමාර්ගික සැලැස්ම**

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සඳහා උපායමාර්ගික මෙහෙයුම් සමග උපායමාර්ගික සැලැස්මක්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ උපායමාර්ගික සැලසුම් සහ උපායමාර්ගික මෙහෙයුම් කමිටුව සතුටින් ඉදිරිපත් කරමු.

ඔබට ද, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පෙර සිටි සභාපතිතුමියට ද, කමිටුවේ කාර්යය සඳහා අවශ්‍ය සහාය ලබා දීම් ගැන විද්වත් කමිටුවලට ද මෙම කමිටුව වෙනුවෙන් මම ස්තුතිය පුද කරමි. පුස්තකාල සංගමයේ සැලකිය යුතු සාමාජිකයන් පිරිසක් සහ අන්‍යයන් සැලකිය යුතු සංඛ්‍යාවක් විවිධාකාරයෙන් කමිටුවට සහාය විය. ඒ සියල්ලන්ට කෘතඥතාව පුද කරමු.

ස්තූතියි

විශ්වාසී

උපාලි අමරසිරි
කැඳවුම්කරු/SPSDC

**SPSDC කමිටුව කැඳවුම්කරුගේ සටහන**

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ උපායමාර්ගික සැලැස්ම සම්පාදනය කිරීමේ දී කමිටුව පහත කාර්යයන් ඉටු කරන ලදී.

i. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ක්‍රියාකාරකම් පිළිබඳ SWOT විශ්ලේෂණයක් සිදු කිරීම

ii. මෙම විෂය පිළිබඳ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වයේ අදහස් නිශ්චිත කර ගැනීම සඳහා මතවාද සමීක්ෂණයක් පැවැත්වීම

iii. මෙම විෂය පිළිබඳව ජාත්‍යන්තර පුස්තකාල සංගම් සංවිධානය (IFLA) විසින් නිකුත් කර ඇති නියමු, මාර්ගෝපදේශ අධ්‍යයනය කිරීම සහ IFLA විසින් පළ කර ඇති අදාළ සාහිත්‍ය අධ්‍යයනය කිරීම

iv. වෙනත් ප්‍රධාන පුස්තකාල සංගම් විසින් සම්පාදනය කර ඇති උපායමාර්ගික සැලැසුම් සැලකිය යුතු සංඛ්‍යාවක් අධ්‍යයනය කිරීම

v. වෙනත් ප්‍රධාන පුස්තකාල සංගම්වල විශිෂ්ට ව්‍යවහාරයන් හඳුනා ගෙන ශ්‍රී ලංකාවේ තත්ත්වයට එහි පවත්නා අදාළත්වය අධ්‍යයනය කිරීම

vi. 1990-2015 කාලය තුළ රටේ විවිධ පුස්තකාල ක්ෂේත්‍ර වෙතට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ දායකත්වය පිළිබඳ මූලික සමීක්ෂණයක් පැවැත්වීම

vii. ජාතික, පළාත්, ශාස්ත්‍රීය, විශේෂ, රජයේ, මහජන, පාසල් පුස්තකාල ක්ෂේත්‍රවල මෙන්ම රටේ පුස්තකාල අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ නියත අවශ්‍යතා හා උපායමාර්ගික මාර්ගෝපදේශන හඳුනා ගැනීම

viii. තොරතුරු උත්පාදනය, කළමනාකරණය හා ප්‍රවේශය සම්බන්ධ ගෝලීය ප්‍රවණතා සහ ක්ෂේත්‍රය තුළ වෘත්තියවේදී සංවිධානවල පරිණාමය වෙමින් පවතින භූමිකාව විභාග කිරීම

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ උපායමාර්ගික සැලැස්ම සම්පාදනය කිරීමේ දී, කමිටුව එම සැලැස්මට සුවිශේෂ අංග දෙකක් හඳුන්වා දිණි. පළමු අංගය වනුයේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාලපරිච්ඡේදය ආරම්භයේ දී වසර දෙකක නම්‍යශීලී කාලඡේදයක් හඳුන්වා දීමය. මෙය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පළමු උපායමාර්ගික සැලැස්ම වන නිසා එය එකවරම ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතාව කමිටුව හඳුනා ගන්නා ලදී. එහෙයින්, ආරම්භක කාලඡේදය තුළ දී ක්‍රියාත්මක කරනුයේ කුමක්ද සහ කවදාද යන්න තීරණ ගැනීමේ නිදහස ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාලක මණ්ඩලයට සහ විද්වත් කමිටුවලට ලබා දෙයි. එමෙන්ම ප්‍රමුඛතා සහ ක්‍රියාත්මක කිරීමේ වෙනත් අංග හඳුනා ගැනීමටත්, සැලැස්ම අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව හොඳින් දැනුවත් වීමටත්, සාකච්ඡා පැවැත්වීමටත්, බුද්ධි කලම්බන සැසි පැවැත්වීමටත්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නිලධාරීන්ටත් සාමාජිකයන්ටත් මේ මගින් අවස්ථාව ලැබෙනු ඇත. මෙම ක්‍රියාවලිය පහසු කරලීම සඳහා සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාල රාමුවක් සඳහන් නොකෙරේ.

දෙවන විශේෂ අංගය වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුස්තකාල ක්ෂේත්‍රවල නියත අවශ්‍යතා සහ උපායමාර්ගික මාර්ගෝපදේශන ඇමුණුමක් ලෙස මෙයට ඇතුළත් කිරීමය. මෙය සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී, ප්‍රමුඛතා තෝරා ගැනීමේ දී සහ ඉදිරියට ඇති අභියෝගවල ප්‍රබලත්වය තේරුම් ගැනීමේ දී පාලක මණ්ඩලයට, විද්වත් කමිටුවලට සහ සාමාජිකයන්ට සහාය වනු ඇත.

උපායමාර්ගික සැලැස්මක් සම්පාදනය කිරීම අඛණ්ඩ සහ පරිණාමනීය ක්‍රියාවලියකි. මෙය ආරම්භක උපායමාර්ගික සැලැස්ම නිසා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සම්බන්ධයෙන් එය විශේෂ සත්‍යයකි. ඒ තාක් අත්පත් කර ගත් සාර්ථකත්වයන් සහ ක්‍රියාත්මක කිරීමේ පළමු කොටසේ අත්දැකීම් සැලකිල්ලට ගෙන දෙවන වසර අවසානයේ දී සැලැස්ම සංශෝධනය කිරීමට කමිටුව අපේක්ෂා කරයි.

මෙම සැලැස්ම සාර්ථක කර ගැනීම සඳහා ඉදිරි කාලයේ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ඉහළ කළමනාකරණයේ කැපවීම, උද්‍යොගය සහ දැක්මක් සහිත නායකත්වයේ වැදගත්කම ගැන සඳහන් කිරීම අවශ්‍ය නැත. එමෙන්ම උද්‍යොගිමත් නායකත්වය සැපයිය හැකි ප්‍රබල, ගතික පුද්ගලයන් විද්වත් කමිටුවල සිටීම ද තීරණාත්මකව වැදගත් වේ. අවසන් වශයෙන්, අපේක්ෂිත ප්‍රතිඵල අත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය බලපෑම් කිරීමේ කණ්ඩායමක් ලෙස ක්‍රියා කළ යුතු අතර සැලැස්ම ක්‍රියාත්මක වීම සමීපව අධීක්ෂණය කළ යුතුය.

උපාලි අමරසිරි/කැඳවුම්කරු (2016.01.25)

**විධායක සාරාංශය**

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පළමු උපායමාර්ගික සැලැස්ම සම්පාදනය කිරීමේ දී කමිටුව විසින් ලෝකයේ අද දිනයේ යථාර්ථයන් පුළුල් වශයෙන් ද ශ්‍රී ලංකා පුස්තකාල ක්ෂේත්‍රයේ යථාර්ථයන් සුවිශේෂ ලෙස ද සැලකිල්ලට ගන්නා ලදී. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සීග්‍රයෙන් සිදු වන වෙනස තොරතුරුවල මෙන්ම මිනිසුන්ගේ තොරතුරු සෙවීමේ චර්යාවේ ද සෑම අංගයක්ම විප්ලවීය වෙනසකට බඳුන් කර ඇති බව පැහැදිලිය. පුස්තකාලවල, පුස්තකාලයාධිපතීන්ගේ සහ පුස්තකාල සංගම් ඇතුළු පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රධාන සංඝටකයන්හි කැපී පෙනෙන වර්ධනයක් මගින් එම වෙනස්කම හා සම මට්ටමකට පැමිණීමට පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය පොදුවේ උත්සාහ ගනිමින් සිටී.

ශ්‍රී ලංකාවේ පුස්තකාල, පුස්තකාලයාධිපතීන් සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට එම තත්ත්වයට සමීප වීම සඳහා විශාල කාර්යයක් කළ යුතුව තිබෙන බව රහසක් නොවේ. බොහෝ පෙරමුණු තුළ අප සිටිනුයේ සැහෙන පසුපසින් බව තේරුම් ගැනීමට ප්‍රමුඛ පුස්තකාල සංගම්වල ක්‍රියාකාරකම් වෙත එක් බැල්මක් හෙළීම පවා සෑහේ. අපගේ පුස්තකාල පහසුකම් හිඟයකින් පෙළෙන අතර පුස්තකාලයාධිපතීන් බහුතරයක් අවශ්‍ය නිපුණතාවලින් හීනය. එක් අතකින්, අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට අප සංවර්ධන කාර්යයට කරන දායකත්වය පෙන්වන මෙන් බලධාරීන් අපගෙන් ඉල්ලා සිටින අතර අනෙක් අතට අපගේ දායකත්වය ප්‍රදර්ශනය කිරීමට අපට මූල්‍ය සහ වෙනත් පහසුකම් අවශ්‍ය වීම විෂම චක්‍රයක් ලෙස ක්‍රියාත්මක වේ. පසුගිය අඩසියවස තුළ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වෙනසකට ලක් වී ඇත්තේ සුළු වශයෙන් වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් එය වෘත්තීමය වශයෙන් සහ පුළුල් සමාජයේ නව ඉල්ලීම්වලට මුහුණ දීමේ අරගලයක යෙදී සිටී. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වෙත අවංක සහ දැඩි බැල්මක් හෙළීමෙන් අවශ්‍ය වෙනස්වීම් සහ වර්ධනයන් සඳහා පසුබිම සකස් කිරීමට මෙය වේලාවයි.

SWOT විශ්ලේෂණය, මතවාද සමීක්ෂණය, IFLA නියමු සහ බුද්ධිකලම්බන සැසි හරහා කමිටුව උපායමාර්ගික සැලැස්ම තුළ ආමන්ත්‍රණය කළ යුතු ප්‍රමුඛ ක්‍රියාකාරී ක්ෂේත්‍ර අටක් හඳුනා ගනී.

1. සංවිධානමය විශිෂ්ටත්වය සඳහා උත්සාහ කිරීම
2. තොරතුරු වෙත ප්‍රවේශය වර්ධනය කිරීම සහ දැනුම නිර්මාණයට පහසුකම් සැලසීම
3. හොඳින් සැලසුම් කළ උද්දේශන (Advocacy) වැඩසටහනක් සංවිධානය කිරීම
4. සිය උපායමාර්ගික දිශානතීන් සහ ඉලක්ක සපුරා ගැනීමට පුස්තකාල හා තොරතුරු සේවා අංශවලට සහාය වීම
5. අඛණ්ඩ වෘත්තිය සංවර්ධනය සහ අධ්‍යාපනික වැඩසටහන් දියුණු කිරීම
6. සාමාජිකත්වය පුළුල් කිරීම

7. සාමාජිකයන්ගේ දුක් ගැනවිලි ආමන්ත්‍රණය කිරීමට ඇති යාන්ත්‍රණය ශක්තිමත් කිරීම

8. අනෙකුත් ජාතික සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සමග මනා සහයෝගීතාව ඇති කිරීම

කමිටුවේ අදහසට අනුව මෙම ප්‍රමුඛ ක්‍රියාකාරී ක්ෂේත්‍ර අට, පුස්තකාල සංගමය යළි ශක්තිමත් කිරීමට සහ එය ජාත්‍යන්තර රංග භූමිය තුළ ගුණාත්මක සහ ප්‍රගතිකාමී පුස්තකාල සංගම් හා සම මට්ටමකට ගෙන ඒමට තීරණාත්මක වේ. සෑම ප්‍රමුඛ ක්‍රියාකාරී ක්ෂේත්‍රයකම අදාළ අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා උපායමාර්ග සැලකිය යුතු සංඛ්‍යාවක් හඳුනා ගෙන ඇත. සෑම උපායමාර්ගයක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් හා කාර්ය සාධන මිනුම් අදාළ ස්ථානයේ දක්වා ඇත.

පළමු උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට අභියෝගයක් විය හැකි බව කමිටුව හඳුනා ගනී. පසුගිය වසර ගණනාවක් පුරා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය කාර්යයන්හි තරමක සීමිත අභිප්‍රායන් වෙත අවධානය යොමු කරමින් සිටි බව රහසක් නොවේ. එහි ප්‍රතිඵලයක් ලෙස නව යථාර්ථයන් සහ වගකීම් පිළිගැනීම සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ගේ මානසික තත්ත්වය වෙනස් කිරීම පහසු නොවනු ඇත. සැලැස්මේ දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවධාරණයන් පුළුල් කර ඇති අතර එය රටෙහි පුස්තකාල හා තොරතුරු සේවාවන් හි සියලු ක්ෂේත්‍ර ආවරණය කරනු ඇත. අනෙකුත් ප්‍රබල වෘත්තියවේදී සංසද මෙන් පළල්, ජාතික අවධාරණයකින් තොරව ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට සාර්ථක වෘත්තියවේදී සංසදයක් මෙන් කටයුතු කළ නොහැක. අප සාම්ප්‍රදායික මාවතේ ගමන් කරමින් සීමිත අවධාරණයන් පවත්වා ගෙන යමින් දුර්වල සංගමයක් ලෙස කටයුතු කරන්නේ ද නැතහොත් අරමුණු වෙනස් කර පුළුල් ජාතික අවධාරණයන් සහිත, ජවසම්පන්න ශක්තිමත් සංගමයක් බවට පත් වන්නේ දැයි අප තීරණය කළ යුතුව ඇත.

අනෙක් තීරණාත්මක අංගය වන්නේ නව න්‍යාය පත්‍රයක් තුළ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ගේ සක්‍රිය දායකත්වයේ වැදගත්කම වේ. සාමාජිකයන් වගකීම් කරට ගෙන ශක්තිමත් උද්දේශන කණ්ඩායමක් ලෙස ක්‍රියා කළ යුතුය. එමෙන් ම ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සැබෑ සහ ශක්තිමත් වෘත්තියවේදී සංසදයක් ලෙස ක්‍රියා කරන්නේ දැයි අවධානයෙන් සිටිය යුතුය. මෙම සැලැස්ම මගින් සාමාජිකයන්ට පාලක මණ්ඩලයට සම්බන්ධ වීමටත්, විද්වත් කණ්ඩායම්වල කටයුතු කිරීමටත්, විශේෂ රුචිකත්ව කණ්ඩායම්වලට (Special interest groups) සම්බන්ධ වීමටත්, වෘත්තිය සමිති ගොඩ නංවා ගැනීමටත් පහසුකම් සලසා ඇත. භූගෝලීය දුරස්ථභාවය, වර්ධනය වන වාහන තදබදය, කාර්ය බහුල කාර්යාල සහ ගෘහස්ථ වගකීම් සහ වෙනත් කාල වේලාවන්හි සීමාකම් වැනි බාධක ජය ගැනීම සඳහා මාර්ගගත සංසද, සමාජ මාධ්‍ය, විද්‍යුත් තැපැල් කණ්ඩායම් හරහා කටයුතු කිරීමට සාමාජිකයන් දිරිමත් කෙරේ.

සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවධි දෙකක් කමිටුව යෝජනා කරයි. එය යෝජනා කරනුයේ පළමු වසර දෙක, ප්‍රමිත උපාය මාර්ගික සැලැස්මක දැඩි ව්‍යුහයෙන් තොරව නම්‍යශීලීව කටයුතු කිරීම සුදුසු බවය. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මීළඟ පාලක මණ්ඩලය විසින් එවන් පුළුල් සැලැස්මක්

ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතාව කමිටුව හඳුනාගනී. මෙම තත්ත්වයට මුහුණ දීම සඳහා කිසිදු ඉලක්ක, ප්‍රමුඛතා හෝ කාල සැලැස්මක් නොමැතිව පළමු වසර දෙක තුළ ක්‍රියාත්මක වීමට අවශ්‍ය මිත්‍රශීලී, සැහැල්ලු වටපිටාවක් සැලැස්ම සපයයි. ක්‍රියාත්මක කරන්නේ සැලැස්මේ කුමන ක්‍රියාමාර්ග ද සහ කවදාද යන්නත් එය කරන ආකාරයත් තෝරා ගැනීම මීළඟ පාලක මණ්ඩලයට සහ විද්වත් කමිටුවලට පැවරෙන කාර්යයක් වේ. අවශ්‍ය තාක්ෂණික සහ වෙනත් සහායන් ලබා දීම මගින් යෝජිත අධීක්ෂණ හා ක්‍රියාත්මක කිරීමේ කමිටුව විසින් පාලක මණ්ඩලයට, විද්වත් කමිටු සහ වෙනත් සංසද වෙත සහාය දෙනු ඇත.

මෙම කාලය තුළ පාලක මණ්ඩලයට, විද්වත් කණ්ඩායම් සහ සාමාජිකයන්ට සැලැස්ම අධ්‍යයනය කිරීමටත්, සැලැස්ම පිළිබඳ සම්මන්ත්‍රණ, සාකච්ඡා හා බුද්ධි කලම්බන සැසි පැවැත්වීමටත්, ඔවුන් ක්‍රියාත්මක කරන්නට අපේක්ෂිත සැලැස්මේ ක්ෂේත්‍ර මෙන්ම, සැලැස්මේ තවදුරටත් දියුණු කළ යුතු අංශ හඳුනා ගැනීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙනු ඇත. වසර දෙකක කාලච්ඡේදය අවසානයේ, සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා එය සමීප විවේචනාත්මක පිරික්සීම හරහා උපායමාර්ගික සැලැස්ම පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නිලධාරීන්ට, කමිටුවලට සහ සාමාජිකයන්ට හැකිවනු ඇති බව කමිටුව අපේක්ෂා කරයි. මෙය පළමු අවධිය අවසානයේ සැලැස්ම සංශෝධනය කිරීමටත් ඊළඟ වසර හතර සඳහා වඩාත් විද්‍යාත්මක සහ ප්‍රබුද්ධ සැලැස්මක් සංවර්ධනය කිරීමටත් පහසුකම් සලසනු ඇත.

2018-2022 ලෙස අනුමාන කළ හැකි ඊළඟ කාලච්ඡේදයට, කාල රාමු ආදිය ඇතුළත් සියලු අත්‍යවශ්‍ය අංග සහිත වඩාත් වර්ධිත හා සවිස්තරාත්මක උපාය මාර්ගික සැලැස්මක් සම්පාදනය වනු ඇත. එම කාලය වන විට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ මනා අවබෝධයක් සහිත අත්දැකීම් බහුල ප්‍රධාන නිලධාරීන් සහ උද්‍යොගිමත් සාමාජිකයන්ගෙන් යුත් වඩාත් පරිණත සංසදයක් වනු ඇත. මොවුන් මෙම දෙවන කාලච්ඡේදය තුළ නව උපාය මාර්ගික සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක වීම සහතික කරනු ඇති අතර ඒ මගින් ශ්‍රී ලංකාවේ පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රයේ භූමි දර්ශනය වෙනස් කරනු ඇත.

# ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ උපාය මාර්ගික සැලැස්ම
# (2016-2022)

## 1. පසුබිම් තොරතුරු

### 1.1. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

1960 දී ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා පුස්තකාල සංගමය 1985 දී සිය 25 සංවත්සරය ද 2010 දී 50 වන සංවත්සරය ද සමරන ලදී. පසුගිය දශක පහ හමාර තුළ ශ්‍රී ලංකාවේ පුස්තකාල හා තොරතුරු සේවාවේ සංවර්ධනයට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය කැපී පෙනෙන දායකත්වයක් සපයා ඇත. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය එහි සාමාජිකයන්ගේ උනන්දුන් මෙන් ම ජාතික, ශාස්ත්‍රිය, විශේෂ, රජයේ, මහජන හා පාසල් ඇතුළු විවිධ පුස්තකාල ක්ෂේත්‍රයන් හි උනන්දුන් ද නියෝජනය කරයි. එයට 1974 අංක 20 දරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (සංස්ථාපිත) පනතින් නීතිමය ආවරණය ලැබී ඇති අතර 2004 අංක 7 දරන පනත මගින් එය සංශෝධනය කෙරිණි.

### 1.2. ව්‍යුහය

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ව්‍යුහය ආයතනික සහ ආයතනික නොවන ලෙස හඳුන්වන සාමාජිකත්ව වර්ග දෙකක් මත පදනම්ව තිබේ. 400ක් පමණ වන සාමාජිකත්වය, පුළුල් පුස්තකාල ජාලයත්, සංගමයේ අඩසියවසක පැවැත්මත් අනුව සලකා බැලීමේ දී සෑහීමකට පත් විය හැකි සංඛ්‍යාවක් නොවේ. මෙහි ඉහළම අධිකාරිත්වය පාලක මණ්ඩලයයි. එයට ප්‍රධාන නිලධාරීන් ද, වෙනත් පුස්තකාල ක්ෂේත්‍රවල නියෝජිතයන් ද, පත් කරන ලද සාමාජිකයන් දෙදෙනෙක් ද අයත් වේ. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රධාන ව්‍යුහය සමන්විත වනුයේ පාලක මණ්ඩලය, විධායක කමිටුව සහ විද්වත් කමිටුවලිනි.

### 1.3. ප්‍රධාන ක්‍රියාකාරකම්

ජුනි මාසයේ පවත්වන වාර්ෂික මහා සභාව සහ වාර්ෂික විද්වත් සම්මන්ත්‍රණය (NACLIS) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. රටෙහි ප්‍රධාන පුස්තකාල විද්‍යා පාඨමාලාවක් වන පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමාව (DIPLIS) පවත්වාගෙන යාම ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මුඛ්‍යතම ව්‍යාපෘතිය වේ. මෙයට අමතරව පුළුල් පරාසයක අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම,

උපදේශන සේවාවලට සම්බන්ධ වීම, Sri Lanka Library Review වෘත්තියවේදී සඟරාව සහ ත්‍රෛමාසික පුවත්පත්‍රිකාව පළ කිරීම සහ විවිධ ක්ෂේත්‍රවල වෙනත් සංවර්ධන වැඩසටහන් ගණනාවක් පැවැත්වීම ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අනෙක් ව්‍යාපෘති වේ.

## 2. දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය

### 2.1. <u>දැක්ම</u>

ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන වෘත්තියේ මග පෙන්වන ආලෝකය සහ ප්‍රදීපය වීමත්, සියලු භූගෝලීය කලාප ආවරණය කරමින් සහ ගුණාත්මක තොරතුරු සම්පත් වෙත සියලු ජනතාවට ප්‍රවේශය සපයමින් විශිෂ්ට, නූතන පුස්තකාල හා තොරතුරු සේවා ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ දැක්ම වේ.

### 2.2. <u>මෙහෙවර</u>

වෘත්තිය ප්‍රමිතීන් සකසමින්, පුස්තකාලවල සුබසාධනයේ දී සියලු පුද්ගලයන්ගේ සහ සංවිධානවල රුචිකත්වයන් අතර සහයෝගීතාව ඇති කරමින්, ඉහළ ගුණාත්මක අගයකින් යුත් අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන් සහ වෙනත් පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපන වැඩසටහන් සපයමින්, සංගමයේ සාමාජිකයන් අතර අදහස් හුවමාරු කර ගැනීමේ සංවාද මණ්ඩපයක් වෙමින් පුස්තකාල හා තොරතුරු වෘත්තිකයන්ගේ අයිතීන්, වරප්‍රසාද සහ තත්ත්වය ආරක්ෂා කර ප්‍රවර්ධනය කරමින් රටෙහි අනාගත පුස්තකාල අවශ්‍යතාවන් පිළිබඳ ක්‍රියාමාර්ග සම්පාදනය කිරීමේ දී නායකත්ව භූමිකාව රඟ දක්වමින් ශ්‍රී ලංකාවේ පුස්තකාල, ප්‍රලේඛන සහ තොරතුරු සේවා සඳහා ප්‍රමුඛ වෘත්තිය සංවිධානය ලෙස කටයුතු කිරීම ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මෙහෙවර වේ.

## 3. සංගමයේ ප්‍රධාන වටිනාකම්

3.1. **<u>යාවත්කාලීන ගතික පුස්තකාල හා තොරතුරු සේවාවන්</u> :** ශ්‍රී ලංකාව තුළ පුස්තකාල හා තොරතුරු සේවාව වර්ධනය කිරීම සහ නවීකරණය කිරීම

3.2. **<u>ජාතික සංවර්ධනයේ දී සක්‍රිය හවුල්කාරිත්වය</u> :** රටෙහි මානව සම්පත සංවර්ධනය සහ බහුවිධ ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා අදාළ, ගුණාත්මක තොරතුරු සැපයීම

3.3. **<u>උද්දේශනය</u> :** පුස්තකාල සහ පුස්තකාල තොරතුරු සේවා කාර්ය මණ්ඩලවල වටිනාකම්, අයිතීන් සහ වරප්‍රසාද වෙනුවෙන් පෙනී සිටීමත්, ඊට සහාය දීමත් සෑම ජාතික වැඩසටහනකදී ම තොරතුරු පිළිබඳ කේන්ද්‍රීය භූමිකාව වෙනුවෙන් පෙනී සිටීමත් මගින් පුස්තකාල හා තොරතුරු සේවා ප්‍රවර්ධනය කිරීම

3.4. **<u>පුස්තකාල හා තොරතුරු සේවා අංශ සහ පුස්තකාල වෙත සහාය දීම</u> :** ඉහළ ගුණාත්මක බවින් යුත් නවීන පුස්තකාල හා තොරතුරු සේවා සැපයීමට සියලු පුස්තකාල හා තොරතුරු සේවා අංශවලට උපරිම ආධාර සහ සහාය ලබා දීම

3.5. **<u>වෘත්තීයවේදීත්වය සහ වෘත්තීය ආචාර ධර්ම ප්‍රවර්ධනය කිරීම</u> :** පුස්තකාල සංගමයේ සාමාජිකයන් අතර වෘත්තීයවේදීත්වය, ආචාර ධර්ම, සමාජ වගකීම සහ අවංකත්වය අවධාරණය කිරීම

3.6. **<u>සාමාජිකයන් වෙත සහාය හා ආධාර සැපයීම</u> :** ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ගේ වෘත්තීය නිපුණතා වර්ධනය සඳහා නිරන්තරයෙන් කටයුතු කිරීම සහ වෘත්තිය සංවර්ධනය සහ ආයතනික ගැටලුවල දී ඔවුනට සහාය වීම

3.7. **<u>එකමුතුබව ප්‍රවර්ධනය</u> :** සමාජයේ සියලු ජාතිකත්ව, සමාජීය, ආගමික සහ වෙනත් විවිධ කණ්ඩායම් එකමුතු කිරීම, සහයෝගීතාව සහ සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම

3.8. **<u>නවෝත්පාදනය</u> :** අභියෝගයන්ට මුහුණ දීමේ දී නොසැලී සිටීම සහ නවෝත්පාදනය

## 4. ප්‍රධාන ක්‍රියාමාර්ග ක්ෂේත්‍ර

4.1. සංවිධානමය විශිෂ්ටත්වය සඳහා ප්‍රයත්න දැරීම

4.2. තොරතුරු වෙත ප්‍රවේශය වර්ධනය කිරීම සහ දැනුම නිර්මාණයට පහසුකම් සැලසීම

4.3. මනාව සැලසුම් කරන ලද බලපෑම් කිරීමේ උද්දේශන වැඩසටහන් සංවිධානය කිරීම

4.4. ස්වකීය උපාය මාර්ගික මෙහෙයුම් සහ ඉලක්ක සපුරා ගැනීමට පුස්තකාල සහ විඥාපන විද්‍යා ක්ෂේත්‍රවලට සහාය වීම

4.5. අඛණ්ඩ වෘත්තිය සංවර්ධනය සහ වෙනත් අධ්‍යාපන වැඩසටහන් වර්ධනය කිරීම

4.6. සාමාජිකත්වය ව්‍යාප්ත කිරීම

4.7. සාමාජිකයන්ගේ දුක්ගැනවිලි ආමන්ත්‍රණය කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම

4.8. ප්‍රධාන ජාතික සහ ජාත්‍යන්තර හවුල්කරුවන් අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම

## 5. ප්‍රධාන ක්‍රියාමාර්ග (KA)

### 5.1. <u>KA 1-සංවිධානමය විශිෂ්ටත්වය</u>

සංගමයේ ව්‍යුහය, පාලනය, වාර්ෂික සැලසුම්, කාර්ය ප්‍රවාහය, කළමනාකරණයේ ඵලදායිත්වය, සාමාජිකයන් සහ ප්‍රධාන හවුල්කරුවන් සමග අන්තර් ක්‍රියාකාරිත්වය, කාර්යාල පහසුකම් සහ කාර්යාල පරිපාලනය, අරමුදල් සහ දුර්වලතා සහ අඩුපාඩු දෙස විවේචනාත්මකව බැලීම සහ දුර්වලතා මගහැරවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

### 5.1.2. <u>අභිමතාර්ථ</u>

**<u>අභිමතාර්ථය 1 :</u>**

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ව්‍යුහය සහ කාර්යමය ඵලදායිත්වය වර්ධනය කිරීම

**<u>අභිමතාර්ථය 2 :</u>**

ගුණාත්මක කළමනාකරණ ව්‍යවහාරයන් පිළිපැදීම සහ කාර්යාල පහසුකම් දියුණු කිරීම

**<u>අභිමතාර්ථය 3 :</u>**

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මූල්‍යමය ස්ථාවරත්වය වර්ධනය කිරීම

**<u>අභිමතාර්ථය 4:</u>**

සාමාජිකයන් සමග සන්නිවේදනය වර්ධනය කිරීම සහ ඔවුන් සංගමයේ කටයුතු සඳහා අඛණ්ඩව සහභාගී කර ගැනීම

### 5.1.3. <u>උපාය මාර්ග</u>

i. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ව්‍යුහය සහ කළමනාකරණ ව්‍යවහාරයන් විමර්ශනය කිරීම සහ අවශ්‍ය ස්ථාන සඳහා වර්ධනයන් හඳුන්වා දීම

ii. කමිටු/කණ්ඩායම් සහ කලාපීය අංශ විමසුමට ලක් කිරීම සහ හැකිතාක් ප්‍රායෝගික ලෙස පුස්තකාල හා තොරතුරු සේවාවේ සියලු අංශ, ප්‍රධාන ව්‍යාපෘති සහ පළාත් නියෝජනය කිරීමට කමිටු සහ කණ්ඩායම් පත් කිරීම. වැදගත් අංශ සහ ක්ෂේත්‍ර නියෝජනය කිරීමට කමිටු හෝ කණ්ඩායම් පැවතීම ලොව පුරා පුස්තකාල සංගම්වල ප්‍රමිත යාන්ත්‍රණයකි.

iii. සාමාජිකයන් සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය යා කරන පාලමක් ලෙස මෙන්ම විවිධ පුස්තකාල හා තොරතුරු සේවාවන් නියෝජනය කරන විද්වත් කමිටුවල තීරණාත්මක වැදගත්කම අවබෝධ කර ගැනීම. විද්වත් කමිටුවල සංයුතිය, ගුණාත්මක බව, බලතල සහ වගකීම් වර්ධනය කිරීම. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ක්‍රියාකාරකම්වලටත්, සාමාජිකයන් සමග සබඳතාවලටත්, සාමාජිකයන්ගේ දුක්ගැනවිලි ආමන්ත්‍රණය කිරීමටත් විශේෂයෙන් සංගමය මගින් අනුදත් ඉලක්ක සපුරා ගැනීමටත් මෙම කමිටු විශාල බලපෑමක් කරනු ඇත.

iv. සාම්ප්‍රදායික රැස්වීම්වලට අමතරව හැකිතාක් දුරට විද්‍යුත් තැපැල් සංවාද, මාර්ගගත සංවාද මණ්ඩප ආදිය භාවිත කිරීමට කමිටු දිරිමත් කිරීම. ප්‍රවාහන දුෂ්කරතා සහ වාහන තදබදය හේතු කොට ගෙන කොළඹින් බැහැර ප්‍රදේශවල සිටින ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ඇතැම් සාමාජිකයන් සංගමයේ කමිටුවල තනතුරු හෝ සාමාජිකත්වය ලබා ගැනීමට මැලිකමක් දක්වති.

v. විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතීන්ගේ සංගමය (ULA) වැනි වෘත්තීය සංගම් නිර්මාණයට සහ පවත්නා එබඳු සංගම් ප්‍රාණවත් කිරීමට පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රයේ සෑම අංශයකටම ධෛර්යය දීම. ඒ මගින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට ඇති පීඩාකාරී බව අඩු කරනු ඇත. එමෙන්ම එකිනෙකා සමග අන්‍යොන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීම මගින් සෑම පාර්ශවයකටම වැඩි යහපතක් සිදු වනු ඇත.

vi. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාලක මණ්ඩලයේ, කමිටුවල සහ කණ්ඩායම්වල නිලධාරීන් සියල්ලන් සඳහාම හොඳින් නිර්වචනය කරන ලද රාජකාරී ලැයිස්තුවක්, මාර්ගෝපදේශයක් සහ වගකීම් ලැයිස්තුවක් ලබා දිය යුතුය. මෙය වගකීම් පිළිබඳ අත්පොතක් ලෙස සෑම අධ්‍යයන වර්ෂයක් ආරම්භයේ දී ම නිලධාරීන් අතර බෙදා හැරිය හැකි අතර ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වෙබ් අඩවියට ද ඇතුළත් කළ හැකිය.

vii. පාලක මණ්ඩලයට/විධායක කමිටුවට අලුත් මුහුණු ආකර්ශනය කර ගැනීමේ වැඩසටහනක් දියත් කිරීම සහ අඛණ්ඩව දීර්ඝ කාලයක් තනතුරු දැරූ අයට, සුදුසු අවස්ථාවල තම තනතුරුවලින් ඉවත් වී සාමාන්‍ය සාමාජිකයන් ලෙස කමිටුවලට බැඳී ස්වකීය කාර්ය අඛණ්ඩව කර ගෙන යාමට ඔවුන් දිරිමත් කිරීම

viii. නිලධාරි මණ්ඩලය සඳහා හොඳින් සැලසුම් කරන ලද ඵලදායි නායකත්ව සංවර්ධන වැඩසටහනක් දියත් කළ යුතුය. මෙය කොටස් දෙකකට කිරීම සුදුසුය. ඒ අනුව ප්‍රධාන වැඩසටහන වර්ෂය ආරම්භයේදීත් දෙවන වැඩසටහන වසර මධ්‍යයේදීත් දියත් කළ හැකිය. කරන ලද කාර්යයෙහි ඇගයීම සහ තක්සේරුව දෙවන වැඩසටහනට ඇතුළත් කළ යුතුය.

ix. ඉවත් වන නිලධාරීන් සහ අලුතින් පත්වන නිලධාරීන් අතර වසර මුලදීම සංවාදයක් පැවතිය යුතුය. තම ධූර කාලය තුළ කරන ලද ක්‍රියාකාරකම්, සාර්ථකත්වයන්, අසමත්කම්, අඛණ්ඩව ක්‍රියාත්මක වන ව්‍යාපෘති, මුහුණ දුන් දුෂ්කරතා, වෙනත් අත්දැකීම් ආදිය පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාවක් ඉවත්ව යන සෑම

නිලධාරියෙකුම අලුතින් පත්වන නිලධාරියාගේ ප්‍රයෝජනය සඳහා සම්පාදනය කළ යුතුය.

x. ස්වකීය රුචිකත්වයන් පිළිබඳ වෘත්තීය ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමට සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ක්‍රියාකාරකම්වලට දායක වීම සඳහා විශේෂ රුචිකත්ව කණ්ඩායම් (Special interest groups) නිර්මාණය කිරීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් වෙත අවස්ථාව සැපයීම. මෙම විශේෂ රුචිකත්ව කණ්ඩායම්වලට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නිල තත්ත්වයන් නොලැබුණ ද සංගමයේ ව්‍යුහයෙන් පරිබාහිරව සිට අර්ථවත් භූමිකාවක නියැලිය හැකිය. ඔවුනට පුස්තකාල වාස්තු විද්‍යාව, දුර්ලභ ග්‍රන්ථ, පුස්කොළ පොත්, සමාජ මාධ්‍ය සහ පුස්තකාල සේවා, ආපදා කළමනාකරණය හෝ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විද්වත් කමිටුවල විෂය පථ සමග සෘජුව නොගැටෙන විෂයයන් ආවරණය කළ හැකිය. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාලක මණ්ඩලය මෙම විශේෂ රුචිකත්ව කණ්ඩායම් සඳහා මාර්ගෝපදේශක මාලාවක් සම්පාදනය කළ යුතුය.

xi. සංගමයේ පූර්ව පරිපාලකයන් විසින් දියත් කළ ගුණාත්මක ව්‍යාපෘති අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු අතර ඒවා නැවැත්විය යුත්තේ ප්‍රවේශම් සහගත සලකා බැලීමකින් සහ පුළුල් උපදේශනයකින් පසුව පමණි. එසේ සිදු වන විට ඊට අදාළ සාධාරණීකරණයන් සමග එම තොරතුරු සංගමයේ වාර්ෂික වාර්තාවට ඇතුළත් කළ යුතුය.

xii. ශ්‍රී ලංකා පුස්තකාල සංගම් කාර්යාලයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන විධායක නිලධාරියෙකු/පුහුණු කළමනාකරුවෙකු පත් කිරීම සහ කාර්යාල කටයුතු පවත්වා ගෙන යාමට අමතරව ඔහු/ඇය වෙත ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ, අධීක්ෂණය කිරීමේ සහ මෙහෙයවීමේ බලතල පැවරීම. මේ සඳහා සුදුසුම ක්‍රියාමාර්ගය ලෙස සේවා දිගුවක සලකා බැලීමට යටත්ව සීමිත කාලපරිච්ඡේදයක් (උදා: වසර 2) සඳහා ප්‍රසිද්ධ දැන්වීමක් මගින් සුදුසු පුද්ගලයෙකු බඳවා ගැනීම දැක්විය හැක. මෙම ක්‍රියාමාර්ගය මූල්‍යමය හේතු නිසා ප්‍රායෝගික නොවන්නේ නම් අර්ධකාලීන පදනම මත ප්‍රධාන විධායක නිලධාරියෙකුගේ සේවය ලබා ගැනීම සලකා බැලිය හැකිය.

xiii. ගුණාත්මක බව වර්ධනය සඳහා කාර්යාල කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම සහ ගුණාත්මක කාර්යාල ව්‍යවහාරයන් හඳුන්වා දීම.

xiv. මනා සේවාවක් සැපයීම සඳහා ස්වකීය කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමට අවශ්‍ය පුහුණු පහසුකම් කාර්ය මණ්ඩලයට සැපයීම

xv. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සඳහා අමතර ඉඩකඩ ලබා ගැනීම. විද්වත් වෘත්තියවේදී සංවිධාන පරිශ්‍රයෙන් ම මෙය ලබා ගත හැකි නම් එය වැදගත් වේ. මෙම ඉඩකඩ මදකම සංගමයේ කාර්ය සාධනයට ප්‍රබලව බලපා ඇත. දැනටමත් තාවකාලිකව ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාලය ස්ථානගත කර ඇත්තේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේය.

xvi. සියලු නිලවාර්තා, සම්මන්ත්‍රණ, සැසි වාර්තා ඩිජිටල්ගත කරමින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය තුළ ඩිජිටල් ලේඛනාගාරයක් සැකසීම. දේශීය පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු පනත්, රෙගුලාසි, ආඥා පනත්, චක්‍රලේඛ, ගැසට් නිවේදන, ප්‍රමිති පිළිබඳ ප්‍රශස්ත එකතුවක් මෙම ඩිජිටල් ලේඛනාගාරයේ තැන්පත් කළ යුතුය. එමෙන් ම ඩිජිටල් ආකෘතියෙන් පවත්නා යුනෙස්කෝ, ඉෆ්ලා, ජාත්‍යන්තර පාසල් පුස්තකාල සංගම් ප්‍රකාශන, නියමු, ප්‍රමිති සහ වෙනත් සම්බන්ධිත සාහිත්‍යය ද ඊට ඇතුළත් කළ හැකිය. උද්දේශන කාර්ය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ඩිජිටල්ගත කිරීමට ප්‍රමුඛත්වය දිය යුතුය.

xvii. වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය, වෘත්තියවේදී ශාස්ත්‍රීය සඟරාව, පුස්තකාල හා තොරතුරු විද්‍යා ජාතික සම්මන්ත්‍රණය සහ අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන් හරහා සාමාජිකයන් අතර වෘත්තියවේදීත්වයේ වැදගත්කම අවධාරණය කිරීම

xviii. පුවත් පත්‍රිකාවට අමතරව, සිය සාමාජිකයන් සමග නිරන්තරයෙන් සන්නිවේදනය කිරීමට සෑම විද්වත් කමිටුවකටම සහ ප්‍රධාන ව්‍යාපෘතියකට යාන්ත්‍රණයක් තිබිය යුතුය. උදා: විද්යුත් තැපැල් කණ්ඩායම්, විද්යුත් පුවත් පත්‍රිකා ආදිය

xix. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පෙනුම (visibility) වර්ධනය කිරීමටත් සාමාජිකයන් අතර සහ මහජනතාව සමග සන්නිවේදනය ශක්තිමත් කිරීමටත් ෆේස්බුක්, ට්විටර් සහ වෙනත් සමාජ මාධ්‍ය භාවිතය සක්‍රිය කිරීම

xx. ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණය, සාමාජිකත්වය ව්‍යාප්ත කිරීම, නව ආදායම් ජනන ව්‍යාපෘති සහ අරමුදල් වර්ධන ව්‍යාපෘති දියත් කිරීම මගින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මූල්‍ය ස්ථාවරත්වය වැඩිදියුණු කිරීම

xxi. මහජනතාවගේ සහ බලධාරීන්ගේ අවධානය ලබා ගැනීමට අදාළ ගැටලු පිළිබඳ මාධ්‍ය නිවේදන වරින් වර නිකුත් කිරීම සහ මාධ්‍ය සමග සබඳතා පැවැත්වීම

xxii. ඉෆ්ලා නියමු සහ ශ්‍රී ලංකාවේ තත්ත්වයන්ට ගැලපෙන වෙනත් පුස්තකාල සංගම්වල විශිෂ්ට ව්‍යවහාරයන් අනුගමනය කිරීම.

## 5.2. KA 2 - තොරතුරු වෙත ප්‍රවේශය සහ දැනුම නිර්මාණ පහසුකම් වර්ධනය කිරීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් භාවිතයෙන් පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන වෙත පහසු ප්‍රවේශය සැපයීම මගින් රටෙහි සියලු පුරවැසියන් සඳහා තොරතුරු ලබා ගැනීමේ පහසුකම වර්ධනය කිරීම. ළමයින්, සිසුන්, පර්යේෂකයන්, තරුණයන්, වයස්ගත වූවන්, වෙනත් හැකියා සහිත පුද්ගලයන් ඇතුළු සියලු සමාජ කණ්ඩායම්වලට දැනුම නිර්මාණය සඳහා තීරණාත්මක වන ගුණාත්මක තොරතුරු වෙත ප්‍රවේශය තිබිය යුතුය.

### 5.2.1. <u>අභිමතාර්ථ</u>

<u>**අභිමතාර්ථය 1 :**</u>

තොරතුරු සන්නිවේදන ක්ෂේත්‍රයේ සීග්‍ර වෙනස්වීම සහ එය තොරතුරු ගබඩා කිරීමට, තොරතුරු ගවේශනයට, තොරතුරු බෙදා හැරීමට කරනු ලබන බලපෑම තේරුම් ගැනීම සහ මෙම නව තත්ත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා රටට, පුස්තකාල අධිකාරින්ට සහ පුස්තකාලයාධිපතින්ට මග පෙන්වීම

<u>**අභිමතාර්ථය 2 :**</u>

තොරතුරු වෙත ප්‍රවේශය සඳහා ඇති බාධක හා අවහිරතා හඳුනා ගැනීම සහ එම බාධක ඉවත් කිරීම

<u>**අභිමතාර්ථය 3 :**</u>

සියලු පුස්තකාල හා පුස්තකාල සේවා ප්‍රවර්ධනය කිරීම, ව්‍යාප්ත කිරීම සහ නවීකරණය කිරීම

<u>**අභිමතාර්ථය 4 :**</u>

තොරතුරු සාක්ෂරතා හා ඩිජිටල් සාක්ෂරතා වැඩසටහන් මගින් පාඨකයන් සවිබල ගැන්වීම

### 5.2.2. උපායමාර්ග

I. පුස්තකාල ක්ෂේත්‍රයේ සිදුව ඇති වෙනස්කම් පිළිබඳ පුස්තකාල අධිකාරීන් (පළාත් පාලන බලධාරීන්, අධ්‍යාපන බලධාරීන්, උසස් අධ්‍යාපන බලධාරීන් ආදී) දැනුවත්

කිරීමේ සහ ඒ අනුව පුස්තකාල හා තොරතුරු සේවා නවීකරණය කිරීමේ වැදගත්කම අවධාරණය කිරීමේ වැඩසටහන් දියත් කිරීම

II. පවත්නා පුස්තකාල නවීකරණය කිරීමටත් පහසුකම් අඩු ප්‍රදේශ වෙත විශේෂ අවධානයක් සහිතව පාසල්, මහජන, විශේෂ, ශාස්ත්‍රීය හා වෙනත් ක්ෂේත්‍රවල පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන තවදුරටත් ගොඩ නැංවීමටත් බලධාරීන් දිරිමත් කිරීම

III. විවිධ පුස්තකාල අංශයන් ශක්තිමත් කිරීම සඳහා නව පුස්තකාල ව්‍යවස්ථා හඳුන්වා දීම හෝ පැරණි පුස්තකාල ව්‍යවස්ථා සංශෝධනය කිරීම සඳහා අදාළ බලධාරීන්ට සහාය වීම. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් ම හෝ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සමග එක්ව නව හෝ සංශෝධිත ව්‍යවස්ථා කෙටුම්පත් සකසා අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා බලධාරීන්ට සැපයීම

IV. පුස්තකාලවල ගුණාත්මක බව වර්ධනය කිරීමට පුස්තකාල ප්‍රමිති සම්පාදනය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට සහාය වීම සහ අවශ්‍ය අවස්ථාවල දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රමිති සම්පාදනය කිරීම

V. පුස්තකාල සඳහා ප්‍රමාණවත් සම්පත් සැපයීමට බලධාරීන් එකඟ කර ගැනීම. ස්වකීය පුස්තකාල සඳහා එවන් සම්පත් සැපයීමක් නොකරන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන හා වෙනත් බලධාරීන් ඉලක්ක කර ගත් උද්දේශන වැඩසටහනක් වෘත්තිය කණ්ඩායම්වල සහාය ඇතිව දියත් කිරීම

VI. විවිධ පුස්තකාල අංශ/පුස්තකාලවල වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ සංඛ්‍යා ලේඛන එක් රැස් කිරීම සහ එහි පවත්නා විෂමතාවන් බලධාරීන්ගේ, මාධ්‍යවල, බලපෑම් කණ්ඩායම්වල සහ පොදු ජනතාවගේ අවධානය පිණිස වරින් වර ප්‍රකාශයට පත් කිරීම

VII. රටෙහි තොරතුරු නිදහස දිරිමත් කිරීම සහ තොරතුරු නිදහසට තර්ජනයක් එල්ල වන විට ඊට එරෙහිව කටයුතු කරන කණ්ඩායම් සමග අතිනත ගැනීම

VIII. දැනට පවත්නා පුස්තකාල හා තොරතුරු සේවාවල ගුණාත්මක බව වර්ධනය කිරීමේ ව්‍යාපෘති පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ ප්‍රවර්ධනය සහ දිරිමත් කිරීම

IX. ශ්‍රී ලංකාව අනෙක් රටවලට සම්බන්ධ කරමින් මුහුද යටින් දිවෙන දෘශ්‍ය තන්තු රැහැන් ජාලය සහ චන්ද්‍රිකා සම්බන්ධතා හරහා සියලු ඉලෙක්ට්‍රොනික් ව්‍යවහාරයන්

සිදු කිරීමට දිවයිනම ආවරණය වන පුළුල් දෘශ්‍ය තන්තු විදුලි සංදේශන ජාලයක් සංවර්ධනය කිරීමේ රජයේ උත්සාහය ප්‍රවර්ධනය කිරීම සහ ඊට සහාය වීම. එය නවීන පුස්තකාල හා තොරතුරු සේවා සඳහා අත්‍යවශ්‍ය පසුබිමක් සපයනු ඇත.

X. නව තාක්ෂණයන්ගෙන් උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට වේගයෙන් වර්ධනය වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන්ට ගැලපීම සඳහා පුස්තකාල ප්‍රජාවගේ වෘත්තීය කුසලතා සහ දැනුම වර්ධනය කිරීම. නවීන පුස්තකාල හා තොරතුරු සේවා කළමනාකරණය කිරීම සහ පවත්වා ගෙන යාමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සහ වෙනත් නව තාක්ෂණයන් හි වැදගත්කම අවබෝධ කර ගැනීමටත්, නව සහ සුදුසු පාඨමාලා හඳුන්වා දීමටත්, ආචාර්ය මණ්ඩලයේ ධාරිතාව ඉහළ නැංවීමටත්, ආචාර්ය මණ්ඩලය සඳහා තොරතුරු සහ සන්නිවේදන වෘත්තිකයන්ගේ සේවාව ලබා ගැනීමටත්, අවශ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විද්‍යාගාර හා වෙනත් පහසුකම් ලබා දීමටත් සිසුන් මෙම නව කුසලතාවලින් සන්නද්ධ කිරීමටත් පුස්තකාල අධ්‍යාපන හා පුහුණු සංවිධාන දිරිමත් කිරීම.

XI. ජාතික ඩිජිටල් පුස්තකාලය ප්‍රවර්ධනය කිරීම සහ ඩිජිටල් තොරතුරු පරිසරයට ප්‍රවේශ වීම

XII. සමාජ මාධ්‍ය ප්‍රවර්ධනය සහ පුරවැසි සහභාගීත්වය මෙන්ම පුරවැසියන් විසින් අන්තර්ගතය නිර්මාණය කිරීමට දිරි දීම

XIII. වැදගත් එකතු ඩිජිටල්ගත කිරීමට සහ එකතුව සඳහා ඩිජිටල් ද්‍රව්‍ය ලබා ගැනීමට පුස්තකාලවලට දිරි දීම සහ පුහුණුව, ප්‍රමිතීන් සහ වෙනත් පහසුකම් සැපයීමෙන් සහාය වීම

XIV. පුස්තකාලවල වැදගත්කම සහ වටිනාකම විදහා දැක්වීම සඳහා ස්වකීය පුස්තකාලවල උසස් ගුණාත්මක පුස්තකාල සහ තොරතුරු සේවාවක් ඇති කර ලීම සඳහා සාමාජිකයන් දිරිමත් කිරීම

XV. විවෘත ප්‍රවේශක සම්පත් (Open access) ප්‍රවර්ධනය කිරීම

XVI. වර්තමානයේ විශ්වවිද්‍යාල පුස්තකාලවල ක්‍රියාත්මක වන විද්‍යුත් සඟරා කොන්සෝටියම්වලට (Consortium) සමානව ගුණාත්මක තොරතුරු වෙත ප්‍රවේශය සඳහා කොන්සෝටියම් නිර්මාණය කිරීමට පුස්තකාල බලධාරීන් හා පුස්තකාල දිරිමත් කිරීම සහ අවශ්‍ය සම්පත් ප්‍රතිපාදන සඳහා රජයේ සහාය ලබා ගැනීමට ප්‍රචාරණයේ යෙදීම

XVII. ජාතික, පළාත්, පාසල්, ශාස්ත්‍රීය හා වෙනත් පුස්තකාල හා තොරතුරු අංශවල දැනටමත් ආරම්භ කර ඇති පුස්තකාල සංවර්ධන ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට බලධාරීන්ට සහාය වීම සහ ඒ පිළිබඳ උනන්දු කිරීම

XVIII. සියලුම පුස්තකාල හා තොරතුරු සේවා අංශවල නව පුස්තකාල සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීමට බලධාරීන් දිරිමත් කිරීම

XIX. පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ, විශිෂ්ට ව්‍යවහාර සහ ප්‍රමිත ලකුණු ව්‍යාපෘති ඇගයීමට වාර්ෂික සම්මාන පිරිනැමීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම

## 5.3. KA 3 - මනාව සැලසුම් කළ උද්දේශනය

උද්දේශනය යනු අරමුණක්, අදහසක් හෝ ප්‍රතිපත්තියක් වැනි දෙයක් වෙනුවෙන් ආයාචනා කරමින් සහ තර්ක කරමින් ප්‍රසිද්ධියේ සහාය පළ කරන හා ඒ වෙනුවෙන් හඬ නගන ක්‍රියාවලියකි. නූතන ලෝකය තුළ සාර්ථකත්වය අත්කර ගැනීම සඳහා එය තීරණාත්මක වන බැවින් ලොව පුරා පුස්තකාල සංගම් උද්දේශනය වෙනුවෙන් විශාල ශ්‍රමයක් සහ සම්පත් ප්‍රමාණයක් වැය කරති. අනෙකුත් ජාතික ආයතන සමග එක්ව පුස්තකාල හා තොරතුරු සේවා වෙනුවෙන් කතා කිරීමත්, ආයාචනා කිරීමත්, තර්ක කිරීමත් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වගකීමකි. පුස්තකාල සංගමයේ මෙන් ම රටෙහි පුස්තකාල හා තොරතුරු වෘත්තියේ සාර්ථකත්වය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ උද්දේශන වැඩසටහන්වල ගුණාත්මකභාවය මත විශාල වශයෙන් රඳා පවතිනු ඇත.

### 5.3.1. <u>අභිමතාර්ථ</u>

**<u>අභිමතාර්ථය 1 :</u>**

නීති සම්පාදකයන්, නිලධාරීන් සහ සමාජයේ වෙනත් බලපෑම් සහගත අංශ අතර පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ ගැටලු, දුෂ්කරතා සහ අභියෝග පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම

**<u>අභිමතාර්ථය 2 :</u>**

විවිධ පුස්තකාල සහ තොරතුරු අංශවල අභියෝග, ගැටලු, දුර්වලතා සහ ඒවාට දිය හැකි විසඳුම් හඳුනා ගැනීම

**<u>අභිමතාර්ථය 3 :</u>**

ජාතික, පළාත් සහ පුස්තකාල හා තොරතුරු සේවා අංශ මට්ටම්වල ගුණාත්මක උද්දේශන යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම

**<u>අභිමතාර්ථය 4 :</u>**

අදාළ ආයතන, දේශපාලකයන්, නිලධාරීන් සහ වෙනත් බලපෑම් සහගත අංශ සමග සබඳතා වර්ධනය කිරීම

**5.3.2. උපායමාර්ග**

I. උද්දේශන කටයුතු සඳහා සෑම පුස්තකාල හා විඥාපන විද්‍යා අංශයකින් ම සහ භූගෝලීය කලාපයකින් ම ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ගේ ගුණාත්මක කණ්ඩායමක් හඳුනා ගැනීම. ඉෆ්ලා ව්‍යාපෘතිය යටතේ මෑතදී උද්දේශනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලැබූ අය වෙත මෙහි දී විශේෂ සැලකිල්ලක් දැක්වීම

II. වාර්තා/ලිපි ලිවීමේ විශේෂ නිපුණතා ඇති, නීතිය, නීති සහ රෙගුලාසි, ජාත්‍යන්තර ව්‍යවහාර පිළිබඳ දැනුම සහිත ඉහළ සන්නිවේදන සහ සාකච්ඡාමය හැකියාවලින් යුත් උද්‍යොගිමත් සාමාජිකයන් හඳුනා ගැනීම

III. උද්දේශන කටයුතුවලට සහාය වීමටත් ඒවා සම්බන්ධීකරණය කිරීමටත් විශේෂ කමිටුවක් හෝ කණ්ඩායමක් පත් කිරීම

IV. සියලුම පුස්තකාල හා තොරතුරු සේවා අංශවල තෝරාගත් කණ්ඩායම් සඳහා උද්දේශනය පිළිබඳ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ ඔවුන් වාරිකව විදේශ පුහුණු, සම්මන්ත්‍රණ සහ චාරිකා සඳහා සහභාගී කරවීම සලකා බැලීම

V. සිය ක්‍රියාකාරී සැලැස්ම සකසන විට උපායමාර්ගික සැලැස්මේ දක්වා ඇති විවිධ පුස්තකාල හා තොරතුරු සේවා අංශවල අභියෝග හා ගැටලු (ඒවා වරින් වර සංශෝධනය කළ යුතුය) උද්දේශන කණ්ඩායම් සහ උද්දේශන කමිටු විසින් විමසිය යුතු වීම

VI. උද්දේශන කමිටුව සියලු විද්වත් කමිටු සමග සමීප සංවාදයක් පැවතිය යුතු වීම සහ උද්දේශන කටයුතු දෙපාර්ශවයේ ම සම ප්‍රයත්නයක් ලෙස පවත්වා ගෙන යා යුතු වීම

VII. පුස්තකාල හා තොරතුරු සේවා හෝ ඊට අනුබද්ධිත අංශ සඳහා රජයෙන් පත් කරන ලද කොමිසම්, කමිටු, කරුණු එක් රැස් කිරීමේ මෙහෙයුම් සහ යෝජනා සඳහා වන ඉල්ලීම් ගැන අවදියෙන් සිටීම සහ ඒවාට විධිමත් ලෙස ප්‍රතිචාර දැක්වීම

VIII. සෑම පුස්තකාල හා තොරතුරු සේවා අංශයක ම ප්‍රමුඛ පුද්ගලයන්ගේ කණ්ඩායමක් හඳුනා ගැනීම (උදා: ශාස්ත්‍රීය පුස්තකාල අංශය-අමාත්‍යවරයා, රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා, ලේකම්, අනෙක් ප්‍රධාන නිලධාරීන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති, උපසභාපති, පුස්තකාල හා තොරතුරු විද්‍යා ස්ථාවර කමිටුවේ නිලධාරීන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, උපකුලපතිවරු, නියෝජ්‍ය උපකුලපතිවරු ආදිය) සහ ඔවුන් දැනුවත් කිරීමට පුවත් හසුන්, විද්‍යුත් පුවත් හසුන් ආදිය යැවීම මෙන්ම ඔවුන් සමග නිරන්තර මිත්‍රශීලී සබඳතා පවත්වා ගෙන යාම.

IX. වක්‍ර ලේඛ, වාර්තා, පූර්වාදර්ශ, සංඛ්‍යාලේඛන, විවිධ තනතුරු සඳහා සුදුසුකම් හා එම සුදුසුකම්වල පිළිගැනීම්, ජාත්‍යන්තර ව්‍යවහාර ආදී සියලු අත්‍යවශ්‍ය තොරතුරු සූදානම් කර ගැනීම. ඉහත සඳහන් හා අදාළ අනෙකුත් සියලු තොරතුරු ඇතුළත් කර යෝජිත ඩිජිටල් ලේඛනාගාරයේ සවිස්තරාත්මක දත්ත පදනමක් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් සංවර්ධනය කළ යුතුය.

X. උද්දේශන ව්‍යාපාරයට භාවිත කළ හැකි ප්‍රචාරක සාහිත්‍ය, ස්ලයිඩ් සහ වෙනත් ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහන් මාලාවක් සංවර්ධනය කිරීම

XI. පුස්තකාල ක්ෂේත්‍රයේ ගැටලු මතු කර දැක්වීම සඳහා මාධ්‍ය ඵලදායී ලෙස භාවිත කිරීම. මනාව භාවිත කළ හැකි නම් මෙය ඉතා ප්‍රබල අවියකි.

XII. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, විද්වත් වෘත්තික සංවිධානය, වෙනත් විද්වත් සංවිධාන, වෘත්තියවේදීන්, ලේඛකයන්, දේශපාලකයන් ආදී වෙනත් කණ්ඩායම්වල සහාය මේ සඳහා ලබා ගැනීම

XIII. එකිනෙකාට සහාය වෙමින් සමාන අදහස් ඇති වෘත්තියවේදි සංවිධාන සමග මිත්‍ර සබඳතා වර්ධනය

XIV. ප්‍රබල සහායක කණ්ඩායමක් ගොඩ නැංවීමට ෆේස් බුක්, ට්විටර්, වෙබ් බ්ලොග් සහ වෙනත් සමාජ මාධ්‍ය භාවිත කිරීම

XV. ස්වකීය සුවිශේෂ නිර්මාණාත්මක කාර්ය ඇගයීම සහ පුස්තකාල තොරතුරු ක්ෂේත්‍රයට කරන ලද විශේෂ දායකත්වය වෙනුවෙන් ලේඛකයන් (උදා: හොඳම ළමා පොත හෝ හොඳම චිත්‍ර හෝ එවැනි) මාධ්‍යවේදීන් (පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ වැදගත් කරුණු පිළිබඳ හොඳම වාර්තාකරණය) රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ නිලධාරීන් (පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ දියුණුවට කැපී පෙනෙන දායකත්වයක් සැපයීම), දේශපාලකයන් (එම), මාධ්‍ය (එම) සඳහා වාර්ෂික සම්මාන ප්‍රදානය කිරීම. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට සිය උද්දේශන වැඩසටහනේ දී සහාය වන අතර, සංගමයට අවශ්‍ය බලය හා ශක්තිය ලබා දෙනු ඇත.

XVI. උද්දේශන ක්ෂේත්‍රයේ හොඳම ව්‍යවහාරයන් හඳුනා ගැනීම සහ ඒවා වාර්ෂිකව ඇගයීම

## 5.4. KA 4 - ස්වකීය උපාය මාර්ගික දිශානතීන් සපුරා ගැනීමටත් අභියෝග ජය ගැනීමටත් සියලු පුස්තකාල හා තොරතුරු සේවා අංශවලට (ජාතික / පළාත් / ශාස්ත්‍රීය / පාසල් / විශේෂ / මහජන / රාජ්‍ය ආදී) සහාය වීම

පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රයේ වෘත්තිය සංවාද මණ්ඩපය ලෙස ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රධාන වගකීමක් වන්නේ පුස්තකාල හා තොරතුරු සේවාවේ සියලු අංශවලට සහාය වීමය. පුස්තකාල හා තොරතුරු සේවාවේ විවිධ අංශවල ක්‍රියාකාරකම්වල දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සහභාගීත්වයේ මන්දගාමීත්වය හා එබඳු සහභාගීත්වයක් සඳහා වන පසුබාන සුළු බව ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ගේ මතවාද සමීක්ෂණයෙන් මතු වූ ප්‍රධාන කරුණක් විය. මෙය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ තත්ත්වයට හා කීර්තියට සෘජුවම බලපායි. උපායමාර්ගික සැලැස්ම යටතේ පුස්තකාල සංගමය පුස්තකාල හා තොරතුරු සේවාවේ සියලු අංශවල ප්‍රධාන ව්‍යාපෘතීන්වල දී ඵලදායීව සහභාගීත්වය සපයනු ඇත. එහිදී එය අදාළ පුස්තකාල අංශවල සහායකයෙකු, විශ්වාසවන්ත මිතුරකු, මැදිහත්කරුවෙකු සහ

උපදේශන සහායකයෙකු ලෙස අදාළ ඉලක්ක සපුරා ගැනීමටත්, දුෂ්කරතා ජය ගැනීමටත් සහාය වනු ඇත.

### 5.4.1. අභිමතාර්ථ

**අභිමතාර්ථය 1 :**

ශ්‍රී ලංකාවේ සියලුම පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රවල උපායමාර්ගික දිශාවන් හඳුනා ගැනීම

**අභිමතාර්ථය 2 :**

ඉලක්ක සපුරා ගැනීම සඳහා අදාළ පුස්තකාල අධිකාරීත්වයන්ට සහාය වීම

**අභිමතාර්ථය 3 :**

සියලුම පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයන් සංවර්ධනය කිරීම සහ සියලු හවුල්කරුවන් සමග ශක්තිමත් සබඳතා ගොඩ නැංවීම

**අභිමතාර්ථය 4 :**

ව්‍යාපෘතිය හරහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ද කීර්තිය, බලය සහ තත්ත්වය වර්ධනය කර ගැනීම

### 5.4.2. උපාය මාර්ග

i. සියලුම පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රවල දුර්වලතා සහ අභියෝගයන් හඳුනා ගැනීම සහ ප්‍රබලත්වය අනුව ඒවා වර්ග කිරීම

ii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විද්වත් කමිටු සමග සහයෝගයෙන් කාල වකවානු සහිත ක්‍රියාකාරි සැලැස්මක් සම්පාදනය කිරීම

iii. සියලුම පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රවල පුස්තකාල කාර්ය මණ්ඩල අතර වෘත්තියවේදීත්වය සහ වෘත්තිය ආචාර ධර්ම වර්ධනය කිරීම සහ සේවාවල ගුණාත්මක බව වර්ධනය

iv. ජාතික මට්ටමින් සහ ක්ෂේත්‍ර මට්ටමින් වෙනත් වගකිවයුතු අධිකාරීන්ගේ සහාය සෙවීම

v. වගකිව යුතු පුස්තකාල අධිකාරීන් හඳුනා ගැනීම සහ පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රය වර්ධනය සහ ශක්තිමත් කිරීමට ඔවුන් පෙළඹවීම

vi. අවශ්‍ය වෘත්තිය යෙදවුම් සැපයීමෙන් ඔවුන්ට සහාය වීම (අවශ්‍ය ව්‍යවස්ථා, ප්‍රමිති කෙටුම්පත් කිරීම, මනා ව්‍යවහාර සඳහා උදාහරණ සැපයීම, ප්‍රමිති සහ නියමු උපුටා දැක්වීම, ජාත්‍යන්තර උදාහරණ පෙන්වීම ආදී) සහ තත්ත්වයන් නිවැරදි කිරීමට පහසුකම් සැලසීම

vii. සෑම පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයකම විශේෂ අවශ්‍යතා හඳුනා ගැනීම සහ එම විශේෂ අවශ්‍යතා සපුරා ලීමට ඔවුනට සහාය වීම. උදා: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම, ධාරිතා සංවර්ධනය, කෙටි කාලීන දිගු කාලින සැලසුම් සැකසීම, තොරතුරු සාක්ෂරතා වැඩසටහන්, කාර්ය මණ්ඩල තනතුරු පිරවීම, සේවා වර්ධනය ආදී

viii. සියලු වාර්ගික කණ්ඩායම් මෙන්ම භූගෝලීය පිහිටීම, ආර්ථික සාධක නිසා අවාසිදායක තත්ත්වයට පත්වූවන්, වෙනත් හැකියා සහිත (differently able) පුද්ගලයන් සහ වෙනත් කුඩා කණ්ඩායම් ඇතුළු අවවරප්‍රසාදිත ප්‍රජාවන් ආවරණය කිරීමට විශේෂ අවධානය යොමු කිරීම

ix. අවශ්‍ය විට, පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රය වෙනුවෙන් අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA), අන්තර්ජාතික පාසල් පුස්තකාල සංගමය (IASL), යුනෙස්කෝ (UNESCO) වැනි ආයතනවල සහාය ලබා ගැනීම

x. විශේෂඥ යෙදවුම් අවශ්‍ය වූ විට, විශේෂ කමිටු පත් කිරීම, සම්මන්ත්‍රණ සහ බුද්ධි කලම්බන සැසි ආදිය සංවිධානය කිරීම

xi. ක්‍රියාමාර්ග දිරිමත් කිරීමට උද්දේශනය භාවිත කිරීම

xii. විවිධ පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රවල විශේෂ ගැටලු සාකච්ඡා කිරීම සඳහා අධ්‍යයන වර්ෂයේ මැද භාගයේ (නොවැම්බර් හෝ දෙසැම්බර්) එක් දින සම්මන්ත්‍රණයක් හඳුන්වා දීම. තම ගැටලු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් අවස්ථාවක්(වාර්ෂික මහා සභාවේ දී) නොලැබීම සාමාජිකත්වයේ චෝදනාවකි. සෑම පුස්තකාල අංශයක් සඳහා ම ප්‍රමාණවත් කාලයක් ලබා දීම සඳහා මෙම යෝජිත එක් දින සම්මන්ත්‍රණයේ දී සමාන්තර සැසි (දෙකක් හෝ තුනක්) පැවැත්වීම නිර්දේශ කෙරේ.

## 5.5. KA 5 - අධ්‍යාපනික වැඩසටහන් වර්ධනය කිරීම

පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව පසුගිය අඩසියවස තුළ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රමුඛ ව්‍යාපෘතිය මෙන්ම ප්‍රධාන ආදායම් ඉපයීමේ ව්‍යාපෘතිය ද විය. ඒ මගින් රට තුළ පුස්තකාල හා විඥාපන විද්‍යා වෘත්තිකයන් හා අර්ධ වෘත්තිකයන් අති බහුතරයක් පුහුණු කිරීමෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සාර්ථකත්වයක් අත් කර ගෙන ඇත. විශ්වවිද්‍යාල දෙකක නව පුස්තකාල විද්‍යා අධ්‍යයන ආයතන බිහිවීමත් සමග සහ මතුවෙමින් පවත්නා ජාත්‍යන්තර ප්‍රවණතා සලකා බලා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය තව දුරටත් විධිමත් අධ්‍යාපන වැඩසටහන්වලට සම්බන්ධ නොවී, නියාමකයෙකු ලෙස පමණක් කටයුතු කිරීම අවශ්‍ය බවට තර්ක කෙරේ. ඒ අතරම ලොව පුරා පුස්තකාල සංගම් වැඩි වැඩියෙන් නියාමන කටයුතු සහ අඛණ්ඩ වෘත්තිය

සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ කැපී පෙනෙන භූමිකාවකට උර දෙමින් සිටී. නූතන සාර්ථක පුස්තකාල හා තොරතුරු සේවාවක ජීව රුධිරය එයයි.

### 5.5.1. <u>අභිමතාර්ථ</u>

**<u>අභිමතාර්ථය 1:</u>**

පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ අනාගතය පිළිබඳ දැනුවත් තීරණ ගැනීම

**<u>අභිමතාර්ථය 2:</u>**

මෙම පාඨමාලාව අඛණ්ඩව පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට අවශ්‍ය නම්, පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම

**<u>අභිමතාර්ථය 3:</u>**

ඉහළ ගුණාත්මක අගයකින් යුත් ගතික අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහනක් සංවර්ධනය කිරීම සහ වෙනත් පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනික හා පුහුණු සංවිධානවලට සහාය වීම

**<u>අභිමතාර්ථය 4:</u>**

පුස්තකාල හා විඥාපන විද්‍යා දේශීය ප්‍රකාශන ප්‍රවර්ධනය කිරීම සහ පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රධාන කෘති සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම

### 5.5.2. උපාය මාර්ග

i. පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ අනාගතය පිළිබඳ නිර්දේශ ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කිරීම සහ තීරණයක් ගැනීම සඳහා අදාළ නිර්දේශ වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම. කෙසේ වෙතත්, පහත සඳහන් සාධකය කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය. එනම්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සඳහා ප්‍රධාන ආදායම් මාර්ගය මෙම ඩිප්ලෝමා පාඨමාලාව නිසා එය මෑත අනාගතයේ දී නොනැවත්වීම සහ අවම වශයෙන් අඛණ්ඩ වෘත්තිය සංවර්ධන ව්‍යාපෘතීන් හොඳින් ස්ථාපිත වන තුරු එය පවත්වා ගෙන යාමය. ඒ අනුව පුස්තකාල විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ ගුණාත්මක බව වර්ධනය කිරීම.

ii. ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා සහ සංවර්ධනයත් සමග යාවත්කාලීන වන පරිදි ඩිප්ලෝමා පාඨමාලාවේ විෂයමාලා නිරන්තරයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ උසස් කිරීම

iii. පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලාවල ඉගැන්වීම්, ඉගෙනුම් සහ ඇගයීම් ව්‍යුහ හඳුනා ගැනීම

iv. පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ ඉගෙනුම් ඵල සැලසුම් කිරීම

v. පංති, විභාග සඳහා නිශ්චිත කාල සටහනක් තිබීම සහ පාඨමාලාව වෙත වඩා වෘත්තියවේදීත්වයක් හඳුන්වා දීම

vi. නිශ්චිත ගොඩනැගිල්ලක්, ගුණාත්මක තොරතුරු තාක්ෂණික විද්‍යාගාර වැනි පාඨමාලාව සඳහා අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම සහ විධිමත් කිරීම

vii. ගුරු පුහුණු සහ වාරික ඇගයීම් මගින් ඉගැන්වීම් කාර්ය මණ්ඩලයේ ගුණාත්මක බව දියුණු කිරීම

viii. පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලාව සඳහා පිළිගැනීම් සහතිකය ලබා ගැනීම

ix. අඛණ්ඩ වෘත්තිය සංවර්ධන අවශ්‍යතා තක්සේරුවක් සිදු කිරීම

x. සෑම විද්වත් කමිටුවකම උපදෙස් සහිතව උසස්, ගුණාත්මක බවින් යුත් අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහනක් සංවර්ධනය කිරීම

xi. අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන් පිළිබඳ දින දර්ශනයක් කලින් ප්‍රකාශයට පත් කිරීම හා ඒවා භාෂා තුනෙන් ම පැවැත්වීම. එමෙන් ම ඒවා කොළඹට අමතරව පළාත් ප්‍රධාන නගරවල පැවැත්වීම

xii. මාර්ගගත අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම

xiii. වෘත්තිය ගැටලු පිළිබඳ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, ජාතික විද්‍යා පදනම වැනි ආයතන සමග අඛණ්ඩ සංවාදයක් පවත්වා ගෙන යාම සහ සියලු පාර්ශ්වයන්ගේ යහපත සඳහා ඒවායේ සහයෝගය ලබා ගැනීම

xiv. රැකියා වෙළඳපොළ සඳහා ගැලපෙන පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලා ස්ථාපිත කිරීම

xv. ගුණාත්මක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණුව සඳහා ප්‍රධාන තොරතුරු තාක්ෂණ පීඨයක් සමග සම්බන්ධ වීම

xvi. පුස්තකාල හා තොරතුරු විද්‍යා ඩිප්ලෝමා වැඩසටහනෙ හි ආචාර්ය මණ්ඩලවල සහ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන්වල සම්පත් පුද්ගලයන්ගේ දත්ත පදනමක් සංවර්ධනය කිරීම සහ එය නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම

xvii. පුස්තකාල හා තොරතුරු විද්‍යා ඩිප්ලෝමාව සහ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන් සඳහා පූර්ණ කාලීන සමායෝජකයෙකු පත් කිරීමේ හැකියාව සොයා බැලීම

xviii. ඉංග්‍රීසි භාෂාමය පුස්තකාල හා තොරතුරු විද්‍යා කියවීම් ද්‍රව්‍ය සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීමේ වැඩසටහනක් ස්ථාපිත කිරීම

xix. කියවීම් ද්‍රව්‍ය නිර්මාණය සඳහා ජ්‍යෙෂ්ඨ වෘත්තියවේදීන් දිරිමත් කිරීම සහ ඒවා පළ කිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හරහා සහාය වීම

xx. විශිෂ්ටතම අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන, විශිෂ්ටතම පුස්තකාල විද්‍යා දේශීය භාෂාමය ප්‍රකාශනය, විශිෂ්ටතම පරිවර්තනය යනාදිය සඳහා වාර්ෂිකව සම්මාන පිරිනැමීම

## 5.6. KA 6 - සාමාජිකත්වය සංවර්ධනය කිරීම

ශක්තිමත් සංගමයක පදනම වන්නේ සාමාජිකත්වයයි. අපට නිවැරදි සංඛ්‍යා ලේඛන නොමැතිවුව ද පුස්තකාල හා තොරතුරු විද්‍යා වෘත්තියවේදීන්ගෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් වන්නේ 30%කට අඩු සංඛ්‍යාවක් බව අනුමාන කළ හැකිය. එහෙයින් සාමාජිකත්වය ගොඩ නැංවීම දිගු කලක සිට පවත්නා අවශ්‍යතාවකි. දුර්වල සාමාජිකත්වය සංගමයට ආකාර කිහිපයකින් නිශේධනාත්මකව බලපායි. නව

සාමාජිකයන් සංගමයට නව අදහස් සහ නව ශක්තිය රැගෙන එන අතර එයින් වැඩි ආදායමක් ද ලැබෙයි. තම ව්‍යාපෘති බොහොමයක් ඉදිරියට ගෙන යාම සඳහා සංගමයට උද්‍යෝගිමත් සාමාජිකයන් අවශ්‍ය වන අතර එය සංගමය මෙන්ම පුස්තකාල හා තොරතුරු වෘත්තිය ද අඛණ්ඩව දියුණු කරනු ඇත.

### 5.6.1. <u>අභිමතාර්ථ</u>

**<u>අභිමතාර්ථය 1</u>**

සංගමයේ සාමාජිකත්වය සඳහා අදාළ සුදුසුකම් ලැබූ අයගෙන් දැනට ඇති අඩු ඉල්ලුමට හේතු හඳුනා ගැනීම සහ ඒවාට විසඳුම් සෙවීම

**<u>අභිමතාර්ථය 2</u>**

සුදුසුකම් සහිත පුද්ගලයන් අවම වශයෙන් 75% ක් සාමාජිකත්වයට බඳවා ගැනීම සඳහා වැඩසටහනක් දියත් කිරීම

**<u>අභිමතාර්ථය 3</u>**

ආයතනික නොවන, ආයතනික සහ වෙනත් වර්ගයේ සාමාජිකත්වයන් ව්‍යාප්ත කිරීමේ හැකියාව සොයා බැලීම

**<u>අභිමතාර්ථය 4</u>**

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වයේ වටිනාකම හා ආකර්ශනය ඉහළ නැංවීම

### 5.6.2. උපාය මාර්ග

i. හොඳින් සැලසුම් කළ සාමාජිකත්වය වර්ධනය කිරීමේ වැඩසටහනක් දියත් කිරීම

ii. අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ (IFLA) නියමු මාලා සහ වෙනත් රටවල පුස්තකාල සංගම් පවත්වා ගෙන යන ව්‍යවහාරයන් සලකා බලමින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ආයතනික නොවන සාමාජිකත්ව ප්‍රවර්ගය ව්‍යාප්ත කිරීම පිළිබඳ අධ්‍යයනය කර වාර්තාවක් සම්පාදනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම සහ එම වාර්තාව සලකා බැලීම සහ අනුමැතිය සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම

iii. සාමාජිකත්ව අයදුම්පත්‍රය සහ එය පිළිගැනීමේ ක්‍රියාපටිපාටිය සරල කිරීම

iv. පුස්තකාල හා විඥාපන විද්‍යා සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය නොලත් පුස්තකාලයාධිපතීන්/පුස්තකාල කාර්ය මණ්ඩල

සාමාජිකයන් හඳුනා ගැනීම සහ විද්වත් කමිටුවල සහාය ඇතිව ඔවුන් අතර සාමාජිකත්වය ප්‍රවර්ධනය සඳහා විශේෂ ඉලක්කගත වැඩසටහනක් දියත් කිරීම

v. සාමාජිකයන් නොවන වෘත්තියවේදීන් ඉලක්ක කර ගත්, අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහනක් නොමිලේ වාර්ෂිකව සංවිධානය කිරීම සහ එම අවස්ථාව සංගමයේ සාමාජිකත්ව ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීම

vi. සංගමයට සැලකිය යුතු සාමාජිකයන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ට පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික සම්මන්ත්‍රණ සඳහා හෝ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන් කිහිපයක් සඳහා නොමිලේ ලියාපදිංචිය, ඔවුන්ගේ දායකත්වය මහා සභා රැස්වීමේ දී පිළිගැනීම යනාදී දිරිමත් කිරීම් සැපයීම

vii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් නොවන්නන්ට එහි සාමාජිකත්වය ලබා ගැනීමට පොළඹවන්නක් ලෙස වරලත් පුස්තකාලයාධිපතීන්ගේ/ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ආයතනික සාමාජිකයන්ගේ විස්තර සපයන වාර්ෂික පුස්තකාල ග්‍රන්ථයක් (Library Year Book) ප්‍රකාශයට පත් කිරීම

viii. සාමාජිකත්වය ලබා ගැනීම සහ අලුත් කිරීම සඳහා වෙබ් පෝටලයක් හඳුන්වා දීම

ix. ගුණාත්මක අගයෙන් යුත් ප්‍රචාරණ ද්‍රව්‍ය සහිත ආකර්ශනීය, ඵලදායී ප්‍රවර්ධන වැඩසටහනක් සහ ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම

x. පුස්තකාල හා විඥාපන විද්‍යා ප්‍රකාශනවලට වට්ටම් ලබා දීම, පුස්තකාල තොරතුරු ක්ෂේත්‍රයේ සම්මන්ත්‍රණ, සමුළුවලට වට්ටම් ලබා දීම, විදේශීය සමුළු සහ සම්මන්ත්‍රණවලට සහභාගී වීමට සහාය වීම, ප්‍රධාන පුස්තකාල සඳහා නොමිලේ සාමාජිකත්වය සැපයීම වැනි විශේෂ ප්‍රතිලාභ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය සඳහා ලබා දීම

xi. පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ රැකියා සඳහා පවත්වන සම්මුඛ පරීක්ෂණවල දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය සහ එහි තනතුරක් දැරීම අමතර සුදුසුකමක් ලෙස සැලකීමට බලධාරීන් පෙළඹවීම

xii. සේවයේ නියුක්ත සියලු පුස්තකාල වෘත්තිකයන්ට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අනිවාර්ය සාමාජිකත්වය ප්රවර්ධනය කිරීම

xiii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සමස්ත සාධනය ඉහළ නැංවීම සහ එය ආකර්ශනීය, ගුණාත්මක අගයෙන් යුත් සංගමයක් බවට පත් කිරීම

xiv. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ට උසස් අධ්‍යාපන හා පශ්චාත් උපාධි අවස්ථාවලට පහසුකම් සැලසීම

## 5.7. KA 7 - සාමාජිකයන්ගේ දුක් ගැනවිලි සහ වෘත්තීය සංවර්ධනයට සහාය වීමට යාන්ත්‍රණයක් හඳුන්වා දීම/ශක්තිමත් කිරීම

මතවාද සමීක්ෂණයේ දී යළි යළිත් වූ චෝදනාව වූයේ සාමාජිකයන්ගේ දුක් ගැනවිලි සහ වෘත්තීය සංවර්ධනයට සංගමයෙන් ලැබෙන අවම දායකත්වය වන අතර එය පැහැදිලිවම ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ කීර්තියට බලපානු ලබයි. එහෙයින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මෙම තත්ත්වයට පැහැදිලි විසඳුමක් ලබා දිය යුතු වේ. සාමාජිකයන් බහුතරයක් දුර බැහැර ප්‍රදේශවල හෝ හුදෙකලාව සේවයේ යෙදී සිටින හෙයින්, ඔවුනට සහාය සහ ආධාර බලාපොරොත්තු වීමට, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය හෝ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හැර වෙනත් සංවිධානයක් නොමැත. බොහෝ ප්‍රධාන පුස්තකාල සංගම් තම සාමාජිකයන්ගේ වෘත්තිය, ආයතනික සහ වෘත්තිය සංවර්ධන අවශ්‍යතා සඳහා සහාය වීමට විශේෂ යාන්ත්‍රණයක් සංවිධානය කර ඇත.

### 5.7.1. <u>අභිමතාර්ථ</u>

**<u>අභිමතාර්ථය 1:</u>**

සාමාජිකයන්ගේ දුක් ගැනවිලි පිළිබඳ කටයුතු කිරීම සඳහා විශේෂ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හෝ පවතින දුක් ගැනවිලි කමිටුව ශක්තිමත් කිරීම

**<u>අභිමතාර්ථය 2:</u>**

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ගේ වෘත්තිය ජීවිතයේ සංවර්ධනය සඳහා විශේෂ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම

**<u>අභිමතාර්ථය 3:</u>**

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ කාර්යාල ව්‍යවහාර වර්ධනය කිරීම සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විද්වත් කමිටු විසින් සාමාජිකයන්ගේ ඉල්ලීම් පිළිබඳ වඩාත් සංවේදී වීම

**<u>අභිමතාර්ථය 4:</u>**

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වඩාත් සාමාජිකත්ව මිත්‍රශීලී සංවිධානයක් බවට පත් කිරීම

### 5.7.2. උපාය මාර්ග

i. සාමාජිකයන්ගේ දුක් ගැනවිලි පිළිබඳ වඩාත් ඵලදායීව කටයුතු කිරීමට වත්මන් දුක් ගැනවිලි කමිටුව වර්ධනය කිරීම හෝ නව යාන්ත්‍රණයක් පිහිටුවීම

ii. නියත පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයකට අදාළ ගැටලු පිළිබඳව අදාළ විද්වත් කමිටුව සමග සම්බන්ධ වී කටයුතු කිරීම

උදා: කමිටුව විසින් ගැටලුව විශ්ලේෂණය කිරීම, විසඳුම් හඳුනා ගැනීම, සාමාජිකයන්ට ප්‍රතිචාර දැක්වීම හෝ පාලක මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම

iii. ගැටලුවලට මුහුණ පා ඇති සාමාජිකයන්/පුස්තකාල වෙනුවෙන් මැදිහත් වී අදාළ අධිකාරීන් සමග සාකච්ඡා කිරීමට උද්දේශන කණ්ඩායමක් අදාළ විද්වත් කමිටුවල සහායෙන් හඳුනා ගැනීම

iv. පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය මුහුණ දෙන ගැටලු පිළිබඳ දැනුවත් කරලීම සඳහා පුස්තකාල හා තොරතුරු සේවාවේ අධිකාරීන් සමග සමීප කතිකාවක් ගොඩ නංවා ගැනීම. උදා: රාජ්‍ය පරිපාලන, පළාත් පාලන, අධ්‍යාපන, උසස් අධ්‍යාපන, වෘත්තිය පුහුණු අමාත්‍යාංශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, පළාත් සභා සහ ජනමාධ්‍ය ආදිය

v. සාමාජිකයන්ගේ මෙබඳු අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගම් කාර්යාලයෙන් ක්ෂණික ප්‍රතිචාර සේවයක් ආරම්භ කිරීම

vi. ශ්‍රී ලංකා පුස්තකාල සංගම් කාර්යාලයේ කාර්යක්ෂමතාව සහ ඵලදායිත්වය වර්ධනය කිරීම සඳහා එම කාර්යාලයේ ප්‍රධාන විධායක නිලධාරී/පුහුණු කළමනාකරු වෙත වගකීම් පැවරීම

vii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති (තමන් සාමාජිකත්වය දරන), ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, පළාත් පුස්තකාල සේවා මණ්ඩල යනාදියෙහි පාලක හා

කළමනාකරණ මණ්ඩල රැස්වීම්වල දී අදාළ කරුණු සාකච්ඡා කළ යුතු අතර මෙම ගැටලු විසඳීමට ඔවුන්ගේ සහාය ලබා ගැනීම

viii. සාමාජිකයන්ට සහාය වීම සඳහා වෙනත් සුදුසු පියවර ගැනීම (අමාත්‍යවරු, දේශපාලකයන්, නිලධාරීන්, විද්වත් වෘත්තියවේදී සංගම් නිලධාරීන් මුණ ගැසීම නීතිමය උපදෙස් පැතීම ආදී)

ix. රැකියා අපේක්ෂාවෙන් සිටින මෑතකාලීනව සුදුසුකම් සම්පූර්ණ කළ වෘත්තිකයන් සහ වෘත්තිය දියුණුව අපේක්ෂාවෙන් සිටින පුස්තකාලයාධිපතීන් පිළිබඳ දත්ත පදනමක් සැකසීම

x. ශ්‍රී ලංකාවේ සහ විදේශයන් හි (අදාළ) පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ පවතින ඇබෑර්තු පිළිබඳ දත්ත පදනමක් සකස් කර එය වෙබ් අඩවියෙහි පළ කිරීම

xi. විවිධ පුස්තකාල හා තොරතුරු අංශවල දිගු කාලයක් සිට පවතින ඇබෑර්තු පිළිබඳ දත්ත පදනමක් සකස් කර එම තත්ත්වය නිවැරදි කිරීමට බලධාරීන්ගේ අවධානය යොමු කිරීමට අවශ්‍ය පියවර ගැනීම

xii. ශ්‍රී ලංකාවේ වෙනත් වෘත්තියවේදී සංවිධානවල සහ ලොවපුරා පුස්තකාල සංගම්වල සාමාජිකයන්ගේ දුක් ගැනවිලිවලට ප්‍රතිචාර දැක්වීම සහ ඔවුන්ගේ වෘත්තීය ජීවිත සංවර්ධනය පිළිබඳ විශිෂ්ට ව්‍යවහාරයන් අධ්‍යයනය කිරීම

## 5.8. KA 8 - පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රධාන හවුල්කරුවන් අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම

ඕනෑම සංසංදයක ශක්තිය වන්නේ එක්සත්කමයි. විවිධ න්‍යාය පත්‍ර අනුගමනය කළ ද අවම වශයෙන් සැමට එකඟ විය හැකි සහ පොදු ප්‍රතිලාභ ලැබිය හැකි සහ නියත ක්ෂේත්‍ර තුළ පොදු න්‍යාය පත්‍රයන් සකසා ගැනීමට සියලු පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතන හා සංවිධාන උත්සාහ කළ යුතුය. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, ප්‍රධාන පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනයන්හි පාලක මණ්ඩලවල, විද්වත් කමිටුවල, අනෙක් කණ්ඩායම්වල නියෝජනය කිරීමේ තර්කානුකූල හේතුව මෙලෙස සහයෝගීතාවය පොදු න්‍යාය පත්‍ර සහ අන්‍යොන්‍ය විශ්වාසය වර්ධනය කිරීම වේ. වෘත්තියවේදී සංසදය ලෙස ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ ප්‍රධාන හවුල්කරුවන් අතර සහයෝගීතාව වර්ධනය කිරීමට ප්‍රයත්න දැරිය යුතුය.

5.8.1. <u>අභිමතාර්ථ</u>

<u>අභිමතාර්ථය 1:</u>

පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ සහ අනුබද්ධ ශික්ෂණයන් හි සියලු ආයතන, සංවිධාන සමග සමීප අන්‍යොන්‍ය සබඳතාවක් සංවර්ධනය කිරීම

**<u>අභිමතාර්ථය 2:</u>**

පුස්තකාල හා ඊට සම්බන්ධ කාර්යයන් පිළිබඳ කටයුතු කරන රජයේ අමාත්‍යාංශ, පළාත් සභා, වෙනත් අධිකාරීන් සමග සබඳතා ශක්තිමත් කිරීම

**<u>අභිමතාර්ථය 3:</u>**

ඩිජිටල්කරණය, පුස්තකාල ස්වයංක්‍රියකරණය, තොරතුරු සාක්ෂරතාව, මානව සම්පත් සංවර්ධනය, උද්දේශනය, ව්‍යවස්ථා වැනි ක්ෂේත්‍ර තුළ පොදු න්‍යාය පත්‍රයක් සංවර්ධනය කිරීමට ප්‍රධාන පුස්තකාල හා තොරතුරු විද්‍යා සංවිධානවලට සහාය වීම

**<u>අභිමතාර්ථය 4:</u>**

UNESCO, IFLA, IASL, CILIP, ALA වැනි පුස්තකාල හා අනුබද්ධ වෙනත් ජාත්‍යන්තර සහ කලාපීය සංසද සමග සමීප සබඳතා නිර්මාණය කර ගැනීම

**5.8.2.** උපාය මාර්ග

i. සියලු ක්ෂේත්‍ර ආවරණය කිරීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ද්විත්වකරණය වලක්වාලීමට පුස්තකාල හා තොරතුරු විද්‍යා සංවිධාන සමග සමීප සබඳතාවක් ගොඩ නංවා ගැනීම සහ පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රතිලාභ උපරිම කිරීමට පවත්නා සම්පත් භාවිත කිරීම සඳහා එකිනෙක සංවිධාන අනුපූරක ලෙස ක්‍රියා කිරීම

ii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සහ පුස්තකාල තොරතුරු විද්‍යා ක්ෂේත්‍රය සඳහා ප්‍රතිලාභ ලබා ගැනීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, ජාතික විද්‍යා පදනම, වෘත්තියවේදී සංගම් සංවිධානය යනාදියෙහි කමිටු/කණ්ඩායම් සාමාජිකත්වය භාවිත කිරීම

iii. ICTA, UGC, NSF සහ වෙනත් අදාළ සංවිධානවල පාලක මණ්ඩලවල හෝ කමිටු මට්ටමේ නියෝජනයන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට ලබා ගැනීමට උත්සාහ කිරීම

iv. ප්‍රධාන පුස්තකාල හා තොරතුරු විද්‍යා සංවිධානවල ක්‍රියාකාරකම්, ක්‍රියාකාරී සැලසුම්, උපායමාර්ගික සැලසුම් ප්‍රවේශමෙන් සුපරීක්ෂණය කිරීම සහ වෘත්තිය උන්නතිය වෙනුවෙන් මෙම සංසදයන් හිදී අදහස් පළ කිරීම. මෙම සංසදයන්හි සාකච්ඡා කරන ලද මූලික ගැටලු ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාලක මණ්ඩලයට සහ අදාළ විද්වත් කමිටුවලට දැනුම් දීම. එය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ රැස්වීම්වල න්‍යාය පත්‍රයේ ස්ථාවර අංගයක් බවට පත් කිරීම

v. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති හා නියෝජිතයන් ඉහත සඳහන් පාලක මණ්ඩල හා කමිටු රැස්වීම්වලට හැමවිටම හොඳින් සූදානම් වී සහභාගී වීම. එසේ සහභාගී වීමට පෙර අදාළ විද්වත් කමිටුවල සහ වෙනත් විශේෂඥ උපදෙස් ලබා ගැනීම

vi. සහභාගී වන සංවිධානවලට මෙන්ම පොදුවේ පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයට ප්‍රතිලාභ ලැබිය හැකි සාමූහික ව්‍යාපෘති දියත් කිරීම

vii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ක්‍රියාශීලී බව පෙන්නුම් කිරීමට සහ බලය වර්ධනය කිරීමට විද්වත් වෘත්තියකයන්ගේ සංගම් සංවිධාන සංසදය අර්ථවත් ලෙස යොදා ගැනීම

viii. ප්‍රධාන වෘත්තීය සංවිධානවල ප්‍රධානියා සහ ජොෂ්ඨ සාමාජිකයන් සමග වෘත්තිය සබඳතා ගොඩ නැංවීම සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ කටයුතු පිළිබඳ ඔවුන් නිරන්තරයෙන් දැනුවත් කිරීම

ix. ඔවුන්ගේ ඉලක්ක සපුරා ගැනීමට උද්දේශනය, විශේෂඥ සේවා සහ වෙනත් වෘත්තියවේදී ක්‍රම හරහා ඔවුනට උදව් කිරීම සහ ඒ මගින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ එම සංවිධාන අතර බැඳීම ශක්තිමත් කිරීම

x. IFLA, REFSALA, UNESCO ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ට අනුබල දීම

xi. ජාත්‍යන්තර සංසදයන්ගේ නව ප්‍රාරම්භයන් පිළිබඳ විමසිලිමත් වීම සහ දේශීය වශයෙන් ඒවා පිළිබඳ දැනුවත්භාවය හා වෘත්තියවේදී සංවාදය ප්‍රවර්ධනය කිරීම

xii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් සඳහා සහන මිලකට ඉහත ජාත්‍යන්තර සංසදයන්හි ප්‍රකාශන ලබා දීමට කටයුතු කිරීම සහ වැදගත් නියමු, වාර්තා ආදිය දේශීය භාෂාවන්ට පරිවර්තනය කිරීම

xiii. ඉහත ජාත්‍යන්තර සංසදයන් හි කලාපීය රැස්වීම් සහ විශේෂ වැඩසටහන් ශ්‍රී ලංකාව තුළ කලින් කල පැවැත්වීමට කටයුතු කිරීම

xiv. ප්‍රධාන පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතන අතර සහයෝගීතාව ප්‍රවර්ධනයට දේශීය පුස්තකාල හා තොරතුරු විද්‍යා සංවිධානවල සහ ජාත්‍යන්තර සංසදයන්හි වැදගත් අවස්ථා යොදා ගැනීම

## 6. ක්‍රියාකාරී සැලැස්ම සහ කාර්ය සාධන මිනුම්

### 6.1. සංවිධානමය විශිෂ්ටත්වය

| උපාය මාර්ග අංකය | උපායමාර්ගය | ක්‍රියාමාර්ග | කාර්යසාධන මිනුම |
|---|---|---|---|
| 5.1.3. (i) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ව්‍යුහය සහ කළමනාකරණ ව්‍යවහාර විමර්ශනය | • කමිටුවක් පත් කිරීම සහ නිර්දේශ ලබා ගැනීම<br>• බුද්ධි කලම්බන සැසි<br>• පාලක මණ්ඩලයේ දී සාකච්ඡා කිරීම<br>• අනුමැතිය සඳහා වාර්ෂික මහා සභාවට ඉදිරිපත් කිරීම | • කමිටු නිර්දේශ සහ අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධාන (IFLA) නියමුවලට අනුව ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ව්‍යුහය සහ කළමනාකරණ ව්‍යවහාරවල සංවර්ධනය |
| 5.1.3. (ii) සහ (iii) | කමිටු සහ කණ්ඩායම් විමර්ශනයට ලක් කිරීම පුස්තකාල සංගමයේ කටයුතු කෙරෙහි, සාමාජිකයන් සමග සබඳතා පැවැත්වීමේ දී, ඔවුන්ගේ දුක්ගැනවිලිවලට පිළිතුරු සෙවීමේ දී සහ විශේෂයෙන් සංගමයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ දී මෙම විද්වත් කමිටුවලින් විශාල බලපෑමක් සිදුවේ. | • කමිටුවක් පත් කර නිර්දේශ ලබා ගැනීම<br>• පාලක මණ්ඩලයේ දී සාකච්ඡා කර අනුමැතිය ලබා ගැනීම | • පෙර පැවති කමිටු/කණ්ඩායම් සමග නව කමිටු/කණ්ඩායම් සසඳා සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වී ඇත් දැයි පරීක්ෂා කිරීම |
| 5.1.3. (iv) | රැස්වීම්වලට අමතරව ඉලෙක්ට්‍රොනික තැපැල් සංවාද සහ මාර්ගගත සංවාද මණ්ඩප සඳහා කමිටු/කණ්ඩායම් දිරිමත් කිරීම | • ඉලෙක්ට්‍රොනික තැපැල් සහ මාර්ගගත සංවාද මණ්ඩප භාවිත කරන මෙන් කමිටු/කණ්ඩායම්වලින් ඉල්ලා සිටීම<br>• සන්නිදර්ශන කිහිපයක් පැවැත්වීම | • කමිටු/කණ්ඩායම් විසින් පවත්වන මාර්ගගත සංවාද සහ විධිමත් රැස්වීම් සැසඳීම |
| 5.1.3. (v) | පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රයේ පවත්නා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතීන්ගේ සංගමය වැනි සංගම් | • සංවාද මණ්ඩප ගොඩ නැංවීමට හෝ ප්‍රාණවත් කිරීමට සාමාජිකයන් දිරිමත් කිරීම | • පෙර පැවති සංවාද මණ්ඩපවලට සාපේක්ෂව අලුතින් ගොඩ නංවන ලද සංවාද මණ්ඩප සංඛ්‍යාව |

| | | | |
|---|---|---|---|
| | නිර්මාණයට ධෛර්යය දීම. | • නව සංවාද මණ්ඩප ගොඩ නැංවෙන මුල් අවධිය තුළ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ඒ සඳහා සහාය වීම | ගණනය කිරීම |
| 5.1.3. (vi) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සියලු කමිටු සහ කණ්ඩායම්වලට ද, ඒවායේ නිලධාරීන් සියල්ලන් සඳහාම හොඳින් නිර්වචනය කරන ලද රාජකාරී ලැයිස්තුවක්, මාර්ගෝපදේශයක් සහ වගකිම් ලැයිස්තුවක් ලබා දීම | • නියමාවලියක් සම්පාදනය සඳහා කමිටුවක් පත් කිරීම<br>• බුද්ධි කලම්බන සැසි පැවැත්වීම<br>• කෙටුම්පත පාලක මණ්ඩලය විසින් අනුමත කිරීම<br>• මුද්‍රණය කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සියලු කමිටු සඳහා මාර්ගෝපදේශන සහ කමිටු සාමාජිකයන්ගේ රැකියා විස්තර සහ වගකීම් දක්වමින් ගුණාත්මක නියමාවලියක් ප්‍රකාශයට පත් කිරීම |
| 5.1.3. (vii) | පාලක මණ්ඩලයට/විධායක කමිටුවට අලුත් මුහුණු ආකර්ශනය කර ගැනීම සහ මේවායේ දිගු කාලයක් සේවය කළ අයට ඉසිඹුවක් ලබා ගැනීමට අනුබල දීම | • පාලක මණ්ඩලයේ හෝ විධායක කමිටුවේ/විද්වත් කමිටුවල සේවය කර නොමැති නව මෙන්ම ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් හඳුනා ගැනිම<br>• මේවාට සම්බන්ධ වීමට ඔවුන් දිරිමත් කරන වැඩසටහනක් පැවැත්වීම සහ අදාළ වගකීම් සහ ඒවාට සම්බන්ධ වීමේ වැදගත්කම පිළිබඳ හැඳින්වීමක් ඔවුන්ට ලබා දීම<br>• මෙහි දෙවන වැඩසටහන සේවයට ලැදි තෝරා ගත් සීමිත පිරිසකට වාර්ෂික මහා සභාවට සමීපව පැවැත්වීම<br>• දිගු කාලයක් සේවය කළ නිලධාරීන්ට ඉසිඹුවක් ලබා ගැනීමට දිරිමත් කිරීම | • පාලක මණ්ඩලයේ සහ විද්වත් කමිටුවල නව මුහුණු සංඛ්‍යාව සහ දිගු කාලයක් පාලක මණ්ඩලයේ අඛණ්ඩව සේවය කර ඇති සාමාජිකයන්ගේ සංඛ්‍යාව අඩුවීම |
| 5.1.3. (viii) | නිලධාරි මණ්ඩලය සහ කමිටු සාමාජිකයන් සඳහා හොඳින් සැලසුම් කරන ලද ඵලදායි නායකත්ව සංවර්ධන වැඩසටහනක් දියත් කිරීම | • ගුණාත්මක වැඩසටහනක් සංවර්ධනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම<br>• අධ්‍යයන වර්ෂය ආරම්භයේ දී වැඩසටහනෙහි පළමු කොටස පැවැත්වීම<br>• වසර මධ්‍යයේ දී දෙවන කොටස පැවැත්වීම<br>• ප්‍රගතිය ඇගයීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ කාර්යයන්හි ගුණාත්මකභාවයේ වර්ධනය<br>• සමස්ත කාර්ය සාධනයේ වර්ධනය<br>• IFLA මාර්ගෝපදේශ සහ වෙනත් පුස්තකාල සංගම්වල විශිෂ්ට |

| | | | |
|---|---|---|---|
| | | | ව්‍යවහාර සමග සැසඳීම |
| 5.1.3. (ix) | සංගමයේ ඉවත් වන නිලධාරීන් සහ අලුතින් පත්වන නිලධාරීන් අතර අධ්‍යයන වසර මුලදීම සංවාදයක් පැවැත්වීම | • නව පාලක මණ්ඩලය රැස්වීම සූදානම් කිරීම<br>• තනතුරුවලින් ඉවත්වන පාලක මණ්ඩල සාමාජිකයන් තමන්ගේ කාර්ය සාධනය පිළිබඳ ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කිරීම<br>• අත්දැකීම්, දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති සහ උගත් පාඩම් ගැන සාකච්ඡා කිරීම<br>• රැස්වීමෙහි වාර්තාවක් සකස් කර පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීම | • ව්‍යාපෘතිවල අඛණ්ඩ පැවැත්ම<br>• ගොනු කරන ලද වාර්තා සංඛ්‍යාව<br>• කමිටුවල සහ පාලක මණ්ඩලයේ කාර්ය සාධන වර්ධනය |
| 5.1.3. (x), (xi) | විශේෂ රුචිකත්ව කණ්ඩායම් නිර්මාණය මගින් තම සුවිශේෂ වෘත්තිය ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමට සාමාජිකයන්ට අවස්ථාව ලබා දීම සහ ඒ මගින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ක්‍රියාකාරකම්වලට දායක වීම | • විශේෂ රුචිකත්ව කණ්ඩායම් නිර්මාණය කිරීමට සාමාජිකයන්ට ආරාධනා කිරීම<br>• පාලක මණ්ඩලය ඒ පිළිබඳ මූලික මාර්ගෝපදේශ නිකුත් කිරීම | • පිහිට වූ විශේෂ රුචිකත්ව කණ්ඩායම් සංඛ්‍යාව<br>• මීට පෙර වැඩි අවධානයක් යොමු නොවූ ක්ෂේත්‍ර පිළිබඳ සජීවී සාකච්ඡා |
| 5.1.3. (xii) | ශ්‍රී ලංකා පුස්තකාල සංගම් කාර්යාලයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන විධායක නිලධාරි/ප්‍රහුණු කළමනාකරුවෙකු පත් කිරීම සහ කාර්යාල කටයුතු පවත්වා ගෙන යාමට අමතරව ඔහු/ඇය වෙත ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ, අධීක්ෂණය කිරීමේ සහ මෙහෙයවීමේ බලතල පැවරීම | • ප්‍රධාන විධායක නිලධාරි/ප්‍රහුණු කළමනාකරු තනතුර සඳහා බඳවා ගැනීම් පටිපාටි සහ රැකියා විස්තරය සැකසීමට කමිටුවක් පත් කිරීම<br>• පාලක මණ්ඩලයේ අනුමැතියගෙන දැන්වීම් පළ කිරීම<br>• සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සහ බඳවා ගැනීම<br>• පූර්ණ කාලීන නම් වඩාත් සුදුසුය. එසේ නොහැකි නම් අර්ධ කාලීන බඳවා ගැනීමක් කිරීම<br>• ප්‍රධාන විධායක නිලධාරි/ප්‍රහුණු කළමනාකරු සඳහා මූලික මග පෙන්වීම සහ පහසුකම් සැපයීම | • ප්‍රධාන විධායක නිලධාරි/ප්‍රහුණු කළමනාකරු බඳවා ගැනීම |

| | | | |
|---|---|---|---|
| | | • ආරම්භයේ දී කාල ඡේදයක් සඳහා මෙම තනතුරට අනුග්‍රහය දැක්වීමට බාහිර ආයතනයකින් සහාය ගැනීමට උත්සාහ කිරීම | |
| 5.1.3. (xiii), (xiv) | ගුණාත්මක බව වර්ධනය සඳහා කාර්යාල කාර්ය මණ්ඩල ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම සහ ගුණාත්මක කාර්යාල ව්‍යවහාරයන් හඳුන්වා දීම.<br><br>මනා සේවාවක් සැපයීම සඳහා ස්වකීය කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමට අවශ්‍ය පුහුණු පහසුකම් කාර්ය මණ්ඩලයට සැපයීම | • කළමනාකරණ ක්ෂේත්‍රයෙන් කමිටුවක් හෝ විශේෂඥයෙකු පත් කර නිර්දේශ ලබා ගැනීම<br>• පාලක මණ්ඩලය එය සාකච්ඡා කර ක්‍රියාත්මක කිරීම<br>• නව තනතුරු නාම හඳුන්වා දීම<br>• සියලුම කාර්ය මණ්ඩලය සඳහා රැකියා විස්තර සහ රාජකාරී ලැයිස්තු නිකුත් කිරීම<br>• පුහුණු අවස්ථා වැඩි දියුණු කිරීම | • ආකර්ශනීය හා උද්‍යොගිමත් කාර්යාලයක්<br>• ගුණාත්මක ප්‍රතිඵල වර්ධනය<br>• කාර්ය මණ්ඩල තෘප්තිය මැනීම |
| 5.1.3. (xv) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සඳහා අමතර ඉඩකඩ ලබා ගැනීම - දැනට කාර්යාලය පිහිටා ඇති OPA පරිශ්‍රයෙහිම නම් වඩා සුදුසු වේ. | • විද්වත් වෘත්තික සංගම් සංවිධාන පරිශ්‍රයේ ඇතිවන ඉඩකඩ අවස්ථා පිළිබඳ අවධානයෙන් සිටීම<br>• කල්බදු ක්‍රමයට ලබා ගැනීම හෝ ස්ථිරව හෝ එය මිලදී ගැනීම | • සංගමයට අතිරේක කාර්යාල ඉඩකඩ හිමිවීම |
| 5.1.3. (xvi) | සියලු නිලවාර්තා, සම්මන්ත්‍රණ, සැසි වාර්තා ඩිජිටල්ගත කරමින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය තුළ ඩිජිටල් ලේඛනාගාරයක් සැකසීම. | • උපදේශකයෙකුගේ සේවාව ලබා ගැනීම<br>• ස්කෑන් යන්ත්‍රයක් සහ වෙනත් අවශ්‍ය දෑ මිලදී ගැනීම<br>• කාර්යාල නිලධාරීන් දෙදෙනෙකු පුහුණු කිරීම<br>• ප්‍රමුඛතා ලැයිස්තුවක් සැකසීම<br>• එසේත් නැත්නම්, මෙම කාර්යය බාහිර ආයතනයකට පැවරීම | • ඩිජිටල් ලේඛනාගාරයක් ස්ථාපිත කිරීම |
| 5.1.3. (xvii) | වෘත්තීය ආචාර ධර්ම පද්ධතියක් හරහා සාමාජිකයන් අතර | • ආචාර ධර්ම පද්ධතියේ සංශෝධන අවසන් කිරීම | • සංශෝධිත ආචාර ධර්ම පද්ධතිය නිකුත් කිරීම<br>• සම්මන්ත්‍රණ සැසි |

| | | | |
|---|---|---|---|
| | වෘත්තියවේදීත්වයේ වැදගත්කම අවධාරණය කිරීම. | • ශාස්ත්‍රීය සඟරාවේ සහ පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික සම්මන්ත්‍රණයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම<br>• අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහනක් වැඩි දියුණු කිරීම | වාර්තාවල හා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වාර සඟරාවේ උපුටන මැනීම<br>• සම්මන්ත්‍රණයට හා වාර සඟරාවට ඉදිරිපත් කරන පත්‍රිකාවල තත්ව වර්ධනය |
| 5.1.3. (xviii) | පුවත් පත්‍රිකාවට අමතරව, සිය සාමාජිකයන් සමග නිරන්තරයෙන් සන්නිවේදනය කිරීමට සෑම විද්වත් කමිටුවකටම සහ ප්‍රධාන ව්‍යාපෘතියකට යාන්ත්‍රණයක් තිබිය යුතුය. උදා: විද්යුත් තැපැල් කණ්ඩායම්, විද්යුත් පුවත් පත්‍රිකා ආදිය | • ස්වකීය විද්යුත් තැපැල් කණ්ඩායම්, විද්යුත් පුවත් පත්‍රිකා ආදිය භාවිත කිරීමට කමිටු සහ ප්‍රධාන ව්‍යාපෘති දිරිගැන්වීම<br>• විශිෂ්ට ව්‍යවහාර හඳුනා ගැනීම | • විද්යුත් තැපැල් කණ්ඩායම්, විද්යුත් පුවත් පත්‍රිකා ඇතුළු මාර්ගගත ක්‍රියාකාරකම්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මක බව මැනීම |
| 5.1.3. (xix) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පෙනුම (visibility) වර්ධනය කිරීමටත් සාමාජිකයන් අතර සහ මහජනතාව සමග සන්නිවේදනය ශක්තිමත් කිරීමටත් ෆේස්බුක්, ට්විටර් සහ වෙනත් සමාජ මාධ්‍ය භාවිතය සක්‍රිය කිරීම | • සමාජ මාධ්‍ය භාවිතය පුළුල් කිරීම<br>• සමාජ මාධ්‍ය පරිහරණයේ වගකීම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් භාර ගැනීම<br>• අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම | • ක්‍රියාශීලී සමාජ මාධ්‍ය වැඩසටහන් පැවතීම |
| 5.1.3. (xx) | සංගමයේ මූල්‍ය ස්ථාවර භාවය වර්ධනය කිරීම | • මූල්‍ය කළමනාකරණයේ විනිවිදභාවය<br>• සාමාජිකත්වය පුළුල් කිරීම<br>• අරමුදල් වර්ධන ව්‍යාපෘති දියත් කිරීම<br>• මූල්‍ය පදනම ශක්තිමත් කිරීම සඳහා වෙනත්, විවිධ මාර්ග ගවේෂණය කිරීම<br>• මූල්‍යමය වශයෙන් තිරසාර මෙහෙයුම් | • නව සාමාජිකයන් සංඛ්‍යාව/ආදායම ගණනය කිරීම<br>• අරමුදල් වර්ධන ව්‍යාපෘතිවල වර්ධනය<br>• ආදායම ඉහළ යාම |

| | | | |
|---|---|---|---|
| 5.1.3. (xxi) | මහජනතාවගේ සහ බලධාරීන්ගේ අවධානය ලබා ගැනීමට අදාළ ගැටලු පිළිබඳ මාධ්‍ය නිවේදන වරින් වර නිකුත් කිරීම | • පුස්තකාල හා විඥාපන විද්‍යා වෘත්තියට සම්බන්ධ ප්‍රධාන ගැටලු ගැන අවධානයෙන් සිටීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට ප්‍රචාරය ලබා ගත හැකි ප්‍රධාන ව්‍යාපෘති හඳුනා ගැනීම<br>• වරින් වර මාධ්‍ය නිවේදන නිකුත් කිරීම<br>• මාධ්‍ය සමග ඇති සබඳතා වර්ධනය කර ගැනීම<br>• මෙම කාර්ය සඳහා කණ්ඩායමක් හඳුනා ගැනීම | • මාධ්‍ය නිවේදන සංඛ්‍යාව ගණනය කිරීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ කාර්ය පිළිබඳ වැඩි ප්‍රචාරය<br>• පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයේ ගැටලු පිළිබඳ වැඩි ප්‍රචාරය<br>• සාමාජිකයන් අතර උද්‍යොගය ඉහළ යාම |
| 5.1.3. (xxii) | ඉෆ්ලා නියමු සහ වෙනත් පුස්තකාල සංගම්වල විශිෂ්ට ව්‍යවහාරයන් අනුගමනය කිරීම. | • IFLA නියමු පිළිබඳ අවධානයෙන් සිටීම<br>• පුස්තකාල සංගම්වල විශිෂ්ට ව්‍යවහාර අධ්‍යයනය කිරීම<br>• ශ්‍රී ලංකාවේ තත්ත්වයට ගැලපෙන එකී ව්‍යවහාරයන් ක්‍රියාත්මක කිරීම | • නව IFLA නියමු සහ වෙනත් පුස්තකාල සංගම්වල විශිෂ්ට ව්‍යවහාරයන් පිළිබඳ පවත්වන සාකච්ඡා වාර ගණන<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ගුණාත්මකභාවයේ වර්ධනය |

## 6.2. තොරතුරු වෙත ප්‍රවේශය වර්ධනය කිරීම සහ දැනුම නිර්මාණයට පහසුකම් සැලසීම

| උපාය මාර්ග අංකය | උපායමාර්ගය | ක්‍රියාමාර්ග | කාර්යසාධන මිනුම |
|---|---|---|---|
| 5.2.2. (i) | පුස්තකාල ක්ෂේත්‍රයේ සිදුව ඇති වෙනස්කම් පිළිබඳ පුස්තකාල අධිකාරීන් (පළාත් පාලන බලධාරීන්, අධ්‍යාපන බලධාරීන්, උසස් අධ්‍යාපන බලධාරීන් ආදී) දැනුවත් කිරීමේ සහ ඒ අනුව පුස්තකාල හා තොරතුරු සේවා නවීකරණය කිරීමේ වැදගත්කම අවධාරණය කිරීමේ වැඩසටහන් දියත් කිරීම | • සෑම විද්වත් කමිටුවක් මගින්ම මෙම වැඩසටහන සැලසුම් කිරීමට බුද්ධිකලම්බන සැසි පැවැත්වීම<br>• සැලැස්ම පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීම<br>• වෙනත් පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනවලින් සහාය ලබා ගැනීම<br>• සැලැස්ම ක්‍රියාත්මක කිරීම | • විද්වත් කමිටු මගින් පවත්වන ලද බුද්ධිකලම්බන සැසි ගණන<br>• ජාතික මෙන්ම පළාත් /දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද වැඩසටහන් ගණන<br>• වැඩසටහන්වල ගුණාත්මකභාවය |

| | | | |
|---|---|---|---|
| | | | |
| 5.2.2. (ii) | පවත්නා පුස්තකාල නවීකරණය කිරීමටත්, පහසුකම් අඩු ප්‍රදේශ වෙත විශේෂ අවධානයක් සහිතව පාසල්, මහජන, විශේෂ, ශාස්ත්‍රීය හා වෙනත් ක්ෂේත්‍රවල පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන තවදුරටත් ගොඩ නැංවීමටත් බලධාරීන් දිරිමත් කිරීම | • වැඩි දියුණු කිරීමට අවශ්‍ය පුස්තකාල ගැන බලධාරීන් දැනුවත් කිරීම (ගොඩනැගිලි, ගෘහභාණ්ඩ උපකරණ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය ආදී)<br>• නොදියුණු ප්‍රදේශවල පුස්තකාල පැවතීමේ අවශ්‍යතාව ගැන බලධාරීන් දැනුවත් කිරීම සහ එවන් ප්‍රදේශ හඳුනා ගැනීම | • පුස්තකාල වැඩි දියුණු කිරීම පිළිබඳ බලධාරීන්ට ඉදිරිපත් කරන ලද නිර්දේශ සංඛ්‍යාව<br>• නොදියුණු ප්‍රදේශවල පුස්තකාල ආරම්භ කිරීම පිළිබඳ බලධාරීන් වෙත කරන ලද නිර්දේශ සංඛ්‍යාව<br>• සාර්ථක ව්‍යාපෘති සංඛ්‍යාව |
| 5.2.2. (iii) | විවිධ පුස්තකාල අංශයන් ශක්තිමත් කිරීම සඳහා නව පුස්තකාල ව්‍යවස්ථා හඳුන්වා දීම හෝ පැරණි පුස්තකාල ව්‍යවස්ථා සංශෝධනය කිරීම සඳහා අදාළ බලධාරීන්ට සහාය වීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විද්වත් කමිටුවල සහාය ඇතිව සියලු පුස්තකාල හා විඥාපන විද්‍යා අංශවල නව පුස්තකාල ව්‍යවස්ථාවල අවශ්‍යතාව හෝ පවත්නා ව්‍යවස්ථා දියුණු කිරීමේ අවශ්‍යතාව හඳුනා ගැනීමට පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීම<br>• නව පුස්තකාල ව්‍යවස්ථා හඳුන්වා දීම සහ පවත්නා ව්‍යවස්ථා දියුණු කිරීමේ වැදගත්කම පිළිබඳ අදාළ බලධාරීන් දැනුවත් කිරීම<br>• විශේෂඥ කමිටුවක් පත් කර මූලික ව්‍යවස්ථා කෙටුම්පත් සකස් කිරීම සහ ඒවා සලකා බැලීම සඳහා බලධාරීන්ට ඉදිරිපත් කිරීම<br>• අදාළ විද්වත් කමිටුව/කමිටු හරහා ප්‍රගතිය පරීක්ෂා කිරීම | • නව පුස්තකාල ව්‍යවස්ථා හඳුන්වා දීමට හා පවත්නා ව්‍යවස්ථා සංශෝධනය කිරීමට ගන්නා ලද උත්සාහයන් ගණන<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් සකසන ලද නව ව්‍යවස්ථා කෙටුම්පත් ගණන<br>• නව පුස්තකාල ව්‍යවස්ථා හඳුන්වා දීම<br>• පවත්නා ව්‍යවස්ථා සංශෝධනය කිරීම |
| 5.2.2. (iv) | පුස්තකාලවල ගුණාත්මක බව වර්ධනය කිරීමට | • ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මීට පෙර හඳුන්වා දුන් | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විද්වත් කමිටු මගින් සකසන ලද |

| | | | |
|---|---|---|---|
| | පුස්තකාල ප්‍රමිති සම්පාදනය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට සහාය වීම සහ අවශ්‍ය අවස්ථාවල දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රමිති සම්පාදනය කිරීම | වත්මන් පුස්තකාල ප්‍රමිති සංශෝධනය කිරීමට ඊට සහාය වීම<br>• ස්වකීය පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍ර සඳහා පුස්තකාල ප්‍රමිති කෙටුම්පත් සම්පාදනය කිරීමට විද්වත් කමිටු දිරිමත් කිරීම | නිශ්චිත පුස්තකාල ප්‍රමිති කෙටුම්පත් සංඛ්‍යාව<br>• ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නියෝජිතයන් සහභාගී වූ පුස්තකාල ප්‍රමිති කමිටු රැස්වීම් ගණන<br>• ස්වකීය පුස්තකාල ප්‍රමිතීන් සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලද සංශෝධන ගණන<br>• මෙම විෂය පිළිබඳ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සමග පවත්වන ලද රැස්වීම්/සංවාද සංඛ්‍යාව |
| 5.2.2. (v) | පුස්තකාල සඳහා ප්‍රමාණවත් සම්පත් සැපයීමට බලධාරීන් එකඟ කර ගැනීම. ස්වකීය පුස්තකාල සඳහා එවන් සම්පත් සැපයීමක් නොකරන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන හා වෙනත් බලධාරීන් ඉලක්ක කර ගත් උද්දේශන වැඩසටහනක් විද්වත් කණ්ඩායම්වල සහාය ඇතිව දියත් කිරීම | • පුස්තකාල/පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍ර සඳහා වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ දත්ත හා සංඛ්‍යා ලේඛන එක් රැස් කිරීම<br>• ප්‍රමාණවත් නොවන අරමුදල් හඳුනා ගැනීම<br>• ප්‍රතිඵල ප්‍රචාරය කිරීම<br>• පුස්තකාල සඳහා ප්‍රමාණවත් අරමුදල් සම්පාදනයට හඬ නැගීමේ උද්දේශන වැඩසටහන් දියත් කිරීම | • පුස්තකාල/ පුස්තකාල හා තොරතුරු සේවා අංශ සඳහා අරමුදල් සම්පාදනය පිළිබඳ එක්රැස් කරන ලද දත්ත හා සංඛ්‍යා ලේඛන<br>• මෙම විෂය පිළිබඳ දියත් කරන ලද ප්‍රචාරණ සහ උද්දේශන වැඩසටහන්වල ප්‍රමාණාත්මකභාවය සහ ගුණාත්මකභාවය |
| 5.2.2. (vi) | වෙනත් පුස්තකාල අංශ/පුස්තකාලවල වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ සංඛ්‍යා ලේඛන එක් රැස් කිරීම සහ ඒවායේ පවත්නා විෂමතාවන් බලධාරීන්ගේ, මාධ්‍යවල, බලපෑම් | • පුස්තකාල සඳහා වාර්ෂික අරමුදල් වෙන් කිරීම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම<br>• සංඛ්‍යා ලේඛන ප්‍රකාශයට පත් කිරීම<br>• පුස්තකාල සඳහා වැඩි අරමුදල් ලබා ගැනීම ප්‍රවර්ධනය කිරීමට | • පුස්තකාලවල අරමුදල් තොරතුරුවල පැවතීම<br>• සංඛ්‍යා ලේඛන ප්‍රකාශන<br>• උද්දේශන කටයුතු සඳහා මෙම තොරතුරු යොදා ගත් වාර ගණන<br>• බලධාරීන් සමග ගනුදෙනු කරන ලද ලිපි ප්‍රමාණය |

| | | | |
|---|---|---|---|
| | කණ්ඩායම්වල සහ පොදු ජනතාවගේ අවධානය පිණිස වරින් වර ප්‍රකාශයට පත් කිරීම | උද්දේශන වැඩසටහන් සඳහා ඒවා යොදා ගැනීම | • පුස්තකාල සඳහා වෙන් කරනු ලබන සම්පත්වල වර්ධනයන් |
| 5.2.2. (vii) | රටෙහි තොරතුරු නිදහස දිරිමත් කිරීම සහ තොරතුරු නිදහසට තර්ජනයක් එල්ල වන විට ඊට එරෙහිව කටයුතු කරන කණ්ඩායම් සමග එක් වී ඊට එරෙහිව කටයුතු කිරීම | • ශ්‍රී ලංකාවේ තත්ත්වය වෙත විශේෂ අවධානය යොමු කරමින් තොරතුරු නිදහස පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් දැනුවත් කිරීමට සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම<br>• මෙම විෂය පිළිබඳ IFLA නියමු සහ පර්යේෂණ අධ්‍යයනය කිරීම<br>• තොරතුරු නිදහස උල්ලංඝනය කිරීම පිළිබඳ අවදියෙන් සිටීම<br>• තොරතුරු නිදහස ආරක්ෂා කිරීමට අනෙකුත් වෘත්තීය සංවාද මණ්ඩප සමග එක් වීම | • පර්යේෂණ ව්‍යාපෘතිය දියත් කිරීම<br>• සාමාජිකයන් දැනුවත් කිරීමට පවත්වන ලද සම්මන්ත්‍රණ ගණන<br>• පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික සම්මන්ත්‍රණයට සහ ශාස්ත්‍රීය සඟරාව වෙත මෙම විෂය පිළිබඳ ඉදිරිපත් කරන ලද පත්‍රිකා සංඛ්‍යාව<br>• මෙම විෂය පිළිබඳ ප්‍රකාශයට පත් කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව<br>• තොරතුරු නිදහස සුරැකීමේ දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ප්‍රමුඛ හඬක් බවට පත්වීම |
| 5.2.2. (viii) | පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ ප්‍රවර්ධනය සහ දිරිමත් කිරීම | • පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ පිළිබඳ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම<br>• පුස්තකාල හා තොරතුරු විද්‍යා ජාතික සම්මන්ත්‍රණය හා සංගමයේ ශාස්ත්‍රීය සඟරාව පර්යේෂණ සඳහා අඛණ්ඩව සහාය වීම<br>• විජිතා ද සිල්වා පර්යේෂණ සම්මානයට සමාන තවත් දිරි ගැන්වීම් හඳුන්වා දීම | • ශාස්ත්‍රීය සඟරා හා සම්මන්ත්‍රණවලදී නව පර්යේෂණ ව්‍යාපෘති සහ ප්‍රකාශන පළ කිරීම මගින් පර්යේෂණ නිමවුමෙහි වර්ධනය නිශ්චය කිරීම<br>• අන්තර්ජාතික විචාරයන්හි උපුටා දක්වා ඇති ප්‍රකාශන සංඛ්‍යාව<br>• නව පර්යේෂණ දිරි ගැන්වීම් සංඛ්‍යාව |
| 5.2.2. (ix) | ශ්‍රී ලංකාව අනෙක් රටවලට සම්බන්ධ කරමින් මුහුද යටින් දිවෙන දෘශ්‍ය තන්තු රැහැන් ජාලය සහ චන්ද්‍රිකා සම්බන්ධතා | • සියලු භූගෝලීය කලාප ආවරණය කරමින් නවීන සන්නිවේදන ජාල සහ එහි බ්‍රෝඩ්බෑන්ඩ් ජාල ව්‍යාප්ති හරහා ශ්‍රී ලංකාව ලෝකයට සම්බන්ධ කිරීමත් පුස්තකාල | • ව්‍යාප්ත වන සන්නිවේදන ජාලය පිළිබඳ පවත්වන ලද සම්මන්ත්‍රණ හා සාකච්ඡා සංඛ්‍යාව<br>• මෙම අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සහ |

| | | | |
|---|---|---|---|
| | හරහා සියලු ඉලෙක්ට්‍රොනික් ව්‍යවහාරයන් සිදු කිරීමට දිවයිනම ආවරණය වන පුළුල් දෘශ්‍ය තන්තු විදුලි සංදේශන ජාලයක් සංවර්ධනය කිරීමේ රජයේ උත්සාහය ප්‍රවර්ධනය කිරීම සහ ඊට සහාය වීම. එය නවීන පුස්තකාල හා තොරතුරු සේවා සඳහා අත්‍යවශ්‍ය පසුබිමක් සපයනු ඇත. | සේවාවට එහි ඇති බලපෑමත් පිළිබඳ සම්මන්ත්‍රණ, සාකච්ඡා සංවිධානය කිරීම<br>• පුස්තකාල සහ තොරතුරු සේවා නවීකරණය සඳහා නූතන සන්නිවේදනය හරහා සපයනු ලබන අවස්ථා භාවිතයට ගන්නා ආකාරය පිළිබඳ බුද්ධිකලම්බන සැසි පැවැත්වීම | ඒවා පුස්තකාල සහ පුස්තකාල සේවාව නවීකරණය කිරීමට යොදා ගන්නා ආකාරය පිළිබඳ පවත්වන ලද බුද්ධිකලම්බන සැසි ගණන |
| 5.2.2. (x) | නව තාක්ෂණයන්ගෙන් උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට වේගයෙන් වර්ධනය වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන්ට ගැලපීම සඳහා පුස්තකාල ප්‍රජාවගේ වෘත්තීය කුසලතා සහ දැනුම වර්ධනය කිරීම. නවීන පුස්තකාල හා තොරතුරු සේවා කළමනාකරණය කිරීම සහ පවත්වා ගෙන යාමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සහ වෙනත් නව තාක්ෂණයන් හි වැදගත්කම අවබෝධ කර ගැනීමටත්, නව සහ සුදුසු පාඨමාලා හඳුන්වා දීමටත්, ආචාර්ය මණ්ඩලයේ ධාරිතාව ඉහළ නැංවීමටත්, ආචාර්ය මණ්ඩලය සඳහා තොරතුරු සහ සන්නිවේදන වෘත්තිකයන්ගේ සේවාව ලබා ගැනීමටත්, අවශ්‍ය තොරතුරු සහ | • පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනික බලධාරීන් සමග මනා සංවාදයක් ගොඩ නැංවීම<br>• පහසුකම්, පාඨමාලා, විෂයමාලා, අධ්‍යයන කාර්ය මණ්ඩල ආදිය පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීම<br>• ඔවුන්ගේ සීමාකම් සහ දුෂ්කරතා අවබෝධ කර ගැනීම<br>• අවශ්‍ය අවස්ථාවල, තත්ත්වය දියුණු කර ගැනීම සඳහා අධ්‍යාපන ආයතන සමග ඒකාබද්ධ ප්‍රයත්නයක් දියත් කිරීම<br>• පොදු ප්‍රතිලාභ සඳහා පුහුණු ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීමට පියවර ගැනීම<br>• විෂයමාලා සංශෝධන, නව පාඨමාලා හඳුන්වා දීම වැනි ඒකාබද්ධ වැඩසටහන් දියත් කිරීම<br>• අදාළ මව් ආයතනය/ආයතන වෙත අධ්‍යාපන ආයතන වෙනුවෙන් හඬ නැගීම | • මේ පිළිබඳ පුස්තකාල අධ්‍යාපන සංවිධාන සමග ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අන්තර් ක්‍රියාකාරීත්ව සංඛ්‍යාව<br>• හඳුන්වා දෙන ලද නව පාඨමාලා ගණන<br>• පාඨමාලා සහ විෂයමාලා සංශෝධන ප්‍රමාණය<br>• තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආවරණය කරමින් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන්හි නව මුල පිරීම්<br>• පහසුකම්වල වර්ධනයන් උදා: තොරතුරු තාක්ෂණ විද්‍යාගාර, Wi-Fi පහසුකම් |

| | | | |
|---|---|---|---|
| | සන්නිවේදන තාක්ෂණ විද්‍යාගාර හා වෙනත් පහසුකම් ලබා දීමටත් සිසුන් මෙම නව කුසලතාවලින් සන්නද්ධ කිරීමටත් පුස්තකාල අධ්‍යාපන හා පුහුණු සංවිධාන දිරිමත් කිරීම. | | |
| 5.2.2. (xi) | ජාතික ඩිජිටල් පුස්තකාලය සහ ඩිජිටල් තොරතුරු පරිසරයට ප්‍රවේශ වීම ප්‍රවර්ධනය කිරීම | • ජාතික ඩිජිටල් පුස්තකාලය ආරම්භ කිරීමට ජාතික පුස්තකාලය දිරිමත් කිරීම<br>• ඩිජිටල් ද්‍රව්‍ය එක්රැස් කිරීමටත් ඩිජිටල් ද්‍රව්‍ය වෙත ප්‍රවේශ පහසුකම් සැලසීමටත් සියලු පුස්තකාල දිරිමත් කිරීම<br>• රට පුරා විසිරී ඇති දුර්ලභ ජාතික එකතුන් හඳුනා ගැනීම සහ ප්‍රමුඛතා පදනමක් මත ඒවා ඩිජිටල්ගත කිරීම ප්‍රවර්ධනය කිරීම<br>• ජාතික විද්‍යා පදනම විසින් පවත්වා ගෙන යනු ලබන වැඩසටහන්වලට සමාන ඩිජිටල්කරණ සහාය වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම | • පුස්තකාල හා පුස්තකාල බලධාරීන් අතර ඩිජිටල්කරණය පිළිබඳ ඇති කරන මනා දැනුවත්භාවය සහ උනන්දුව<br>• ඩිජිටල්කරණය සඳහා අරමුදල් ඉහළ යාම<br>• හඳුනා ගන්නා ලද දුර්ලභ එකතු සංඛ්‍යාව<br>• ඩිජිටල්ගත කරන ලද එවැනි එකතු සංඛ්‍යාව<br>• පුස්තකාලවල ස්ථාපිත කරන ලද නව ඩිජිටල්කරණ පහසුකම් සංඛ්‍යාව |
| 5.2.2. (xii) | සමාජ මාධ්‍ය ප්‍රවර්ධනය සහ පුරවැසි සහභාගීත්වය මෙන්ම පුරවැසියන් විසින් අන්තර්ගතය නිර්මාණය කිරීමට දිරි දීම | • සමාජ මාධ්‍ය භාවිත කිරීමට පුස්තකාල දිරිමත් කිරීම<br>• සමාජ මාධ්‍ය භාවිත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් සැපයීම<br>• පුරවැසි අන්තර්ගත නිර්මාණ දිරි ගැන්වීම | • සමාජ මාධ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන් ගණන<br>• පුස්තකාලවල සමාජ මාධ්‍ය භාවිත කිරීමේ නව මුල පිරීම් ගණන<br>• පුරවැසි/පාඨක අන්තර්ගත නිර්මාණවල ගුණාත්මකභාවය |
| 5.2.2. (xiii) | වැදගත් එකතු ඩිජිටල්ගත කිරීමට සහ එකතුව සඳහා ඩිජිටල් ද්‍රව්‍ය ලබා ගැනීමට පුස්තකාලවලට දිරි දීම සහ පුහුණුව, ප්‍රමිතීන් සහ වෙනත් පහසුකම් සැපයීමෙන් සහාය වීම | • පුස්තකාලවල ඩිජිටල්කරණ ව්‍යාපෘති සඳහා වැඩි මුදලක් සැපයීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හා ජාතික විද්‍යා පදනම සමග ඒකාබද්ධ වැඩසටහනක් දියත් කිරීම<br>• රට පුරා විසිරී ඇති දුර්ලභ | • පුස්තකාලයාධිපතීන් සහ පුස්තකාල අතර ඩිජිටල්කරණය පිළිබඳ ඇති කරන දැනුවත්භාවය සහ උනන්දුව<br>• ඩිජිටල්කරණ සඳහා අරමුදල් ඉහළ යාම<br>• හඳුනා ගන්නා ලද දුර්ලභ |

| | | | |
|---|---|---|---|
| | | ජාතික එකතු හඳුනා ගැනීම සහ ප්‍රමුඛතා පදනමක් මත ඒවා ඩිජිටල්ගත කිරීම ප්‍රවර්ධනය කිරීම<br>• ස්වකීය ඩිජිටල්කරණ පහසුකම් ස්ථාපිත කිරීමට ප්‍රධාන පුස්තකාලවලට සහාය වීම<br>• ජාතික විද්‍යා පදනමෙහි වත්මන් ඩිජිටල්කරණ ව්‍යාපෘතිය දිරිමත් කිරීම සහ ඊට සමාන ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම<br>• මෙම විෂය පිළිබඳ පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>• බලධාරීන් දැනුවත් කිරීමට සහ ඔවුනට බලපෑම් කිරීමට උද්දේශන වැඩසටහන් දියත් කිරීම<br>• විශිෂ්ට ව්‍යවහාර ප්‍රචාරය කිරීම සහ පිළිගැනීමට ලක් කිරීම | එකතු සංඛ්‍යාව<br>• එබඳු දුර්ලභ එකතු ඩිජිටල්කරණය කරන ලද ප්‍රමාණය<br>• පුස්තකාලවල ස්ථාපිත කරන ලද නව ඩිජිටල් පහසුකම් සංඛ්‍යාව |
| 5.2.2. (xiv) | පුස්තකාලවල වැදගත්කම සහ වටිනාකම විදහා දැක්වීම සඳහා ස්වකීය පුස්තකාලවල උසස් ගුණාත්මක පුස්තකාල සහ තොරතුරු සේවාවක් ඇති කර ලීම සඳහා සාමාජිකයන් දිරිමත් කිරීම | • විද්වත් කමිටු හරහා පුස්තකාල හා පුස්තකාල සේවාවන් හි ගුණාත්මකභාවය ඇගයීමට සමීක්ෂණයක් පැවැත්වීම<br>• දුර්වලතා සඳහා හේතු හඳුනා ගැනීමට කමිටු මෙහෙයවීම<br>• තත්ත්වය වැඩි දියුණු කිරීමට පුස්තකාල හා පුස්තකාලයාධිපතීන්ට උදව් කිරීමට සුදුසු පියවර ගැනීම<br>• අවශ්‍ය පියවර ගැනීම සඳහා පුස්තකාල බලධාරීන්ට බලපෑම් කිරීමට උද්දේශනය භාවිත කිරීම<br>• විද්වත් කමිටු හරහා ප්‍රගතිය පරීක්ෂා කිරීම | • පුස්තකාලවල ගුණාත්මකභාවය සහ පුස්තකාලවල දුර්වලතා හඳුනා ගැනීමට පවත්වන ලද සමීක්ෂණ සංඛ්‍යාව<br>• ගුණාත්මකභාවය වර්ධනය කිරීමට සහ දුර්වලතා මගහැරවීමට ඉදිරිපත් කරන ලද යෝජනා<br>• සාර්ථක ව්‍යාපෘති සංඛ්‍යාව |

| | | | |
|---|---|---|---|
| 5.2.2. (xv) | විවෘත ප්‍රවේශක සම්පත් (Open access) ප්‍රවර්ධනය කිරීම | • විවෘත ප්‍රවේශක සම්පත් පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීමට අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම<br>• මෙම විෂය පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලාවලට ඇතුළත් කිරීම<br>• ස්වකීය ප්‍රකාශනවලට අනුබද්ධිත විවෘත ප්‍රවේශය අනුගත කිරීමට වෘත්තීය සංවිධාන, ආයතන ප්‍රවර්ධනය කිරීම | • විවෘත ප්‍රවේශ පිළිබඳ පවත්වන ලද අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ගණන<br>• පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලාවලට මෙම විෂය ඇතුළත් කිරීම<br>• ශ්‍රී ලංකාව තුළ විවෘත ප්‍රවේශ ප්‍රතිපත්ති අනුගත කරන වෘත්තීය සංවිධානවල වර්ධනය<br>• විවෘත ප්‍රවේශ සම්පත් සමග කටයුතු කිරීමට දැනුවත් සහ නිපුණතා සහිත පුස්තකාලයාධිපතීන්ගේ සංඛ්‍යාවේ වර්ධනය |
| 5.2.2. (xvi) | වර්තමානයේ විශ්වවිද්‍යාල පුස්තකාලවල ක්‍රියාත්මක වන විද්‍යුත් සඟරා කොන්සෝටියම (Consortium) සමානව ගුණාත්මක තොරතුරු වෙත ප්‍රවේශය සඳහා කොන්සෝටියම් නිර්මාණය කිරීමට පුස්තකාල බලධාරීන් හා පුස්තකාල දිරිමත් කිරීම සහ අවශ්‍ය සම්පත් ප්‍රතිපාදන සඳහා රජයේ සහාය ලබා ගැනීමට ප්‍රචාරණයේ යෙදීම | • විශ්වවිද්‍යාල පුස්තකාල කොන්සෝටියමේ සාමාජිකත්වය පුළුල් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම දිරිමත් කිරීම<br>• ස්වකීය ආයතන/සංවිධානවලට සම්බන්ධ පර්යේෂකයන්ට සේවා සැපයීම සඳහා කොන්සෝටියමක් ගොඩ නැංවීමට විශේෂ පුස්තකාල දිරිමත් කිරීම<br>• අනෙක් පුස්තකාල බලධාරීන් අතර මෙම සංකල්පය ප්‍රවර්ධනය කිරීම<br>• කොන්සෝටියම් ව්‍යාපෘතිවලට අරමුදල් සැපයීමට බලධාරීන්ට බලපෑම් කරන උද්දේශන වැඩසටහනක් දියත් කිරීම | • වත්මන් විශ්වවිද්‍යාල පුස්තකාල කොන්සෝටියමේ සාමාජිකත්වය වර්ධනය වීම<br>• අනෙකුත් පුස්තකාල ක්ෂේත්‍රවල නව කොන්සෝටියම් බිහිවීම<br>• කොන්සෝටියම් වෙත බලධාරීන්ගේ සහාය වර්ධනය වීම සහ අඛණ්ඩව ලැබීම |
| 5.2.2. (xvii) | ජාතික, පළාත්, පාසල්, ශාස්ත්‍රීය හා වෙනත් පුස්තකාල හා තොරතුරු අංශවල දැනටමත් ආරම්භ කර ඇති පුස්තකාල සංවර්ධන | • සියලුම පුස්තකාල හා විඥාපන විද්‍යා අංශවල අසම්පූර්ණ හෝ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති හඳුනා ගැනීම<br>• ව්‍යාපෘතිවල අසම්පූර්ණත්වය | • සම්පූර්ණ නොකරන ලද පුස්තකාල හා විඥාපන විද්‍යා ව්‍යාපෘතිවල බලධාරීන්ට කළ නියෝජනයන් සංඛ්‍යාව<br>• මෙබඳු සංවර්ධන ව්‍යාපෘති |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට බලධාරීන්ට සහාය වීම සහ ඒ පිළිබඳ උනන්දු කිරීම | නිසා ඇතිවන අයහපත් ප්‍රතිඵල හේතු සාධක අවධාරණය කිරීම<br>• බලධාරීන් දැනුවත් කිරීමට උද්දේශන වැඩසටහන් භාවිත කිරීම සහ ව්‍යාපෘති සම්පූර්ණ කිරීම | සම්පූර්ණ කල සංඛ්‍යාව |
| 5.2.2. (xviii) | සියලුම පුස්තකාල හා තොරතුරු සේවා අංශවල නව පුස්තකාල සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීමට බලධාරීන් දිරිමත් කිරීම | • පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ නව සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විද්වත් කමිටු හරහා පර්යේෂණ ව්‍යාපෘතියක් පැවැත්වීම<br>• හඳුනා ගන්නා ලද ව්‍යාපෘතිවල ශක්‍යතාව පිළිබඳ අදාළ බලධාරීන් සමග සාකච්ඡා පැවැත්වීම<br>• අදාළ බලධාරීන් සහ විශේෂඥයන් සමග ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම<br>• හැකි අවස්ථාවල, පුස්තකාල හා විඥාපන විද්‍යා නව ව්‍යාපෘති දැනට ක්‍රියාත්මකවන හෝ ඉදිරියේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විදේශාධාර ව්‍යාපෘතිවලට සම්බන්ධ කිරීම<br>• ව්‍යාපෘති සක්‍රිය කිරීම් සඳහා උද්දේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | • හඳුනා ගන්නා ලද නව පුස්තකාල සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව<br>• විවිධ බලධාරීන් සඳහා පවත්වන ලද උද්දේශන වැඩසටහන් සංඛ්‍යාව<br>• ආරම්භ කරන ලද නව පුස්තකාල සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව |
| 5.2.2. (xix) | පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ, විශිෂ්ට ව්‍යවහාර සහ ප්‍රමිත ලකුණු ව්‍යාපෘති ඇගයීමට වාර්ෂික සම්මාන පිරිනැමීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම | • වාර්ෂික සම්මාන ව්‍යාපෘතිය පිළිබඳ අධ්‍යයනය කිරීමට සහ සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කිරීම<br>• කමිටුව වෙත සිය නිර්දේශ සැපයීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විද්වත් කමිටු මෙහෙයවීම<br>• ව්‍යාපෘතිය සඳහා අනුග්‍රාහකයන් සොයා ගැනීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් නව සම්මාන ප්‍රදාන යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම |

| | | | |
|---|---|---|---|
| | | සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේ ආරම්භක උත්සවයේ දී සම්මාන ප්‍රදානය පැවැත්වීම | |

**6.3.** හොඳින් සැලසුම් කරන ලද උද්දේශනය

| උපාය මාර්ග අංකය | උපායමාර්ගය | ක්‍රියාමාර්ග | කාර්යසාධන මිනුම |
|---|---|---|---|
| 5.3.2. (i), (ii) | උද්දේශන කටයුතු සඳහා සෑම පුස්තකාල හා විඥාපන විද්‍යා අංශයකින් ම සහ භූගෝලීය කලාපයකින් ම ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ගේ ගුණාත්මක කණ්ඩායමක් හඳුනා ගැනීම. ඉෆ්ලා ව්‍යාපෘතිය යටතේ මෑත අතීතය තුළ උද්දේශනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලැබූ අය වෙත මෙහි දී විශේෂ සැලකිල්ලක් දැක්වීම | • IFLA පුහුණු වැඩසටහන සම්පූර්ණ කළ සාමාජිකයන් වෙතින් උද්දේශන කාර්ය සඳහා සාමාජික කණ්ඩායමක් හඳුනා ගැනීම<br>• අනෙක් උද්දේශන කණ්ඩායම් සාමාජිකයන් හඳුනා ගැනීම<br>• ජාතික කණ්ඩායමක්, විවිධ පුස්තකාල හා විඥාපන විද්‍යා කණ්ඩායම් සහ කලාප/පළාත් සඳහා කණ්ඩායම් ගොඩ නැංවීම<br>• ඔවුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>• හැකි අවස්ථාවල, ඔවුන් වැඩි දියුණු කිරීම සඳහා විදේශ පුහුණු අවස්ථා ඔවුනට සැපයීම | • ප්‍රධාන උද්දේශන කණ්ඩායම් සහ කමිටු/අංශ කණ්ඩායම් හඳුනා ගැනීම<br>• පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව |
| 5.3.2. (iii) | උද්දේශන කටයුතුවලට සහාය වීමටත් ඒවා සම්බන්ධීකරණය කිරීමටත් විශේෂ කමිටුවක් හෝ කණ්ඩායමක් පත් කිරීම | • උද්දේශනය සඳහා විශේෂ කමිටුවක් පත් කිරීම | • උද්දේශන විශේෂ කමිටුවේ පත් වීම |
| 5.3.2. (iv) | සියලුම පුස්තකාල හා තොරතුරු සේවා අංශවල තෝරාගත් කණ්ඩායම් සඳහා උද්දේශනය පිළිබඳ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ ඔවුන් වාරිකව විදේශ | • උද්දේශන කණ්ඩායම/කණ්ඩායම් සඳහා පුහුණු වැඩසටහන්<br>• වගකීම්වල වැදගත්කම සලකා බලමින් ඔවුන් සඳහා විදේශ පුහුණු පහසුකම් සැලසීම | • පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන<br>• විදේශ පුහුණු වැඩසටහන් ගණන |

| | | | |
|---|---|---|---|
| | පුහුණු, සම්මන්ත්‍රණ සහ චාරිකා සඳහා සහභාගී කරවීම සලකා බැලීම | | |
| 5.3.2. (v) | උද්දේශන ක්‍රියාකාරී සැලැස්ම සකසන විට උපායමාර්ගික සැලැස්මේ දැක් වූ විවිධ පුස්තකාල හා තොරතුරු සේවා අංශවල අභියෝග හා ගැටලු (එය වරින් වර සංශෝධනය කළ යුතුය) ප්‍රධාන උද්දේශන කමිටුව සහ අනෙකුත් උද්දේශන කමිටු විසින් විමසිය යුතු වීම | • උද්දේශන සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැකසීමේ දී බුද්ධි කලම්බනය<br>• විවිධ පුස්තකාල හා විඥාපන විද්‍යා අංශවල අභියෝග අධ්‍යයනය කිරීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විද්වත් කමිටුවල උපදෙස් ගැනීම<br>• ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කිරීම | • බුද්ධි කලම්බන සැසි ගණන<br>• උද්දේශන සඳහා ක්‍රියාකාරී සැලැස්ම |
| 5.3.2 (vi) | උද්දේශන කමිටුව සියලු විද්වත් කමිටු සමග සමීප සංවාදයක් පැවතිය යුතු වීම සහ උද්දේශන ව්‍යාපාරයන් දෙපාර්ශවයේ ම සම ප්‍රයත්නයක් ලෙස පවත්වා ගෙන යා යුතු වීම | • විද්වත් කමිටු සමග නිරන්තර අන්තර් ක්‍රියාකාරීත්වය<br>• ඒකාබද්ධ උද්දේශන වැඩසටහනක් දියත් කිරීම | • කමිටු සමග පවත්වන ඒකාබද්ධ උද්දේශන ව්‍යාපාරය |
| 5.3.2. (vii) | පුස්තකාල හා තොරතුරු සේවා හෝ ඊට අනුබද්ධිත අංශ සඳහා රජයෙන් පත් කරන ලද කොමිසම්, කමිටු, කරුණු එක් රැස් කිරීමේ මෙහෙයුම් සහ යෝජනා සඳහා වන ඉල්ලීම් ගැන අවදියෙන් සිටීම සහ ඒවාට විධිමත් ලෙස ප්‍රතිචාර දැක්වීම | • පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට හෝ පුස්තකාල හා තොරතුරු සේවා සහිත ක්ෂේත්‍රවලට සම්බන්ධව රජය විසින් පත් කරන ලද කමිටු සහ කොමිසම්වල තොරතුරු සෙවීම<br>• බුද්ධි කලම්බන සැසි පැවැත්වීම<br>• කොමිසම්, කමිටු වෙත ලිඛිත සහ වාචික සාක්ෂි සැපයීම | • පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රය සම්බන්ධ කටයුතු පිළිබඳ කොමිසම්, කමිටු වෙතට භාර දෙන ලද ප්‍රතිචාර සංඛ්‍යාව |
| 5.3.2. (viii) | සෑම පුස්තකාල හා තොරතුරු සේවා අංශයක ම ප්‍රමුඛ පුද්ගලයන්ගේ කණ්ඩායමක් හඳුනා | • සෑම පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයකම ප්‍රධාන කළමනාකරුවන් හඳුනා ගැනීම<br>• ඔවුන්ගේ නම් ශ්‍රී ලංකා | • විවිධ පුස්තකාල හා තොරතුරු සේවා අංශවල ප්‍රධාන කළමනාකරුවන්ගේ නාම ලේඛනයක් සැකසීම |

| | | | |
|---|---|---|---|
| | ගැනීම සහ ඔවුන් දැනුවත් කිරීමට පුවත් හසුන්, විද්‍යුත් පුවත් හසුන් ආදිය යැවීම මෙන්ම ඔවුන් සමග නිරන්තර මිත්‍රශීලී සබඳතා පවත්වා ගෙන යාම. | පුස්තකාල සංගමයේ තැපැල් නාමාවලියට ඇතුළත් කිරීම<br>• ඔවුන් වෙත පුවත් පත්‍රිකාව හා වෙනත් ප්‍රකාශන යැවීම | • ඔවුන් වෙත යවන ලද ලේඛන හා ප්‍රකාශන සංඛ්‍යාව සහ වර්ග<br>• ප්‍රතිචාර තිබේ නම් ඒවායේ ප්‍රමාණය |
| 5.3.2. (ix) | චක්‍ර ලේඛ, වාර්තා, පූර්වාදර්ශ, සංඛ්‍යාලේඛන, විවිධ තනතුරු සඳහා සුදුසුකම් හා එම සුදුසුකම්වල පිළිගැනීම් ජාත්‍යන්තර ව්‍යවහාර ආදී සියලු අත්‍යවශ්‍ය තොරතුරු සූදානම් කර ගැනීම. ඉහත සඳහන් හා අදාළ අනෙකුත් සියලු තොරතුරු ඇතුළත් කර යෝජිත ඩිජිටල් ලේඛනාගාරයේ සවිස්තරාත්මක දත්ත පදනමක් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් සංවර්ධනය කළ යුතුය. | • පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම අවශ්‍ය නීති හා වෙනත් ලේඛන එක් රැස් කිරීම<br>• විද්වත් කමිටු සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ අධීක්ෂණය මත එකතුව ස්ථාවරව වර්ධනය කිරීම<br>• ඩිජිටල් ලේඛනාගාරයක් සැකසීම | • ඩිජිටල් ලේඛනාගාරයක් සැකසීම<br>• සියලුම පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රවලට සම්බන්ධ අදාළ උද්දේශන ද්‍රව්‍ය ලැයිස්තුව<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සතුව සියලු මෙකී ද්‍රව්‍ය පැවතීම<br>• ඩිජිටල් ලේඛනාගාරය නිර්මාණය කිරීම |
| 5.3.2. (x) | උද්දේශන ව්‍යාපාරයට භාවිත කළ හැකි ප්‍රචාරක සාහිත්‍ය, ස්ලයිඩ් සහ වෙනත් ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහන් මාලාවක් සංවර්ධනය කිරීම | • උද්දේශන කටයුතු සඳහා සුදුසු ප්‍රචාරක ද්‍රව්‍ය හඳුනා ගැනීමට කමිටුවක් පත් කිරීම<br>• විද්වත් කමිටුවලින් මෙම විෂය පිළිබඳ නිර්දේශ ලබා ගැනීම<br>• වෙනත් පුස්තකාල සංගම්වල විශිෂ්ට ව්‍යවහාර අධ්‍යයනය කිරීම<br>• යෝජනාවලිය අනුමැතිය සඳහා පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීම<br>• හැකි නම් අනුග්‍රාහකයන් සොයා ගැනීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් හෝ බාහිර ආයතනයකට ලබා දීමෙන් | • අවශ්‍ය ප්‍රචාරක ද්‍රව්‍ය පිළිබඳ කමිටු සහ කණ්ඩායම්වල වාර්තා<br>• උද්දේශනය සඳහා ප්‍රචාරක ද්‍රව්‍ය පැවතීම |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රචාරක ද්‍රව්‍ය සැකසීම | |
| 5.3.2. (xi) | පුස්තකාල ක්ෂේත්‍රයේ ගැටලු මතු කර දැක්වීම සඳහා මාධ්‍ය ඵලදායී ලෙස භාවිත කිරීම. මනාව භාවිත කළ හැකි නම් මෙය ඉතා ප්‍රබල අවියකි. | • මාධ්‍ය සමග සුහද සබඳතාවක් ගොඩ නංවා ගැනීම<br>• විද්වත් කමිටුවල උපදේශකත්වය මත උද්දේශන කමිටුව මාධ්‍ය නිවේදන නිකුත් කිරීම<br>• සභාපති සහ පාලක මණ්ඩලයට කලින් දැනුම් දී අනුමැතිය ලබා ගැනීම<br>• මාධ්‍ය සංවිධාන සහ සම්ප්‍රේෂණ මාදිලිය හඳුනා ගැනීම<br>• වැඩිදුර විස්තර, පැහැදිලි කිරීම් අවශ්‍ය වූ විට මාධ්‍ය වෙත ප්‍රතිචාර දැක්විය යුතු පුද්ගලයා (සභාපති/උද්දේශන කමිටුවේ කැඳවුම්කරු හෝ වෙනත් අයෙකු) හඳුනා ගැනීම | • නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන සංඛ්‍යාව<br>• මාධ්‍ය මගින් මතු කිරීමෙන් පසු විසඳන ලද ගැටලු සංඛ්‍යාව |
| 5.3.2. (xii), (xiii) | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, විද්වත් වෘත්තික සංවිධානය, වෙනත් විද්වත් සංවිධාන, වෘත්තියවේදීන්, ලේඛකයන්, දේශපාලකයන් ආදී වෙනත් කණ්ඩායම්වල සහාය මේ සඳහා ලබා ගැනීම | • මිතුරන් හඳුනා ගැනීම<br>• ඔවුන් සමග සුහද සබඳතාවක් ඇති කර ගැනීම<br>• උද්දේශන කටයුතුවලට ඔවුන්ගේ සහාය ලබා ගැනීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට උපකාර කළ හැකි සංවිධාන හඳුනා ගැනීම<br>• උද්දේශන කටයුතුවල දී ඔවුන්ගේ සහාය ලබා ගැනීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සමත් වූ වාර ගණන |
| 5.3.2. (xiv) | ප්‍රබල සහායක කණ්ඩායමක් ගොඩ නැංවීමට ෆේස් බුක්, ට්විටර්, වෙබ් බ්ලොග් සහ වෙනත් සමාජ මාධ්‍ය භාවිත කිරීම | • උද්දේශන ව්‍යාපාරයට සමාජ මාධ්‍ය භාවිත කිරීම<br>• සමාජ මාධ්‍ය භාවිත කිරීමට නිපුණතාවය ඇති උද්දේශන කණ්ඩායම/කණ්ඩායම්වලින් විශේෂ කණ්ඩායමක් තෝරා ගැනීම<br>• බාහිර විශේෂඥයන් භාවිත කරමින් එම කණ්ඩායමට පුහුණුවක් ලබා දීම | • සමාජ මාධ්‍ය උද්දේශනය සඳහා විශේෂ කණ්ඩායමක් හඳුනා ගැනීම<br>• එම කණ්ඩායම් සඳහා පවත්වන ලද පුහුණු සැසි සංඛ්‍යාව<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ උද්දේශන ව්‍යාපාරය සඳහා සමාජ මාධ්‍ය භාවිතය |
| 5.3.2. (xv), (xvi) | ස්වකීය සුවිශේෂ නිර්මාණාත්මක කාර්ය | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ උද්දේශනයට | • උද්දේශන ක්ෂේත්‍රය පිළිබඳ පිරිනමන ලද |

| | | | |
|---|---|---|---|
| | ඇගයීම සහ පුස්තකාල තොරතුරු ක්ෂේත්‍රයට කරන ලද විශේෂ දායකත්වය වෙනුවෙන් ලේඛකයන් (උදා: හොඳම ළමා පොත හෝ හොඳම චිත්‍ර හෝ එවැනි) මාධ්‍යවේදීන් (පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ වැදගත් කරුණු පිළිබඳ හොඳම වාර්තාකරණය) රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ නිලධාරීන් (පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ දියුණුවට කැපී පෙනෙන දායකත්වයක් සැපයීම), දේශපාලකයන් (එම), මාධ්‍ය (එම) සඳහා වාර්ෂික සම්මාන ප්‍රදානය කිරීම. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට සිය උද්දේශන වැඩසටහනේ දී සහාය වන අතර, සංගමයට අවශ්‍ය බලය හා ශක්තිය ලබා දෙනු ඇත. | සහාය වන කණ්ඩායම්වලට සම්මාන පිරිනැමීමේ යෝජනා ක්‍රමයක් සැකසීම<br>• හැකිනම්, සම්මාන සඳහා අනුග්‍රාහකයන් සොයා ගැනීම<br>• වාර්ෂික සම්මාන උළෙල | සම්මාන සංඛ්‍යාව |

**6.4 ස්වකීය උපායමාර්ගික මෙහෙයුම් සාක්ෂාත් කර ගැනීමට සහ අභියෝග ජය ගැනීමට පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රවලට සහාය වීම**

| උපාය මාර්ග අංකය | උපායමාර්ගය | ක්‍රියාමාර්ග | කාර්යසාධන මිනුම |
|---|---|---|---|
| 5.4.2. (i) | සියලුම පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රවල දුර්වලතා සහ අභියෝගයන් හඳුනා ගැනීම සහ ප්‍රබලත්වය අනුව ඒවා වර්ග කිරීම | • විද්වත් කමිටුවල සහාය ඇතිව සියලු පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රවල දුර්වලතා හඳුනා ගැනීම<br>• මග පෙන්වීමක් ලෙස උපායමාර්ගික සැලැස්මේ දැක්වූ පුස්තකාල හා තොරතුරු සේවා අංශවල අභියෝග භාවිත කිරීම<br>• ප්‍රමුඛතා හඳුනා ගැනීම | • ප්‍රමුඛතා ක්ෂේත්‍ර සමග විවිධ පුස්තකාල හා තොරතුරු සේවා අංශවල අභියෝග ලැයිස්තුව |
| 5.4.2. (ii) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විද්වත් කමිටු සමග සහයෝගයෙන් | • පර්යේෂණ හා බුද්ධිකලම්භන සැසි<br>• වාර්ෂික ක්‍රියාකාරී | • බුද්ධිකලම්භන සැසි ගණන<br>• ක්‍රියාකාරී සැලැස්ම බිහි |

| | | | |
|---|---|---|---|
| | කාල වකවානු සහිත ක්‍රියාකාරි සැලැස්මක් සම්පාදනය කිරීම | සැලැස්මක් සැකසීම | වීම |
| 5.4.2. (iii) | සියලුම පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රවල පුස්තකාල කාර්ය මණ්ඩල අතර වෘත්තියවේදීත්වය සහ වෘත්තිය ආචාර ධර්ම වර්ධනය කිරීම සහ සේවාවල ගුණාත්මක බව වර්ධනය | • ආචාරධර්ම පද්ධතිය සකස් කර අවසන් කිරීම (මෙහි ප්‍රධාන කොටස දැනටමත් සම්පූර්ණ කර ඇත)<br>• වෘත්තියවේදීත්වය සහ ආචාරධර්ම පද්ධතිය පිළිබඳ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන/පුහුණු වැඩසටහන් පැවැත්වීම | • ආචාරධර්ම පද්ධතිය සම්පූර්ණ කිරීම<br>• ආචාරධර්ම පද්ධතිය පිළිබඳ පවත්වන ලද අඛණ්ඩ වෘත්තිය සංවර්ධන/පුහුණු වැඩසටහන් සංඛ්‍යාව |
| 5.4.2. (iv), (v) | ජාතික මට්ටමින් සහ ක්ෂේත්‍ර මට්ටමින් වෙනත් වගකිවයුතු අධිකාරීන්ගේ සහාය සෙවීම<br><br>වගකිව යුතු පුස්තකාල අධිකාරීන් හඳුනා ගැනීම සහ පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රය වර්ධනය සහ ශක්තිමත් කිරීමට ඔවුන් පෙළඹවීම | • ජාතික අධිකාරීන්ගෙන් සහාය සෙවීම (ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල විද්‍යා අධ්‍යයන අංශය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය)<br>• විවිධ අංශවල අධිකාරීන්ගෙන් සහාය සෙවීම (පළාත් සභා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන, අධ්‍යාපන ආදි අමාත්‍යාංශ) | • පුස්තකාල සේවාවේ යහපත සඳහා පවත්වන ලද ඒකාබද්ධ ව්‍යාපෘති සංඛ්‍යාව |
| 5.4.2. (vi) | අවශ්‍ය වෘත්තිය යෙදවුම් සැපයීමෙන් ඔවුන්ට සහාය වීම (අවශ්‍ය ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම, මනා ව්‍යවහාර සඳහා උදාහරණ සැපයීම, ප්‍රමිති සහ නියමු උපුටා දැක්වීම, ජාත්‍යන්තර උදාහරණ පෙන්වීම ආදී) සහ තත්ත්වයන් නිවැරදි කිරීමට පහසුකම් සැලසීම | • ගැටලු විසඳීමට අවශ්‍ය වෘත්තීය යෙදවුම් හඳුනා ගැනීම<br>• වෘත්තීය යෙදවුම් (ව්‍යවස්ථා, නියමු, ප්‍රමිති, ආඥා පනත් යනාදිය) සැකසීමට කම්ටු පත් කිරීම<br>• වෘත්තීය යෙදවුම් සැපයීම<br>• ප්‍රගතිය අධීක්ෂණය කිරීම | • වෙනත් සංවිධාන සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් සපයන ලද වෘත්තීය යෙදවුම් සංඛ්‍යාව<br>• වෙනත් සංවිධාන වෙනුවෙන් හඬ නැංවීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ඔවුන් සමග එක් වූ වාර ගණන |
| 5.4.2. (vii) | සියලු වාර්ගික | • රට තුළ අවම වශයෙන් | • රට තුළ අවම වශයෙන් |

| | | | |
|---|---|---|---|
| | කණ්ඩායම් මෙන්ම භූගෝලීය පිහිටීම, ආර්ථික සාධක නිසා අවාසිදායක තත්ත්වයට පත්වූවන්, වෙනත් හැකියා සහිත (differently able) පුද්ගලයන් සහ වෙනත් කුඩා කණ්ඩායම් ඇතුළු අවවරප්‍රසාදිත ප්‍රජාවන් ආවරණය කිරීමට විශේෂ අවධානය යොමු කිරීම | සංවර්ධිත සහ අවාසි සහගත කලාප, ප්‍රජාවන් සහ අංශ හඳුනා ගැනීම<br>• අනෙක් බලධාරීන්ගේ සහාය ඇතිව ඔවුන් සඳහා පුස්තකාල සංවර්ධන සැලැස්මක් සැකසීම | සංවර්ධිත සහ අවාසි සහගත කලාප, ප්‍රජාවන් සහ අංශ හඳුනා ගෙන තිබීම<br>• මෙම අංශ සඳහා සකසන ලද පුස්තකාල සංවර්ධන සැලසුම් සංඛ්‍යාව |
| 5.4.2. (viii) | අවශ්‍ය විට, පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රය වෙනුවෙන් අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA), අන්තර්ජාතික පාසල් පුස්තකාල සංගමය (IASL), යුනෙස්කෝ වැනි ආයතනවල සහාය ලබා ගැනීම | • විද්වත් කමිටුවල සහාය ඇතිව අන්තර්ජාතික සංසදවල උපකාර අවශ්‍ය ක්ෂේත්‍ර, ව්‍යාපෘති හඳුනා ගැනීම<br>• ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගැනීමට බුද්ධි කලම්භන සැසි පැවැත්වීම<br>• (විදේශ ආධාර ලබා ගැනීම) සාර්ථක වුවහොත්, ව්‍යාපෘතියට සහභාගී වීමට ඔවුන්ගේ කැමැත්ත තක්සේරු කිරීමට ප්‍රාදේශීය පුස්තකාල බලධාරීන් සමග සාකච්ඡා කිරීම<br>• අන්තර්ජාතික සංසදවල අදාළ නිලධාරීන් සමග සාකච්ඡා කිරීම සහ ව්‍යාපෘති යෝජනාවලිය සැකසීම | • සහාය අපේක්ෂාවෙන් අන්තර්ජාතික සංසද වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව |
| 5.4.2. (ix) | විශේෂඥ යෙදවුම් අවශ්‍ය වූ විට, විශේෂ කමිටු පත් කිරීම, සම්මන්ත්‍රණ සහ බුද්ධි කලම්බන සැසි ආදිය සංවිධානය කිරීම | • විශේෂඥ යෙදවුම් අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගැනීම<br>• මෙම අභිප්‍රාය සඳහා කමිටු පත් කිරීම, සම්මන්ත්‍රණ පැවැත්වීම ආදිය<br>• පුස්තකාල බලධාරීන්ට විශේෂඥ උපදෙස් සැපයීම | • විවිධ පුස්තකාල බලධාරීන්ගේ ඉල්ලීම මත ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ඔවුන්ට විශේෂඥ සහාය සැපයූ වාර ගණන |
| 5.4.2. (x), (xi) | ක්‍රියාමාර්ග දිරිමත් කිරීමට උද්දේශනය භාවිත කිරීම | • විවිධ පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍ර සඳහා සහාය වීමට හොඳින් | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් පවත්වන ලද උද්දේශන වැඩසටහන් සංඛ්‍යාව |

| | | | |
|---|---|---|---|
| | විශේෂඥ යෙදවුම් අවශ්‍ය වූ විට, විශේෂ කමිටු පත් කිරීම, සම්මන්ත්‍රණ සහ බුද්ධි කලම්බන සැසි ආදිය සංවිධානය කිරීම, ක්‍රියාමාර්ග දිරිමත් කිරීමට උද්දේශනය භාවිත කිරීම | සැලසුම් කරන ලද උද්දේශනය | |
| 5.4.2. (xii) | විවිධ පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රවල විශේෂ ගැටලු සාකච්ඡා කිරීම සඳහා අධ්‍යයන වර්ෂයේ මැද භාගයේ (නොවැම්බර් හෝ දෙසැම්බර්) එක් දින සම්මන්ත්‍රණයක් හඳුන්වා දීම. තම ගැටලු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් අවස්ථාවක්(වාර්ෂික මහා සභාවේ දී) නොලැබීම සාමාජිකත්වයේ චෝදනාවකි. සෑම පුස්තකාල අංශයක් සඳහා ම ප්‍රමාණවත් කාලයක් ලබා දීම සඳහා මෙම යෝජිත එක් දින සම්මන්ත්‍රණයේ දී සමාන්තර සැසි (දෙකක් හෝ තුනක්) සූදානම් කිරීම නිර්දේශ කෙරේ. | • විවිධ පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රවල ගැටලු පමණක් සාකච්ඡා කිරීමට අධ්‍යයන වර්ෂය තුළ දී රැස්වීමක් සූදානම් කිරීම<br>• හැකිතාක් දුරට සාමාජිකයන්ගේ ගැටලු හඳුනා ගන්නා මෙන් විද්වත් කමිටුවලින් ඉල්ලීම<br>• සෑම පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රයකටම උපරිම කාලයක් ලැබෙන පරිදි සමාන්තර සැසි සූදානම් කිරීම<br>• මෙම රැස්වීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ වෙනත් අදාළ අමාත්‍යාංශවලට සහ බලධාරීන්ට ආරාධනා කිරීම | • සම්මන්ත්‍රණය පැවැත්වීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් මතු කරන ලද ගැටලු සහ ලැබුණු ප්‍රතිචාර සංඛ්‍යාව<br>• සාමාජිකයන්ගේ තෘප්තිමත් බව<br>• මෙම කාර්යයේ පසු විපරම සඳහා යාන්ත්‍රණයක් සැකසීම |

**6.5.** අධ්‍යාපනික වැඩසටහන් වැඩිදියුණු කිරීම

| උපාය මාර්ග අංකය | උපායමාර්ගය | ක්‍රියාමාර්ග | කාර්යසාධන මිනුම |
|---|---|---|---|
| 5.5.2. (i) | පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ අනාගතය පිළිබඳ නිර්දේශ ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කිරීම සහ තීරණයක් ගැනීම සඳහා අදාළ නිර්දේශ වාර්ෂික මහා | • විශේෂඥ කමිටුවක් පත් කිරීම<br>• පාලක මණ්ඩලය මගින් නිර්දේශ සලකා බැලීම<br>• අනුමැතිය සඳහා ඒවා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම | • කාලරාමුවක් සඳහා අදාළ නිර්දේශ කඩිනම් කිරීම<br>• සෑම කාල පරාසයක් සඳහාම සැලසුම් කරන ලද ප්‍රතිඵල මැනීම |

| | | | |
|---|---|---|---|
| | සහා රැස්වීමට ඉදිරිපත් කිරීම. කෙසේ වෙතත්, පහත සඳහන් සාධකය කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය. එනම්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සඳහා ප්‍රධාන ආදායම් මාර්ගය මෙම ඩිප්ලෝමා පාඨමාලාව නිසා එය මෑත අනාගතයේ දී නොනැවත්වීම සහ අවම වශයෙන් අඛණ්ඩ වෘත්තිය සංවර්ධන ව්‍යාපෘතීන් හොඳින් ස්ථාපිත වන තුරු එය පවත්වා ගෙන යාමය. ඒ අනුව පුස්තකාල විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ ගුණාත්මක බව වර්ධනය කිරීම. | | |
| 5.5.2. (ii) | ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා සහ සංවර්ධනයන් සමග යාවත්කාලීන වන පරිදි ඩිප්ලෝමා පාඨමාලාවේ විෂයමාලා නිරන්තරයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ උසස් කිරීම | • ප්‍රතිපත්ති ලේඛනයේ දී හඳුනා ගන්නා ලද ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්ෂේත්‍ර පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා විෂයමාලාවේ සංශෝධනයට ඇතුළත් කිරීම | • හඳුනා ගන්නා ලද කල්පිත ප්‍රතිශතයට ගලපමින් පාඨමාලා ඒකක, ආචාර්ය මණ්ඩලය සහ ප්‍රායෝගික සැසි ඇතුළත් කර ඇත්දැයි සහතික වීම |
| 5.5.2. (iii) | පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලාවල ඉගැන්වීම්, ඉගෙනුම් සහ ඇගයීම් ව්‍යුහ හඳුනා ගැනීම | • ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට අනුව පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ක්‍රෙඩිට් 60 නියම කිරිම | • පුස්තකාල හා විඥාපන විද්‍යා උසස් ඩිප්ලෝමාව පිරිනැමීම සඳහා ක්‍රෙඩිට් 60 සම්පූර්ණ කර ඇති බවට සහතික කිරීම |
| 5.5.2. (iv) | පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ ඉගෙනුම් ඵල සැලසුම් කිරීම | • සෑම මට්ටමකම සහ පාඨමාලා ඒකකයකම ඉගෙනුම් ඵල පිළිබඳ ප්‍රවර්ග 12 ඇතුළත් කිරීම | • සෑම මට්ටමකදීම කරන ලද තක්සේරුව හරහා ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර හතර මැනීම<br>උදා: පැවරුම්, ව්‍යාපෘති, විභාග සහ ප්‍රායෝගික පරීක්ෂණ |

| | | | |
|---|---|---|---|
| 5.5.2. (v) | පංති, විභාග සඳහා නිශ්චිත කාල සටහනක් තිබීම සහ පාඨමාලාව වෙත වඩා වෘත්තියවේදීත්වයක් හඳුන්වා දීම | • පංති කාලසටහනක්, පැවරුම් භාර දෙන දින, ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වෙන දින, ලකුණු ලබා දෙන සහ ප්‍රතිඵල නිකුත් කරන දින නිශ්චිත කාලරමුවකට අනුව සිදු කිරීම | • පංති සහ විභාග පිළිබඳ නිශ්චිත කාලසටහන පැවතීම<br>• පංති, විභාග පැවැත්වීමේ අධීක්ෂණ වාර්තා<br>• ආචාර්ය මණ්ඩලය මෙන්ම සිසුන් විසින් ද මෙම නිශ්චිත දින පිළිබඳ පාලක මණ්ඩලයට වාර්තා කිරීම<br>• සැලසුම් කරන ලද දිනට ප්‍රතිඵල නිකුත් කිරීම පිළිබඳ පාලක මණ්ඩලයට වාර්තා කිරීම |
| 5.5.2. (vi) | නිශ්චිත ගොඩනැගිල්ලක්, ගුණාත්මක තොරතුරු තාක්ෂණික විද්‍යාගාර වැනි පාඨමාලාව සඳහා අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම සහ විධිමත් කිරීම | • පංති පැවැත්වීම සඳහා පහසුකම් සහිත පරිගණක විද්‍යාගාර සහිත මනා පරිශ්‍රයක් සොයා ගැනීම<br>• අත්‍යවශ්‍ය මෘදුකාංග සහ දත්ත පදනම් ආදිය මිල දී ගැනීම හෝ වෙනත් ආකාරයකට ලබා ගැනීම | • පංති පැවැත්වීම සඳහා පරිශ්‍රයක් කුලියට/මිල දී ගැනීම පිළිබඳ අධීක්ෂණය හා පාලක මණ්ඩලයට වාර්තා කිරීම<br>• අවශ්‍ය උපකරණ, මෘදුකාංග ආදිය ප්‍රසම්පාදනය<br>• පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල සිසුන් සඳහා ගුණාත්මක බවින් යුත් පරිශ්‍රයක දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණු පහසුකම් සැපයීම<br>• සිසුන්ගේ සහ ආචාර්ය මණ්ඩලයේ ඇගයීම් වාර්තා |
| 5.5.2. (vii) | ගුරු පුහුණු සහ වාරික ඇගයීම් මගින් ඉගැන්වීම් කාර්ය මණ්ඩලයේ ගුණාත්මක බව දියුණු කිරීම | • ආචාර්ය මණ්ඩලය සඳහා විශිෂ්ට ගුරුවරුන් යොදා ගැනීම<br>• නිරන්තර ගුරු පුහුණුව මගින් ආචාර්ය මණ්ඩලයේ ගුණාත්මක බව වර්ධනය කිරීම<br>• ඉගැන්වීම් පිළිබඳ අනිවාර්ය වාරික ඇගයීම | • ගුරු පුහුණු වැඩසටහන් සඳහා ඇති පැමිණීමේ ලේඛන<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ දේශන පැවැත්වීම වෙනුවෙන් ගුරුවරුන් සඳහා නිකුත් කරන සහතික<br>• ගුරුවරුන්ගේ කාර්ය |

| | | | |
|---|---|---|---|
| | | | සාධනය පිළිබඳ සිසුන්ගේ ප්‍රතිපෝෂණය |
| 5.5.2. (viii) | පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලාව සඳහා පිළිගැනීම් සහතිකය ලබා ගැනීම | • තත්ත්ව සහතික ඉල්ලුම් කිරීම සඳහා තත්ත්ව පාලන ආයතනයක උපදෙස් ගැනීම<br>• පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමාව අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් සහ තත්ත්ව පාලන යාන්ත්‍රණයක් ඇරඹීම | • පිළිගැනීම ලබා ගැනීම<br>• අධීක්ෂණය හා තත්ත්ව පාලන යාන්ත්‍රණය පත් කිරීම |
| 5.5.2. (ix) | අඛණ්ඩ වෘත්තිය සංවර්ධන අවශ්‍යතා තක්සේරුවක් සිදු කිරීම | • අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා තක්සේරුව සඳහා කමිටුවක් පත් කිරීම<br>• ඇමුණුම 1 හි ඉදිරිපත් කර ඇති නිර්ණායක හතර පිළිබඳ බුද්ධිකලම්බන සැසි පැවැත්වීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විද්වත් කමිටුවල උපදෙස් ගැනීම | • හඳුනා ගන්නා ලද ක්ෂේත්‍ර නවය සමග අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල වාර්ෂික දින දර්ශන සැලැස්ම |
| 5.5.2. (x) | සෑම විද්වත් කමිටුවකම උපදෙස් සහිතව උසස්, ගුණාත්මක බවින් යුත් අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහනක් සංවර්ධනය කිරීම | • ප්‍රමුඛත්වය දිය යුතු අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීමට විද්වත් කමිටු මෙහෙයවීම<br>• බුද්ධිකලම්බන සැසි<br>• හරයාත්මක අගයෙන් යුත් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහනක් සකස් කිරීම | • විද්වත් කමිටු මගින් සම්පාදනය කරන ලද අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල ප්‍රමුඛතා ලැයිස්තුව<br>• බුද්ධිකලම්බන සැසි ගණන<br>• අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් පිළිබඳ ඇගයීම් වාර්තා |
| 5.5.2. (xi) | අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන් පිළිබඳ දින දර්ශනයක් කලින් ප්‍රකාශයට පත් කිරීම හා ඒවා භාෂා තුනෙන් ම පැවැත්වීම. එමෙන් ම ඒවා කොළඹට අමතරව පළාත් ප්‍රධාන නගරවල පැවැත්වීම | • අඛණ්ඩ වෘත්තීය සංවර්ධන දිනදර්ශනය කලින්ම ප්‍රකාශයට පත් කිරීම<br>• අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් භාෂා තුනෙන්ම පැවැත්වීම<br>• වැඩසටහන් විමධ්‍යගතකරණය කිරීම | • අධ්‍යයන වර්ෂය ආරම්භයේ දීම අඛණ්ඩ වෘත්තීය සංවර්ධන දිනදර්ශනය පැවැතීම<br>• භාෂා තුනෙන්ම පවත්වන ලද අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ගණන<br>• පළාත් මට්ටමින් පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව |
| 5.5.2. (xii) | මාර්ගගත අඛණ්ඩ වෘත්තිය සංවර්ධන | • මෙම විෂය අධ්‍යයනය කිරීමට කමිටුවක් පත් කිරීම | • කමිටු වාර්තාව<br>• මාර්ගගත අඛණ්ඩ |

| | | | |
|---|---|---|---|
| | වැඩසටහන් හඳුන්වා දීම | සහ නිර්දේශ සමග වාර්තාව ඉදිරිපත් කිරීම<br>• සුදුසු මාර්ගගත අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම<br>• පාඨමාලා සමායෝජකයන් සහ ආචාර්ය මණ්ඩලය හඳුනා ගැනීම<br>• මාර්ගගත ඉගැන්වීම් ද්‍රව්‍ය සැකසීම<br>• මාර්ගගත අඛණ්ඩ වෘත්තීය සංවර්ධන දිනදර්ශනයක් සැකසීම<br>• මාර්ගගත අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම | වෘත්තීය සංවර්ධන දිනදර්ශනය<br>• මාර්ගගත අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව<br>• මාර්ගගත අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල ඇගයීම් වාර්තා |
| 5.5.2. (xiii) | වෘත්තිය ගැටලු පිළිබඳ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කැලණිය පුස්තකාල විද්‍යා අංශය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, ජාතික විද්‍යා පදනම වැනි ආයතන සමග අඛණ්ඩ සංවාදයක් පවත්වා ගෙන යාම සහ සියලු පාර්ශ්වයන්ගේ යහපත සඳහා ඒවායේ සහයෝගය ලබා ගැනීම | • ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, ජාතික විද්‍යා පදනම, පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය හා කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යනාංශය විසින් පවත්වන ලද අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ලැයිස්තුගත කිරීම<br>• මෙම විෂය පිළිබඳ සිසුන් සමග වෘත්තීය සංවාදයක් ආරම්භ කිරීම<br>• ආයතන අතර සහයෝගීතාව වර්ධනය කිරීම | • ක්ෂේත්‍රයේ අනෙක් ආයතන සමග පවත්වන ලද සාකච්ඡා සංඛ්‍යාව<br>• පවත්වන ලද ඒකාබද්ධ වැඩසටහන් සංඛ්‍යාව |
| 5.5.2. (xiv) | රැකියා වෙළඳපොළ සඳහා ගැලපෙන පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලා ස්ථාපිත කිරීම | • වෙළඳපොල මත පදනම් වූ පුස්තකාල හා තොරතුරු විද්‍යා පාඨමාලා හඳුනා ගැනීමට පර්යේෂණයක් පැවැත්වීම<br>• ඒවා හඳුන්වා දීම | • පර්යේෂණ වාර්තාව සහ ප්‍රතිඵල<br>• හඳුන්වා දෙන ලද වෙළඳපොල මත පදනම් වූ පාඨමාලා ගණන |
| 5.5.2. (xv) | ගුණාත්මක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණුව සඳහා | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අධ්‍යාපන පාඨමාලා පවත්වන කෙළඹ, | • හඳුනා ගන්නා ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ |

| | | | |
|---|---|---|---|
| | ප්‍රධාන තොරතුරු තාක්ෂණ පීඨයක් සමග සම්බන්ධ වීම | මහනුවර, ගාල්ල, යාපනය සහ වෙනත් ස්ථානවල ගුණාත්මක තොරතුරු තාක්ෂණ පහසුකම් හඳුනා ගැනීම<br>• ස්වකීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මොඩියුල සම්පූර්ණ කිරීමට ගෙවීම් පදනම මත ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සිසුන්ට මෙම පහසුකම් සුරක්ෂිත කිරීම | පහසුකම්<br>• අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් ගණන |
| 5.5.2. (xvi) | පුස්තකාල හා තොරතුරු විද්‍යා ඩිප්ලෝමා වැඩසටහනෙහි ආචාර්ය මණ්ඩලවල සහ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන්වල සම්පත් පුද්ගලයන්ගේ දත්ත පදනමක් සංවර්ධනය කිරීම සහ එය නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම | • ආචාර්ය මණ්ඩලය පිළිබඳ දත්ත පදනමක් සැකසීම | • පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සහ අඛණ්ඩ වෘත්තීය වැඩසටහන්වල ආචාර්ය මණ්ඩලය පිළිබඳ දත්ත පදනම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වෙබ් අඩවියට දත්ත පදනම ඇතුළත් කිරීම |
| 5.5.2. (xvii) | පුස්තකාල හා තොරතුරු විද්‍යා ඩිප්ලෝමාව සහ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන් සඳහා පූර්ණ කාලීන සමායෝජකයෙකු පත් කිරීමේ හැකියාව සොයා බැලීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සඳහා ප්‍රධාන විධායක නිලධාරියෙකු/පුහුණු කළමනාකරුවෙකු පත් කිරීම<br>• එය අසාර්ථක වුවහොත් අධ්‍යාපන නිලධාරීට සහාය වීමට පූර්ණ කාලීන අධ්‍යයන සම්බන්ධීකරකයෙකු පත් කිරීම | • ප්‍රධාන විධායක නිලධාරී/ පුහුණු කළමනාකරුගේ පත්වීම<br>• නැතහොත් පූර්ණ කාලීන අධ්‍යයන සම්බන්ධීකාරකයෙකුගේ පත්වීම |
| 5.5.2. (xviii) | ඉංග්‍රීසි භාෂාමය පුස්තකාල හා තොරතුරු විද්‍යා කියවීම් ද්‍රව්‍ය සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීමේ වැඩසටහනක් ස්ථාපිත කිරීම | • කමිටුවක් පත් කිරීම සහ ප්‍රමුඛතා නිර්දේශ සමග මෙම විෂය පිළිබඳ වාර්තාවක් ලබා ගැනීම<br>• වෘත්තීය පරිවර්තකයන් හඳුනා ගැනීම<br>• අනුග්‍රහය ලබා ගැනීමට උත්සාහ කිරීම<br>• වාර්ෂික ඉලක්කයක් ලබා | • ප්‍රකාශයට පත් කරන ලද සිංහල සහ දෙමළ පරිවර්තන සංඛ්‍යාව |

| | | | |
|---|---|---|---|
| | | දීම | |
| 5.5.2. (xix) | කියවීම් ද්‍රව්‍ය නිර්මාණය සඳහා ජොෂ්ඨ වෘත්තියවේදීන් දිරිමත් කිරීම සහ ඒවා පළ කිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හරහා සහාය වීම | • දේශීය භාෂාවලින් පුස්තකාල හා විඥාපන විද්‍යා කියවීම් ද්‍රව්‍ය රචනා කිරීම ප්‍රවර්ධනය කිරීම<br>• ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හරහා ඒවා පළ කිරීමට ආධාර කිරීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ම ප්‍රකාශන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේ හැකියාව සොයා බැලීම | • සිංහල හා දෙමළ භාෂාවලින් රචිත පුස්තකාල හා විඥාපන විද්‍යා නව ප්‍රකාශන සංඛ්‍යාව |
| 5.5.2. (xx) | විශිෂ්ටතම අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන, විශිෂ්ටතම පුස්තකාල විද්‍යා දේශීය භාෂාමය ප්‍රකාශනය, විශිෂ්ටතම පරිවර්තනය යනාදිය සඳහා වාර්ෂිකව සම්මාන පිරිනැමීම | • විශිෂ්ටතම අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහනට, විශිෂ්ටතම පුස්තකාල හා විඥාපන විද්‍යා දේශීය භාෂාමය ප්‍රකාශනයට හා විශිෂ්ටතම පරිවර්තනයට වාර්ෂික සම්මාන පිරිනැමීම ඇරඹීම<br>• මෙම ව්‍යාපෘතියට අනුග්‍රාහකයන් සොයා ගැනීම | • වාර්ෂික සම්මාන සංඛ්‍යාව |

## 6.6. සාමාජිකත්වය වැඩිදියුණු කිරීම

| උපාය මාර්ග අංකය | උපායමාර්ගය | ක්‍රියාමාර්ග | කාර්යසාධන මිනුම |
|---|---|---|---|
| 5.6.2. (i) | හොඳින් සැලසුම් කළ සාමාජිකත්වය වර්ධනය කිරීමේ වැඩසටහනක් දියත් කිරීම | • සාමාජිකත්ව වර්ධන මෙහෙයුමට නායකත්වය දීමට කමිටුවක් හෝ කාර්යසාධන බලකායක් පත් කිරීම<br>• මන්දගාමී සාමාජිකත්ව වර්ධනයට ප්‍රධාන හේතු හඳුනා ගැනීමට විද්වත් කමිටුවල සහාය ඇතිව බුද්ධිකලම්බන සැසි කීපයක් පැවැත්වීම<br>• ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම<br>• විද්වත් කමිටුවල සහාය | • කමිටුවේ හෝ කාර්ය සාධන බලකායේ පත්වීම<br>• පවත්වන ලද බුද්ධිකලම්බන සැසි ගණන<br>• ක්‍රියාකාරී සැලැස්ම<br>• මෙම ව්‍යාපෘතිය හරහා බඳවා ගන්නා ලද නව සාමාජිකයන් සංඛ්‍යාව |

| | | | |
|---|---|---|---|
| | | ඇතිව ගුණාත්මක සාමාජික වර්ධන මෙහෙයුමක් දියත් කිරීම | |
| 5.6.2. (ii) | අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ (IFLA) නියමු මාලා සහ වෙනත් රටවල පුස්තකාල සංගම් පවත්වා ගෙන යන ව්‍යවහාරයන් සලකා බලමින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ආයතනික නොවන සාමාජිකත්ව ප්‍රවර්ගය ව්‍යාප්ත කිරීම පිළිබඳ අධ්‍යයනය කර වාර්තාවක් සම්පාදනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම සහ එම වාර්තාව සලකා බැලීම සහ අනුමැතිය සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ආයතනික නොවන සාමාජිකත්වය ව්‍යාප්ත කිරීම පිළිබඳ අධ්‍යයනය කර වාර්තා කිරීමට කමිටුවක් පත් කිරීම<br>• කමිටුවට සහාය වීමට බුද්ධිකලම්බන සැසි කීපයක් සූදානම් කිරීම<br>• විද්වත් කමිටුවල අදහස් ලබා ගැනීම<br>• තම අදහස් ඉදිරිපත් කිරීමට සාමාජිකයන්ට අවස්ථාව සැපයීම<br>• IFLA නියමු සහ වෙනත් පුස්තකාල සංගම්වල ව්‍යවහාරයන් අධ්‍යයනය කිරීම<br>• පාලක මණ්ඩලයේ දී කමිටු නිර්දේශ සලකා බැලීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වාර්ෂික සහා සභා රැස්වීමට එම නිර්දේශ ඉදිරිපත් කිරීම | • කමිටුවේ පත්වීම<br>• පවත්වන ලද බුද්ධිකලම්බන සැසි ගණන<br>• කමිටු වාර්තාව<br>• ආයතනික නොවන සාමාජිකත්ව ප්‍රවර්ගය පුළුල් වීම |
| 5.6.2. (iii) | සාමාජිකත්ව අයදුම්පත්‍රය සහ එය පිළිගැනීමේ ක්‍රියාපටිපාටිය සරල කිරීම | • සාමාජිකත්ව අයදුම් පත්‍රය සහ පිළිගැනීමේ ක්‍රියාපටිපාටිය වැඩිදියුණු සහ සරල කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කිරීම<br>• වෙනත් පුස්තකාල සංගම් සහ වෙනත් විද්වත් වෘත්තික සංවිධානවල විශිෂ්ට ව්‍යවහාරයන් අධ්‍යයනය කිරීම<br>• සරල, ඵලදායී ක්‍රියාපටිපාටියක් අනුගත කිරීම | • කමිටුව පත්වීම<br>• වාර්තාව<br>• සාමාජිකත්ව අයදුම්පත්‍රය, පිළිගැනීම සහ යළි අලුත් කිරීම සඳහා නව ක්‍රියාපටිපාටිය අනුගත වීම |
| 5.6.2. (iv) | පුස්තකාල හා විඥාපන විද්‍යා සුදුසුකම් සහිත ශ්‍රී | • විද්වත් කමිටුවල සහාය ඇතිව ශ්‍රී ලංකා පුස්තකාල | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් |

| | | | |
|---|---|---|---|
| | ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය නොලත් පුස්තකාලයාධිපතීන්/පුස්තකාල කාර්ය මණ්ඩල සාමාජිකයන් හඳුනා ගැනීම සහ විද්වත් කමිටුවල සහාය ඇතිව ඔවුන් අතර සාමාජිකත්වය ප්‍රවර්ධනය සඳහා විශේෂ ඉලක්කගත වැඩසටහනක් දියත් කිරීම | සංගමයේ සාමාජිකයන් නොවන පුස්තකාල හා තොරතුරු විද්‍යා වෘත්තීයවේදීන් හඳුනා ගැනීම<br>• දත්ත පදනමක් සැකසීම<br>• බුද්ධිකලම්බන සැසි කීපයක් පැවැත්වීම<br>• ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජික නොවන්නන් අතර ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ප්‍රවර්ධනය කිරීමට වැඩසටහනක් දියත් කිරීම | නොවන පුස්තකාල හා තොරතුරු විද්‍යා වෘත්තිකයන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පදනම<br>• පවත්වන ලද බුද්ධිකලම්බන සැසි ගණන<br>• ක්‍රියාකාරී සැලැස්ම<br>• ඉහත කණ්ඩායමෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය ලබා ගත් සංඛ්‍යාව |
| 5.6.2. (v) | සාමාජිකයන් නොවන වෘත්තියවේදීන් ඉලක්ක කර ගත්, අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහනක් නොමිලේ වාර්ෂිකව සංවිධානය කිරීම සහ එම අවස්ථාව සංගමයේ සාමාජිකත්ව ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීම | • ඉලක්ක කණ්ඩායම සඳහා එක් දින අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහනක් සවිධානය කිරීම<br>• ආකර්ශනීය තේමාවක් සහ ගුණාත්මක සම්පත් පුද්ගලයන් තෝරා ගැනීම<br>• වැඩසටහන පිළිබඳ විස්තර යවා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් නොවන එම පුස්තකාල හා තොරතුරු විද්‍යා වෘත්තිකයන්ට ආරාධනා කිරීම<br>• ඉහළ ඉල්ලුමක් පවතී නම් සමාන්තර සැසි දෙකක් පැවැත්වීම<br>• ශ්‍රව්‍ය දෘෂ්‍ය ඉදිරිපත් කිරීම් භාවිත කරමින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ක්‍රියාකාරකම් සහ භූමිකාව පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමට පැය භාගයක් පමණ යොදා ගැනීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විධායක මණ්ඩලය සහ විද්වත් | • අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහනෙහි සාර්ථකත්වය<br>උදා: ඉලක්ක කණ්ඩායමෙන් සහභාගී වූ සංඛ්‍යාව, ඇගයීම් වාර්තාවලට අනුව වැඩසටහනෙහි ගුණාත්මක බව<br>• මෙම වැඩසටහනෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට සම්බන්ධ වූ නව සාමාජිකයන් ගණන |

| | | | |
|---|---|---|---|
| | | කමිටුවල කැඳවුම්කරුවන් හඳුන්වා දීම<br>● වැඩසටහනෙහි ලිපි ගොනුවට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අයදුම් පත්‍රය සහ ප්‍රචාරක පත්‍රිකා ඇතුළත් කිරීම<br>● මෙම අවස්ථාවට පසු මේ ගැන පසුවිපරම් කිරීමට විද්වත් කමිටුවල කැඳවුම්කරුවන්ට දැනුම් දීම | |
| 5.6.2. (vi) | සංගමයට සැලකිය යුතු සාමාජිකයන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ට පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික සම්මන්ත්‍රණය සඳහා හෝ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන වැඩසටහන් කීපයක් සඳහා නොමිලේ ලියාපදිංචිය, ඔවුන්ගේ දායකත්වය මහා සභා රැස්වීමේ දී පිළිගැනීම යනාදී දිරිමත් කිරීම් සිදු කිරීම | ● ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට නව සාමාජිකයන් කැටුව එන සාමාජිකයන් සඳහා ලබාදෙන සුදුසු පාරිතෝෂික කට්ටලයක් පිළිබඳ අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කිරීම<br>● ආකර්ශනීය පාරිතෝෂික කටට්ලයක් ඉදිරිපත් කිරීම<br>● පුවත් පත්‍රිකාව ආදිය මගින් ප්‍රචාරය ලබා දීම<br>● ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ගේ සහාය ලබා ගැනීම<br>● විද්වත් කමිටුවලට, පාලක මණ්ඩල සාමාජිකයන්ට වගකීම් පැවරීම<br>● තත්ත්ව ජයග්‍රහණ වාර්ෂිකව හඳුනා ගැනීම | ● කමිටුව පත් වීම සහ එහි නිර්දේශ<br>● නව සාමාජිකයන් බඳවා ගැනීම සඳහා වැඩසටහනට සම්බන්ධ වූ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් ගණන<br>● බඳවා ගත් නව සාමාජිකයන් සංඛ්‍යාව |
| 5.6.2. (vii) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් නොවන්නන්ට එහි සාමාජිකත්වය ලබා ගැනීමට පොළඹවන්නක් ලෙස වරලත් පුස්තකාලයාධිපතීන්ගේ/ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ආයතනික සාමාජිකයන්ගේ විස්තර සපයන වාර්ෂික පුස්තකාල ග්‍රන්ථයක් | ● ව්‍යාපෘතිය සඳහා කමිටුවක් හෝ කාර්ය සාධන බලකායක් පත් කිරීම<br>● වියදම් ඇස්තමේන්තු සමග ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම<br>● ආකෘතිය සහ වෙනත් විස්තර තීරණය කිරීමට බුද්ධිකලම්බන සැසි පැවැත්වීම<br>● කෙටුම්පත සැකසීම<br>● ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සංගමයේ වාර්ෂික | ● ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වාර්ෂික ග්‍රන්ථය පළවීම |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශයට පත් කිරීම | ග්‍රන්ථය පළ කිරීම | |
| 5.6.2. (viii) | සාමාජිකත්වය ලබා ගැනීම සහ අලුත් කිරීම සඳහා වෙබ් පෝටලයක් හඳුන්වා දීම | • සැලැස්මක් සැකසීම සඳහා තොරතුරු තාක්ෂණ කමිටුවට ආරාධනා කිරීම<br>• බුද්ධිකලම්බන සැසි<br>• අනෙක් පුස්තකාල සංගම්වල සහ විද්වත් සංසදවල සමාන වෙබ් පෝටල අධ්‍යයනය කිරීම<br>• සාමාජිකත්ව කටයුතු සඳහා වෙබ් පෝටලයක් නිර්මාණය කිරීම | • සාමාජිකත්ව අයදුම්පත් සහ එය අලුත් කිරීම සඳහා වෙබ් පෝටලය<br>• සාමාජිකත්ව අයදුම්පත් සහ ඒවා අලුත් කිරීම සඳහා සකසන ලද ඉක්මන් ක්‍රියාපටිපාටිය |
| 5.6.2. (ix) | ගුණාත්මක අගයෙන් යුත් ප්‍රචාරණ ද්‍රව්‍ය සහිත ආකර්ශනීය, ඵලදායී ප්‍රවර්ධන වැඩසටහනක් සහ ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම | • ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම<br>• මෙම කාර්ය සඳහා නිපුණත්වය සහිත වෘත්තිකයන්ගේ හෝ සාමාජිකයන්ගේ සහාය ඇතිව ගුණාත්මක ප්‍රචාරක ද්‍රව්‍ය සැකසීම<br>• ප්‍රචාරක ද්‍රව්‍ය නිමවීම සඳහා අනුග්‍රාහකත්වයක් ලබා ගැනීමට ප්‍රයත්න දැරීම<br>• ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම | • අදාළ ක්‍රියාකාරී සැලැස්ම<br>• සකසන ලද ප්‍රචාරක ද්‍රව්‍ය සංඛ්‍යාව<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පිළිබඳ රූපවාහිනියේ හෝ ගුවන් විදුලියේ කරන ලද සාකච්ඡා ගණන<br>• ජාතික පුවත්පත්, සඟරා ආදියෙහි ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පිළිබඳ පළ වූ ලිපි ගණන<br>• තෝරාගත් කණ්ඩායම් සඳහා යවන ලද ප්‍රචාරක පත්‍රිකා, පුස්තිකා ගණන<br>• වැදගත් සංසදයන්හි දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පිළිබඳ දර්ශනය කරන ලද වීඩියෝ/ස්ලයිඩ් දර්ශන සංඛ්‍යාව<br>• ජාතික ගැටලුවල දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමය රඟ දැක් වූ භූමිකාවන්ගේ පවාර ගණන<br>උදා: තොරතුරු නිදහස, සාක්ෂරතාව |
| 5.6.2. (x) | පුස්තකාල හා විඥාපන විද්‍යා ප්‍රකාශනවලට වට්ටම් ලබා දීම, පුස්තකාල තොරතුරු ක්ෂේත්‍රයේ සම්මන්ත්‍රණ, සමුළුවලට වට්ටම් ලබා දීම, විදේශීය සමුළු සහ | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමය හරහා එහි සාමාජිකත්වයට විශේෂ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් සඳහා විශේෂ වාසි ලබා | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය සඳහා වූ ප්‍රතිලාභ යෝජනා ක්‍රම සංඛ්‍යාව |

| | | | |
|---|---|---|---|
| | සම්මන්ත්‍රණවලට සහභාගී වීමට සහාය වීම, ප්‍රධාන පුස්තකාල සඳහා නොමිලේ සාමාජිකත්වය සැපයීම වැනි විශේෂ ප්‍රතිලාභ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය සඳහා ලබා දීම | ගැනීමට අනෙක් ප්‍රධාන පුස්තකාල හා තොරතුරු සේවා සංවිධාන (ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ජාතික පුස්තකාලය, ජාතික විද්‍යා පදනම, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, ප්‍රකාශකයන් සහ පොත් වෙළෙන්දන්) සමග සාකච්ඡා කිරීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් දැනුවත් කිරීම | |
| 5.6.2. (xi) | පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ රැකියා සඳහා පවත්වන සම්මුඛ පරීක්ෂණවල දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය සහ එහි තනතුරක් දැරීම අමතර සුදුසුකමක් ලෙස සැලකීමට බලධාරීන් පෙළඹවීම | • යෝජනාවලිය අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම සහ එහි ශක්‍යතාව සහ එය ක්‍රියාත්මක කිරීමේ මාදිලිය පිළිබඳ බලධාරීන්ගෙන් උපදෙස් ගැනීම<br>• අදාළ බලධාරීන්ට දැනුම් දීම | • රැකියා සම්මුඛ පරීක්ෂණවල දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ට අතිරේක ලකුණු ලැබීම පිළිබඳ සාක්ෂි |
| 5.6.2. (xii) | සේවයේ නියුක්ත සියලු පුස්තකාල වෘත්තිකයන්ට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අනිවාර්ය සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීම | • මෙම ප්‍රතිපත්තිය අනුගමනය කරන වෙනත් පුස්තකාල සංගම් සහ සමාන වෘත්තියවේදී සංගම්වල ලැයිස්තුවක් සැකසීම<br>• යෝජනාවලිය අධ්‍යයනය කර නිර්දේශ සැපයීමට කමිටුවක් පත් කිරීම | • සේවයේ නියුතු සියලුම ශ්‍රී ලාංකීය වෘත්තීය පුස්තකාලයාධිපතීන්ට පුස්තකාල සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමේ ප්‍රතිපත්තිය අනුගත කිරීම |
| 5.6.2. (xiii) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පවත්නා සාධනය ඉහළ නැංවීම සහ එය ආකර්ශනීය, ගුණාත්මක අගයෙන් යුත් සංගමයක් බවට පත් කිරීම | • ප්‍රධාන නිලධාරීන්, පාලක මණ්ඩලය, විධායක කමිටුව, විද්වත් කමිටු, ශ්‍රී ලංකා පුස්තකාල සංගම් කාර්යාලය, ප්‍රධාන ව්‍යාපෘති ස්වකීය ක්‍රියාකාරකම්වල ප්‍රමිති ඉහළ නැංවීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සමස්ත කාර්ය සාධනය ඉහළ නැංවීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ජාතික සහ ජාත්‍යන්තර පෙනුම පිළිබඳ සාක්ෂි<br>• උසස් ගුණාත්මක බවින් යුත් ව්‍යාපෘති සහ ප්‍රකාශන<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පැමිණිලි සංඛ්‍යාව අඩුවීම |

| | | | |
|---|---|---|---|
| 5.6.2. (xiv) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ට උසස් අධ්‍යාපන හා පශ්චාත් උපාධි අවස්ථාවලට පහසුකම් සැලසීම | • ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සමග කරනු ලබන වත්මන් ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සහ සාමාජිකයන්ට විශ්වවිද්‍යාල උපාධියක් ලබා ගැනීමට අවස්ථාව ලබා දීම<br>• ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය මගින් සපයන ලද පශ්චාත් උපාධි පහසුකම් භාවිතයට සාමාජිකයන් දිරිමත් කිරීම<br>• අනෙක් උසස් අධ්‍යාපන ආයතනවල ඇති මීට සමාන අවස්ථා ගවේෂණය සහ ප්‍රවර්ධනය කිරීම | • ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ උපාධිය සම්පූර්ණ කරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් ගණන<br>• ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලා සම්පූර්ණ කරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් ගණන<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් සඳහා වෙනත් උසස් අධ්‍යාපන ආයතන මගින් සපයන ලද නව අවස්ථා ගණන |

**6.7. සාමාජිකයන්ගේ දුක්ගැනවිලි සහ වෘත්තීය සංවර්ධනය සඳහා සහාය වීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම/හඳුන්වා දීම**

| උපාය මාර්ග අංකය | උපායමාර්ගය | ක්‍රියාමාර්ග | කාර්යසාධන මිනුම |
|---|---|---|---|
| 5.7.2. (i) | සාමාජිකයන්ගේ දුක් ගැනවිලි සමග වඩාත් ඵලදායීව කටයුතු කිරීමට වත්මන් දුක් ගැනවිලි කමිටුව වර්ධනය කිරීම හෝ නව යාන්ත්‍රණයක් පිහිටුවීම | • මෙය අධ්‍යයනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කිරීම<br>• පාලක මණ්ඩලය එම නිර්දේශ සලකා බැලීම සහ අනුමත කිරීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ගේ දුක් ගැනවිලි සඳහා ගුණාත්මක සහ ඵලදායී යාන්ත්‍රණයක් පැවතීම |
| 5.7.2. (ii) | නියත පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයකට අදාළ ගැටලු පිළිබඳව අදාළ විද්වත් කමිටුව සමග සම්බන්ධ වී කටයුතු කිරීම | • සාමාජිකයන්ගේ දුක් ගැනවිලි ගැන සොයා බැලීම ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විද්වත් කමිටුවල මාර්ගෝපදේශ මාලාවට ඇතුළත් කිරීම<br>• (අ) ගැටලු විග්‍රහ කිරීමට, (ආ) සෘජුව හෝ ශ්‍රී ලංකා පුස්තකාල සංගම් කාර්යාලය හරහා ඒවාට ප්‍රතිචාර දැක්වීමට (ඇ) විසඳුම් හඳුනා ගැනීමට (ඈ) පාලක මණ්ඩලයට වාර්තා කිරීම | • සාමාජිකයන්ගේ දුක් ගැනවිලි පිළිබඳ කටයුතු කිරීම ඇතුළත් මාර්ගෝපදේශ මාලාවක් විද්වත් කමිටුවලට නිකුත් කිරීම<br>• මෙම විෂය පිළිබඳ විද්වත් කමිටු විසින් පවත්වන ලද පර්යේෂණ සහ බුද්ධිකලම්බන සැසි සංඛ්‍යාව<br>• විද්වත් කමිටු මගින් සොයා බලන ලද දුක්ගැනවිලි සංඛ්‍යාව |

| | | | |
|---|---|---|---|
| | | සඳහා ඔවුන් මෙහෙයවීම<br>• පර්යේෂණ සහ බුද්ධිකලම්බන සැසි පැවැත්වීමට විද්වත් කමිටු දිරිමත් කිරීම | |
| 5.7.2. (iii) | ගැටලුවලට මුහුණ පා ඇති සාමාජිකයන්/පුස්තකාල වෙනුවෙන් මැදිහත් වී අදාළ අධිකාරීන් සමග සාකච්ඡා කිරීමට උද්දේශන කණ්ඩායමක් අදාළ විද්වත් කමිටුවල සහායෙන් හඳුනා ගැනීම | • උද්දේශන කමිටුව හමුවීම<br>• අදාළ විද්වත් කමිටු හමුවීම<br>• හඳුනා ගන්නා ලද ගැටලු සමග කටයුතු කිරීමට උද්දේශන කණ්ඩායමක් හඳුනා ගැනීම<br>• දුෂ්කරතාවට පත් වූ පාර්ශ්වය වෙනුවෙන් උද්දේශන කමිටුව බලධාරීන් හමුවීම | • උද්දේශන කමිටුව සාකච්ඡා පවත්වන ලද වාර ගණන<br>• උද්දේශන හරහා විසඳන ලද ගැටලු සංඛ්‍යාව |
| 5.7.2. (iv) | පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය මුහුණ දෙන ගැටලු පිළිබඳ දැනුවත් කරලීම සඳහා පුස්තකාල හා තොරතුරු සේවාවේ අධිකාරීන් සමග සමීප කතිකාවක් ගොඩ නංවා ගැනීම. උදා: රාජ්‍ය පරිපාලන, පළාත් පාලන, අධ්‍යාපන, උසස් අධ්‍යාපන, වෘත්තිය පුහුණු අමාත්‍යාංශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, පළාත් සභා සහ ජනමාධ්‍ය ආදිය | • විවිධ මට්ටම්වල පුස්තකාල සේවා සඳහා වගකියන ලද බලධාරීන් හඳුනා ගැනීම<br>• ඔවුන් සමග සෘජුව හෝ විද්වත් කමිටු හරහා සුහද සබඳතාවක් ගොඩ නංවා ගැනීම<br>• මාධ්‍ය සමග සුහද සබඳතාව ගොඩ නැංවීම<br>• පුස්තකාලවල අභියෝග පිළිබඳ ඔවුන් සමග නිරන්තර සංවාදයක් පවත්වා ගෙන යාම | • පුස්තකාල බලධාරීන් සමග අන්තර් ක්‍රියාකාරී වූ වාර ගණන |
| 5.7.2. (v) | සාමාජිකයන්ගේ මෙබඳු අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගම් කාර්යාලයෙන් ක්ෂණික ප්‍රතිචාර සේවයක් ආරම්භ කිරීම | • ක්ෂණික ප්‍රතිචාර වැඩසටහනෙහි සාමාජිකයන් හඳුනා ගැනීම (සභාපති හෝ උපසභාපති, ශ්‍රී ලංකා පුස්තකාල සංගම් කාර්යාලයේ ප්‍රධාන විධායක නිලධාරී, උද්දේශන කමිටුවේ කැඳවුම්කරු, දුක්ගැනවිලි කමිටුවේ කැඳවුම්කරු හෝ ඒ | • ක්ෂණික ප්‍රතිචාර කණ්ඩායම පත්වීම<br>• බුද්ධිකලම්බන සැසි සහ පුහුණු වැඩසටහන් ගණන |

| | | | |
|---|---|---|---|
| | | වෙනුවට පත් කරන නව කමිටුවේ කැඳවුම්කරු, අදාළ විද්වත් කමිටුවේ කැඳවුම්කරු)<br>• බුද්ධිකලම්බන සැසි සහ ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම | |
| 5.7.2. (vi) | ශ්‍රී ලංකා පුස්තකාල සංගම් කාර්යාලයේ කාර්යක්ෂමතාව සහ ඵලදායිත්වය වර්ධනය කිරීම. එම කාර්යාලයේ ප්‍රධාන විධායක නිලධාරී/පුහුණු කළමනාකරු වෙත වගකීම් පැවරීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රධාන විධායක නිලධාරී/පුහුණු කළමනාකරු පත් කිරීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ කාර්යක්ෂමතාවට සහ ඵලදායිත්වයට ඔහුගේ/ඇයගේ වගකීම සැකසීම<br>• කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | • ප්‍රධාන විධායක නිලධාරි/පුහුණු කළමනාකරු පත්වීම<br>• රැකියා විස්තරය නිකුත් කිරීම<br>• කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන |
| 5.7.2. (vii) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති (තමන් සාමාජිකත්වය දරන), ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, පළාත් පුස්තකාල සේවා මණ්ඩල යනාදියෙහි පාලක හා කළමනාකරණ මණ්ඩල රැස්වීම්වල දී අදාළ කරුණු සාකච්ඡා කළ යුතු අතර මෙම ගැටලු විසඳීමට ඔවුන්ගේ සහාය ලබා ගැනීම. | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති, ප්‍රධාන පුස්තකාල හා තොරතුරු සේවා බලධාරීන් වෙත අදාළ ගැටලුව/ගැටලු ඉදිරිපත් කිරීම<br>• ගැටලුව/ප්‍රශ්නය විසඳීමට ඔවුන්ගේ සහාය ලබා ගැනීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති ඉහත සංසදවල දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් විසින් මුහුණ දෙන ගැටලු මතු කරන ලද වාර ගණන<br>• මේ හරහා විසඳන ලද ගැටලු ගණන |
| 5.7.2. (viii) | සාමාජිකයන්ට සහාය වීම සඳහා වෙනත් සුදුසු පියවර ගැනීම (අමාත්‍යවරු, දේශපාලකයන්, නිලධාරීන්, වෘත්තියවේදී | • ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ තීරණය කිරීමට බුද්ධිකලම්බන සැසියක් පැවැත්වීම<br>• ගැටලුව/ගැටලු විසඳීමට | • සාමාජිකයන් වෙනුවෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය අදාළ බලධාරීන් හමු වූ වාර ගණන<br>• ඔවුන් හරහා සාමාජිකයන්ගේ ගැටලු |

| | | | |
|---|---|---|---|
| | සංගම් නිලධාරීන් මුණ ගැසීම, නීතිමය උපදෙස් පැතීම ආදී) | වෙනත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම | විසඳීමේ සාර්ථකත්ව සීඝ්‍රතාව |
| 5.7.2. (ix) | රැකියා අපේක්ෂාවෙන් සිටින මෑතකාලීනව සුදුසුකම් සම්පූර්ණ කළ වෘත්තිකයන් සහ වෘත්තිය දියුණුව අපේක්ෂාවෙන් සිටින පුස්තකාලයාධිපතීන් පිළිබඳ දත්ත පදනමක් සැකසීම | • අදාළ සුදුසුකම් ලත් පුස්තකාලයාධිපතීන්ගේ දත්ත පදනමක් නිර්මාණය කිරීම<br>• වෘත්තීය දියුණුව අපේක්ෂාවෙන් සිටින පුස්තකාලයාධිපතීන්ගේ දත්ත පදනමක් නිර්මාණය කිරීම<br>• දත්ත පදනම්වල තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම | • මෙම දත්ත පදනම නිර්මාණය<br>• රැකියා සොයා ගැනීමට අලුතින් සුදුසුකම් ලත් පුස්තකාලයාධිපතීන්ට උපකාර කිරීමේ දී සාර්ථක වූ වාර ගණන<br>• සාමාජිකයන්ගේ වෘත්තීය දියුණුවට උදව් කිරීමේ දී සාර්ථක වූ වාර ගණන<br>• දත්ත පදනම ගවේෂණය කළ වාර ගණන |
| 5.7.2. (x) | ශ්‍රී ලංකාවේ සහ විදේශයන් හි (අදාළ) පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ පවතින ඇබෑර්තු පිළිබඳ දත්ත පදනමක් සකස් කර එය වෙබ් අඩවියෙහි පළ කිරීම | • පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රයේ අබෑර්තු සහ තනතුරු පිළිබඳ දත්ත පදනමක් නිර්මාණය කිරීම | • දත්ත පදනම ගවේෂණය කරන ලද වාර ගණන<br>• සාර්ථකත්වයේ සීඝ්‍රතාව |
| 5.7.2. (xi) | විවිධ පුස්තකාල හා තොරතුරු අංශවල දිගු කාලයක් සිට පවතින ඇබෑර්තු පිළිබඳ දත්ත පදනමක් සකස් කර එම තත්ත්වය නිවැරදි කිරීමට බලධාරීන්ගේ අවධානය යොමු කිරීමට අවශ්‍ය පියවර ගැනීම | • දිගු කාලයක් පුරා පත්වීම් කර නොමැති පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රයේ ඇබෑර්තු පිළිබඳ දත්ත පදනමක් සැකසීම<br>• මෙම ඇබෑර්තු පිරවීමට අදාළ බලධාරීන් හමුවීම සහ බලපෑම් කිරීම<br>• උද්දේශන ව්‍යාපාරයක් දියත් කිරීම | • පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රයේ දිගු කාලයක් පැවති ඇබෑර්තු සංඛ්‍යාවේ ක්‍රමික අඩුවීම<br>• ඇබෑර්තු පිරවීමේ දී බලධාරීන් සමග පවත්වන ලද සාර්ථක සාකච්ඡා වාර ගණන |
| 5.7.2. (xii) | ශ්‍රී ලංකාවේ වෙනත් වෘත්තියවේදී සංවිධානවල සහ ලොවපුරා පුස්තකාල සංගම්වල මේ පිළිබඳ විශිෂ්ට ව්‍යවහාරයන් අධ්‍යයනය කිරීම | • වෙනත් පුස්තකාල සංගම් සාමාජිකයන්ගේ දුක් ගැනවිලි සහ වෘත්තීය සංවර්ධනය පිළිබඳ කටයුතු කරන ආකාරය අධ්‍යයනය කිරීම<br>• වෙනත් විද්වත් සංගම් මෙම අභියෝගය සමග කටයුතු | • අදාළ කරුණු පිළිබඳ හඳුනාගත් විශිෂ්ය ව්‍යවහාර සංඛ්‍යාව<br>• අප සංගමය විසින් අනුගමනය කිරීමට තෝරා ගත් විශිෂ්ය ව්‍යවහාර ප්‍රමාණය |

| | | | |
|---|---|---|---|
| | | කරන ආකාරය අධ්‍යයනය කිරීම<br>• අදාළ විශිෂ්ඨ ව්‍යවහාර අනුගමනය කිරීම | |

**6.8.** ප්‍රධාන හවුල්කරුවන් අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම

| උපාය මාර්ග අංකය | උපායමාර්ගය | ක්‍රියාමාර්ග | කාර්යසාධන මිනුම |
|---|---|---|---|
| 5.8.2. (i) | සියලු ක්ෂේත්‍ර ආවරණය කිරීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ද්විත්වකරණය වලක්වාලීමට පුස්තකාල හා තොරතුරු විද්‍යා සංවිධාන සමග සමීප සබඳතාවක් ගොඩ නංවා ගැනීම සහ පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රතිලාභ උපරිම කිරීමට පවත්නා සම්පත් භාවිත කිරීම සඳහා එකිනෙක සංවිධාන අනුපුරක ලෙස ක්‍රියා කිරීම | • පුස්තකාල කටයුතු පිළිබඳ ක්‍රියා කරන අමාත්‍යාංශ, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, පළාත් පුස්තකාල සේවා මණ්ඩල, ජාතික විද්‍යා පදනම, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය යනාදිය සමග සුහද සබඳතාවක් ගොඩ නංවා ගැනීම<br>• මෙම ආයතන සමග කළ හැකි සහයෝගීතා ක්‍රියාකාරකම් සැලසුම් කිරීම<br>• එකම කාර්ය යළි සිදු වීම වළක්වමින් එකිනෙකාට අනුපූරක ලෙස කටයුතු කිරීම<br>• සබඳතා ගොඩ නංවා උපායමාර්ගික සන්ධාන සංවර්ධනය කිරීම | • සහයෝගීත්ව හෝ ඒකාබද්ධ ක්‍රියාකාරකම් සංඛ්‍යාව<br>• මෙවන් ව්‍යාපෘති පිළිබඳ වාර්ෂික සැලැස්ම<br>• උපායමාර්ගික සන්ධාන සංඛ්‍යාව |

| | | | |
|---|---|---|---|
| 5.8.2. (ii) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සහ පුස්තකාල තොරතුරු විද්‍යා ක්ෂේත්‍රය සඳහා ප්‍රතිලාභ ලබා ගැනීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ජාතික විද්‍යා පදනම, වෘත්තියවේදී සංගම් සංවිධානය යනාදියෙහි කමිටු/කණ්ඩායම් සාමාජිකත්වය භාවිත කිරීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රයෝජනය සඳහා ප්‍රධාන සංවිධානයන්හි කමිටු සාමාජිකත්වය යොදා ගැනීම<br>• මෙම අවස්ථා භාවිත කරන ආකාරය පිළිබඳ විද්වත් කමිටු බුද්ධිකලම්බන සැසි පැවැත්වීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයට ප්‍රතිලාභ ලැබෙන අයුරින් රැස්වීම්වල දී මතු කරන ලද ගැටලු සංඛ්‍යාව<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මූලපිරීම හේතු කොට ගෙන මෙම සංවිධානවල කරන ලද නව මූලපිරීම් සංඛ්‍යාව |
| 5.8.2. (iii) | ICTA, UGC, NSF සහ වෙනත් අදාළ සංවිධානවල පාලක මණ්ඩලවල හෝ කමිටු මට්ටමේ නියෝජනයන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට ලබා ගැනීමට උත්සාහ කිරීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට කිසිදු සම්බන්ධයක් දැනට නොමැති, පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය සඳහා වැදගත් සංවිධාන හඳුනා ගැනීමට බුද්ධිකලම්බන සැසියක් පැවැත්වීම<br>• විද්වත් කමිටුවලින් යෝජනා ලබා ගැනීම<br>• ICTA, UGC, NSF සහ එම වර්ගයේ වෙනත් සංවිධානවල පාලක මණ්ඩලයේ හෝ අදාළ කමිටුවල නියෝජනය ලබා ගැනීමට වැඩසටහනක් දියත් කිරීම<br>• මෙම ඉල්ලීම සාධාරණීකරණය කිරීමට එම සංවිධාන සහ එය අයත් අමාත්‍යාංශ වෙත නියෝජනයන් කිරීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමය නියෝජනයන් ලබා ගත් පුස්තකාලවලට බලපෑම් කළ හැකි නව සංවිධාන සංඛ්‍යාව |
| 5.8.2. (iv) | ප්‍රධාන පුස්තකාල හා තොරතුරු විද්‍යා සංවිධානවල ක්‍රියාකාරකම්, ක්‍රියාකාරී සැලසුම්, උපායමාර්ගික සැලසුම් ප්‍රවේශමෙන් සුපරීක්ෂණය කිරීම සහ වෘත්තිය උන්නතිය | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට නියෝජනයක් තිබෙන පුස්තකාල හා තොරතුරු සේවා සංවිධානවල ක්‍රියාකාරී සැලසුම් සහ උපායමාර්ගික සැලසුම් අධ්‍යයනය කිරීම | • සුපරීක්ෂණය කරන ලද ක්‍රියාකාරී/උපායමාර්ගික සැලසුම් සංඛ්‍යාව<br>• අදාළ පුස්තකාලවල කළමනාකරණ මණ්ඩල රැස්වීම්වල දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ දායකත්වයන් සංඛ්‍යාව<br>• වෙනත් සංවිධානවල |

| | | | |
|---|---|---|---|
| | වෙනුවෙන් මෙම සංසදයන් හිදී අදහස් පළ කිරීම. මෙම සංසදයන්හි සාකච්ඡා කරන ලද මූලික ගැටලු ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාලක මණ්ඩලයට සහ අදාළ විද්වත් කමිටුවලට දැනුම් දීම. එය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ රැස්වීම්වල න්‍යාය පත්‍රයේ ස්ථාවර අංගයක් බවට පත් කිරීම | • එම සැලසුම් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රධාන ව්‍යාපෘති සමග එක පෙළට නැංවීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාලක මණ්ඩලයේ සහ විද්වත් කමිටුවල දී අදාළ වෘත්තීය ගැටලු සාකච්ඡා කිරීම | සැලසුම් සමග ගැලපීම සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ක්‍රියාකාරී සැලසුමේ කරන ලද වෙනස්කම් ගණන<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගම් පාලක මණ්ඩලයේ/විද්වත් කමිටුවල රැස්වීම් වාර්තාවන්හි මෙම සාකච්ඡා පිළිඹිබු වූ වාර ගණන |
| 5.8.2. (v) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති හා නියෝජිතයන් හැමවිටම ඉහත සඳහන් පාලක මණ්ඩල හා කමිටු රැස්වීම්වලට හොඳින් සූදානම් වීම. සහභාගී වීමට පෙර අදාළ විද්වත් කමිටුවල සහ වෙනත් විශේෂඥ උපදෙස් ලබා ගැනීම | • රැස්වීම්, සාකච්ඡා, බුද්ධිකලම්බන සැසි සංවිධානය කිරීම<br>• අදාළ පාලක මණ්ඩලයේ ක්‍රියාකාරකම්වල දී වෘත්තීමය ලෙස දායක වෙමින් තම සහභාගීත්වයන් සාධාරණීකරණය කිරීම<br>• එම රැස්වීම්වල දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අදහස් හඬ නැංවීම | • පැවැත් වූ පෙර සූදානම් රැස්වීම් ගණන<br>• රැස්වීම්වල දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නියෝජිතයා විසින් මතු කරන ලද වැදගත් කරුණු/ ගැටලු සංඛ්‍යාව |
| 5.8.2. (vi) | සහභාගී වන සංවිධානවලට මෙන්ම පොදුවේ පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයට ප්‍රතිලාභ ලැබිය හැකි සාමූහික ව්‍යාපෘති දියත් කිරීම | • ප්‍රධාන පුස්තකාල හා තොරතුරු සේවා සංවිධාන සමග පැවැත්විය හැකි ඒකාබද්ධ වැඩසටහන් හඳුනා ගැනීම<br>• සහයෝගිතා වැඩසටහන් දියත් කිරීම | • දියත් කරන ලද සහයෝගිතා වැඩසටහන් ගණන |
| 5.8.2. (vii) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ක්‍රියාශීලී බව පෙන්නුම් කිරීමට සහ එහි බලය වර්ධනය කිරීමට විද්වත් වෘත්තිකයන්ගේ සංගම් සංවිධාන සංසදය අර්ථවත් ලෙස යොදා ගැනීම | • විද්වත් වෘත්තික සංගම් සංවිධානය සමග ශක්තිමත් හවුල්කාරිත්වයක් ගොඩ නැංවීම<br>• උපරිම ප්‍රතිලාභ ලැබීමට විද්වත් වෘත්තික සංගම් සංවිධානයේ සාමාජිකත්වය යොදා ගත හැකි ආකාරය පිළිබඳ බුද්ධිකලම්බන සැසි කිහිපයක් පැවැත්වීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ගැටලු පිළිබඳ විද්වත් වෘත්තික සංවිධානය සමග පවත්වන ලද සාකච්ඡා වාර ගණන<br>• විද්වත් වෘත්තික සංගම් සංවිධාන රැස්වීමේ දී පුස්තකාල හා තොරතුරු සේවාවට සම්බන්ධව මතු කරන ලද ගැටලු සංඛ්‍යාව |

| | | | |
|---|---|---|---|
| | | • පුස්තකාල හා තොරතුරු සේවා වෘත්තිය ඉහළ නැංවීමට විද්වත් වෘත්තික සංගම් සංවිධානයේ සාමාජිකත්වය යොදා ගැනීම<br>• විද්වත් වෘත්තික සංවිධානයේ පාලක මණ්ඩලයට එක් වීම | • විද්වත් වෘත්තික සංගම් සංවිධානයේ දරන ලද තනතුර/තනතුරු |
| 5.8.2. (viii), (ix) | ප්‍රධාන වෘත්තීය සංවිධානවල ප්‍රධානියා සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් සමග වෘත්තිය සබඳතා ගොඩ නැංවීම සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ කටයුතු පිළිබඳ ඔවුන් නිරන්තරයෙන් දැනුවත් කිරීම<br><br>ඔවුන්ගේ ඉලක්ක සපුරා ගැනීමට උද්දේශනය, විශේෂඥ සේවා සහ වෙනත් වෘත්තියවේදී ක්‍රම හරහා ඔවුනට උදව් කිරීම සහ ඒ මගින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ එම සංවිධාන අතර බැඳීම ශක්තිමත් කිරීම | • ප්‍රධාන පුස්තකාල හා තොරතුරු සේවා සංවිධානවල සහ විද්වත් වෘත්තික සංගම් සංවිධානයේ ඉහළ නිලධාරීන් සමග ඇති සබඳතා ඉහළ නැංවීම<br>• පුවත් පත්‍රිකා, ඉලෙක්ට්‍රොනික් පුවත් පත්‍රිකා, මාධ්‍ය නිවේදන ආදිය මගින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ක්‍රියාකාරකම් පිළිබඳ ඔවුන් දැනුවත් කිරීම<br>• උද්දේශනය, විශේෂඥ සහාය ආදිය මගින් ස්වකීය ගැටලු විසඳා ගැනීමට ඔවුනට සහාය වීම | • ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ තොරතුරු ද්‍රව්‍ය ඉලක්ක කණ්ඩායම්වලට යවන ලද වාර ගණන<br>• මෙම සංවිධානවලට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය උදව් කරන ලද වාර ගණන<br>• වෙනත් අන්තර් ක්‍රියාකාරීත්ව සංඛ්‍යාව |
| 5.8.2. (x) | IFLA, REFSALA, IASL, UNESCO ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ට අනුබල දීම | • අන්තර්ජාතික සංසද සමග අඛණ්ඩ හවුල්කාරිත්වයක් ගොඩ නැංවීම<br>• අන්තර්ජාතික සහ කලාපීය සංසදවල සක්‍රීය භූමිකාවක් සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් දිරිමත් කිරීම<br>• මෙම සංසංදවලට සහභාගී වීම සඳහා උනන්දුවක් ඇති සුදුසු සාමාජිකයන්ට සහාය ලබා දීම<br>• ඒ සඳහා අනුග්‍රාහකත්වයන් ලබා ගැනීමට සහාය වීම | • අන්තර්ජාතික සංසදවල කාර්යයන් සඳහා වාර්ෂිකව සහභාගී වූ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් සංඛ්‍යාව<br>• කලාපීය හා අන්තර්ජාතික සංසදවල තනතුරු දරන ලද ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් සංඛ්‍යාව<br>• මෙම සංසදවලට සහභාගී වීමට සාමාජිකයන්ට පහසුකම් සැලසීම වෙනුවෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට ලබා |

| | | | |
|---|---|---|---|
| | | | දීමට හැකි වූ අනුග්‍රහකත්ව සංඛ්‍යාව |
| 5.8.2. (xi) | ජාත්‍යන්තර සංසදයන්ගේ නව ප්‍රාරම්භයන් පිළිබඳ විමසිලිමත් වීම සහ දේශීය වශයෙන් ඒවා පිළිබඳ දැනුවත්භාවය හා වෘත්තියවේදී සංවාද ප්‍රවර්ධනය කිරීම | • පාලක මණ්ඩලය සහ විද්වත් කමිටු මෙම නව ප්‍රාරම්භයන් සුපරීක්ෂණය කිරීම<br>• සංසද විසින් නව ප්‍රාරම්භයන් නිවේදනය කළ විට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් සහ අදාළ වෙනත් පාර්ශ්වයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම | • අන්තර්ජාතික සංසදවල නව ප්‍රාරම්භයන් පිළිබඳ පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන |
| 5.8.2. (xii) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන් සඳහා සහන මිලකට ඉහත ජාත්‍යන්තර සංසදයන්හි ප්‍රකාශන ලබා දීමට කටයුතු කිරීම සහ වැදගත් නියමු, වාර්තා ආදිය දේශීය භාෂාවන්ට පරිවර්තනය කිරීම | • UNESCO, IFLA, IASL ආදියෙහි වැදගත් ප්‍රකාශන හඳුනා ගැනීමට කමිටුවක් පත් කිරීම හෝ විද්වත් කමිටුවලට ඒ සඳහා ආරාධනා කිරීම<br>• අලෙවිය සඳහා ප්‍රකාශන ලබා ගැනීම් සහ ඒවා සහන මිලකට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ට සැපයීම<br>• අදාළ සාහිත්‍ය දේශීය භාෂාවලින් පළ කිරීම | • මෙම සංවිධානවල ප්‍රකාශන සහන මිලකට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයන්ට ලැබීම<br>• සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කරන ලද කෘති සංඛ්‍යාව |
| 5.8.2. (xiii), (xiv) | ඉහත ජාත්‍යන්තර සංසදයන් හි කලාපීය රැස්වීම් සහ විශේෂ වැඩසටහන් ශ්‍රී ලංකාව තුළ කලින් කල පැවැත්වීමට කටයුතු කිරීම<br><br>ප්‍රධාන පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතන අතර සහයෝගීතාව ප්‍රවර්ධනයට දේශීය පුස්තකාල හා තොරතුරු විද්‍යා සංවිධානවල සහ ජාත්‍යන්තර සංසදයන්හි වැදගත් අවස්ථා යොදා ගැනීම | • මෙම රැස්වීම්, පුහුණු පාඨමාලා ශ්‍රී ලංකාවේ පැවැත්වෙන විට ඒ සඳහා සත්කාරකත්වය සැපයීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ උපායමාර්ගික/ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීම<br>• සුදුසු වැඩසටහන්වලට වාරිකව සත්කාරකත්වය සැපයීම<br>• සමාන රැස්වීම්, සම්මන්ත්‍රණ ආදිය සඳහා සත්කාරකත්වය සැපයීම සඳහා පුස්තකාල හා තොරතුරු සේවාවාට සම්බන්ධ වෙනත් ආයතන ප්‍රවර්ධනය කිරීම | • උපායමාර්ගික/ක්‍රියාකාරී සැලැස්මට මෙය ඇතුළත් කිරීම<br>• ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ පුස්තකාල සහ තොරතුරු සේවා ආයතන විසින් සත්කාරකත්වය සපයන ලද මෙම සංසදවල සමුළු, සම්මන්ත්‍රණ, රැස්වීම්, පුහුණු වැඩසටහන් ගණන |

## 7. සැලසුම ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම

### 7.1. උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී අධීක්ෂණය හා සහාය වීමේ කමිටුව (COMAISP)

මනා කොන්දේසි සමග උපායමාර්ග සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ හා සහාය වීමේ කමිටුවක් පත් කිරීම. මෙම කමිටුවෙහි සාමාජිකත්වයට සභාපති, පත්වීමට නියමිත සභාපති, හිටපු සභාපති, පාලක මණ්ඩලය විසින් නම් කරන සාමාජිකයන් තිදෙනෙක් සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගම් කාර්යාලයේ ප්‍රධානියා ඇතුළත් වේ.

### 7.2. පළමු දෙවසරක කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමේ නම්‍යශීලීත්වය

උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාලපරිච්ඡේදය කොටස් දෙකකින් සමන්විත වනු ඇත. පළමු වසර දෙක තුළ ව්‍යුහාත්මක ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් නොතිබෙනු ඇත. උදා: ක්‍රියාත්මක කරන්නේ කුමක්ද සහ එය සිදු කරන්නේ කවදාද?

හෝ ප්‍රමිත කාර්ය සාධන මිනුම් නොතිබෙනු ඇත. ඒ වෙනුවට මෙම කාලය තුළ උපායමාර්ගික සැලැස්ම හොඳින් හඳුනා ගැනීම, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ව්‍යුහය ශක්තිමත් කිරීම, ඇතැම් ප්‍රධාන නිර්දේශ අධ්‍යයනය කිරීමට විශේෂඥ කමිටු පත් කිරීම (උදා: ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය ව්‍යාප්ත කිරීම), සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික අංග පිළිබඳ පුහුණු වැඩසටහන් සහ බුද්ධි කලම්බන සැසි පැවැත්වීම සිදු කෙරෙනු ඇත. ඒ අනුව, සැලැස්මෙන් ක්‍රියාවට නංවන්නේ කුමක්දැයි තෝරා ගැනීමට කළමනාකරණයට නිදහසක් ලැබෙනු ඇත. අනතුරුව, සැලැස්මේ වඩාත් මූලික සහ පුළුල් නිර්දේශ සමග කටයුතු කිරීමට අවශ්‍ය විශ්වාසය හා අත්දැකීම ඔවුනට/ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට ලබා දෙන, සැලැස්මේ සාපේක්ෂව පහසු ක්ෂේත්‍ර ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලැබෙනු ඇත. ආරම්භයේ සිටම දැඩි ක්‍රියාකාරී සැලැස්මක් අනුගමනය කිරීම සාර්ථක නොවනු ඇති බවත් එය අනවශ්‍ය දුෂ්කරතා සහ මාර්ගබාධක ඇති කරනු ඇති බවත් පිළිගැණිනි. මෙම ප්‍රවේසම් සහගත එළඹුමට ප්‍රධාන හේතුව වන්නේ මෙය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පළමු උපාය මාර්ගික සැලැස්ම වීමත් උපාය මාර්ගික සැලැස්මේ සාධනීය ලක්ෂණ පිළිබඳවත් ක්‍රියාත්මක කිරීමේ අභියෝග පිළිබඳවත් නිලධාරීන්, කමිටු හා සාමාන්‍ය සාමාජිකත්ව පූර්ණ අවබෝධයක් නොතිබිය හැකි වීමත් වේ. ඒ අනුව උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම දැඩි සැලැස්මකින් තොරව වසර දෙකක ආරම්භක කාලපරිච්ඡේදයේ දියත් කෙරෙනු ඇත. එහෙත් සැලැස්මේ තෝරාගත් ක්ෂේත්‍ර ක්‍රියාත්මක කිරීමේ දී පාලක මණ්ඩලයේ, විද්වත් කමිටුවල සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගම් කාර්යාලයේ වගකීම් හඳුනා ගන්නා අතර එය ක්‍රියාත්මක කිරීමේ ඉතිරි කාලපරිච්ඡේදය සඳහා පදනම දමනු ඇත.

## 7.3. පළමු වසර දෙකක කාලපරිච්ඡේදයෙන් පසු සැලැස්ම සංශෝධනය කිරීම

පළමු වසර දෙකක කාලයේ අත්දැකීම් සැලකිල්ලට ගනිමින් දෙවන වසර අවසානයේ දී උපාය මාර්ගික සැලැස්ම සංශෝධනය හා වර්ධනය කළ යුතුය. ඊළඟ වසර හතර සඳහා වන සංශෝධිත සැලැස්ම ඕනෑම වෙනත් උපාය මාර්ගික සැලැස්මකට සමාන ලෙස ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සහ කාර්ය සාධන මිනුම් ඇතුළත් විය යුතුය.

## 1 ඇමුණුම : ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රවල උපායමාර්ගික මාර්ගෝපදේශන සහ නියත අවශ්‍යතා

**පූර්විකාව**

මෙම කොටසෙහි අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුස්තකාල ක්ෂේත්‍රවල නියත අවශ්‍යතා හෝ අභියෝග හඳුනා ගැනීමය. මතවාද සමීක්ෂණයෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රධාන දුර්වලතාවක් ලෙස මතු වූ කරුණක් වන්නේ එහි අභිප්‍රායන්ගේ සීමිතකමයි. පුස්තකාල සංගමයේ නිලධාරීන්ට මෙන්ම විද්වත් කමිටුවල සාමාජිකයන්ට ද, පොදුවේ රට තුළ සියලු පුස්තකාල ක්ෂේත්‍ර මුහුණ දෙන අභියෝග සහ දුෂ්කරතා පිළිබඳ දැනුවත්භාවයක් නොමැති බවට එහිදී චෝදනා එල්ල කෙරිණි. මෙය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ක්‍රියාකාරකම්වලට බරපතල බාධාවක් වී ඇති අතර, රටෙහි ප්‍රධාන පුස්තකාල ක්ෂේත්‍ර වෙත ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ දායකත්වය කැපී පෙනෙන තත්ත්වයක නොමැති බව ද එමගින් අනාවරණය විය. එහෙයින්, උපාය මාර්ගික සැලැස්මේ ඇමුණුමක් ලෙස විවිධ පුස්තකාල ක්ෂේත්‍රවල ප්‍රධාන දුර්වලතා ඇතුළත් කිරීමට කමිටුව තීරණය කරන ලදී. මෙය ප්‍රධාන පුස්තකාල ක්ෂේත්‍රවල ගැටලු හෝ අවශ්‍යතා පිළිබඳ සවිස්තරාත්මක ලැයිස්තුවක් නොවන බව කමිටුව අවධාරණය කරයි. පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රයේ නිවැරදි තත්වය පිළිබිඹු වීමට මෙම කොටස නිරන්තරයෙන් සංශෝධනය කිරීමට කමිටුව පුස්තකාල සංගමයට උපදෙස් දෙයි. මෙය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාලක මණ්ඩලයට, විද්වත් කමිටුවලට සහ වෙනත් අදාළ අධිකාරීන්ට මෙම ගැටලුවලට පිළියම් සෙවීමේ තම වගකීම පිළිබඳව මෙය නිරන්තර සිහිකැඳවීමක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 1. ජාතික පුස්තකාල අංශය

**පූර්විකාව**

ජාතික පුස්තකාලය ද්විත්ව භූමිකාවක් රඟ දක්වයි. ජාතික පුස්තකාලයේ ප්‍රධාන වගකීම වන්නේ විමර්ශන, ග්‍රන්ථ විද්‍යාත්මක, සංරක්ෂණ, පුහුණු, ජාලගත කිරීම් සහ වෙනත් ප්‍රමිත ජාතික පුස්තකාල කාර්යයන් මගින් ගුණාත්මක ජාතික පුස්තකාල සේවාවක් පවත්වා ගෙන යාමයි. එය ශ්‍රී ලාංකීය පුස්තකාල ද්‍රව්‍ය සහ තොරතුරු සම්පත්වල ප්‍රමුඛතම තැන්පතුව වේ. ජාතික පුස්තකාලයේ අනෙක් කාර්යය වන්නේ පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ ප්‍රමුඛ සංවිධානය ලෙස අනෙකුත් පුස්තකාල ක්ෂේත්‍රවලට ඔවුන්ගේ කාර්ය හා ක්‍රියාකාරකම් පවත්වා ගෙන යාමටත් රට තුළ සවිමත්, නූතන පුස්තකාල සේවාවක් පවත්වා ගෙන යාමටත් සහාය වීමය. ජාතික පුස්තකාලය මෙම කාර්ය කරනුයේ පුස්තකාල ජාලගත කිරීම්, සහයෝගිතා ක්‍රියාකාරකම්, ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘති යනාදිය හරහාය.

#### 1.1. ව්‍යවස්ථා

(අ) ගුණාත්මක හා නූතන ජාතික පුස්තකාල සේවා පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සවිබල ගැන්වීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත සංශෝධනය කිරීම

(ආ) නීතිමය තැන්පතු නීතිය සංශෝධනය කිරීම. වසර 100 කට අධික කාලයක් පුරා මෙරට නීතිමය තැන්පතු නීතිය සංශෝධනය වී නොමැති වුව ද, වෙනත් රටවල් බොහොමයක පසුගිය දශක කිහිපය තුළ නව මෙන් ම කාලීනව ගැලපෙන නීතිමය තැන්පතු නීති පනවා ගෙන ඇත. මෙය ජාතික පුස්තකාලයේ ප්‍රධාන කාර්යයන් දෙකක් වන එකතු සංවර්ධනය සහ ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම සඳහා බෙහෙවින් බලපා ඇත.

(ඇ) ශ්‍රී ලංකාව තුළ විසිරී ඇති ජාතික පුස්තකාල එකතු සහ ජාතික පුස්තකාල සේවා තාර්කිකව ප්‍රතිසංවිධානය කිරීමට හෝ එක් කිරීමට නීති සම්පාදනය කිරීම. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ආරම්භ කර වසර 25ක් ගතව තිබුණ ද ප්‍රධාන ජාතික උරුම එකතු තවමත් ජාතික පුස්තකාලය සතුව නොමැත. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ සහ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ ඇති ශ්‍රී ලංකා උරුම එකතු පිළිබඳව බලධාරීන් තීරණයක් ගත යුතුව ඇත. පවත්නා තත්ත්වය එලෙසම ඉදිරියට ගෙන යාමට බලධාරීන්ට අවශ්‍ය නම්, එකතුව සංරක්ෂණය කිරීම සහ ගුණාත්මක ග්‍රන්ථ විද්‍යාත්මක සේවා මෙන්ම පාඨක සේවා පවත්වා ගෙන යාම යන ජාතික පුස්තකාල වගකීම් එම ආයතනවලට පැවරෙන ආකාරයට නීති සැකසිය යුතුය. එසේ නැතහොත් මෙම වගකීම් තාර්කිකව ජාතික පුස්තකාලය යටතට පත්විය යුතු අතර එවිට මනා ජාතික පුස්තකාලයක් ලෙස කටයුතු කිරීමට එයට අවකාශ සැලසේ.

(ඈ) (i) පුස්තකාලවල පොත් නැතිවීම (ii) පුස්තකාල ප්‍රමිති සහ ශ්‍රේණිගත කිරීම් (iii) පළාත් පුස්තකාල මණ්ඩල සහ පළාත් මධ්‍ය පුස්තකාල ස්ථාපිත කිරීම (iv) ප්‍රාදේශීය සභා සහ ඊට සමාන මට්ටම්වල පුස්තකාල කමිටු ආරම්භ කිරීම වැනි විවිධ පුස්තකාල ක්ෂේත්‍ර සඳහා නිකුත් කර ඇති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල චක්‍රලේඛ වර්ධනය කිරීම

(ඉ) ප්‍රකාශන හිමිකම සහ සාධාරණ භාවිතයට සම්බන්ධ අංග වෙත විශේෂ අවධානය යොමු කරමින් වත්මන් බුද්ධිමය දේපළ නීතිය වර්ධනය කිරීම

(ඊ) යෝජිත තොරතුරු නිදහස පිළිබඳ පනත අධ්‍යයනය කර පුස්තකාල වෙත තොරතුරු බෙදා හැරීමට එහි බලපෑම සාකච්ඡා කිරීම

(ඔ) ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ නීති සහ ඒවා පුස්තකාල හා තොරතුරු සේවා සඳහා කරනු ලබන බලපෑම අධ්‍යයනය කිරීම

උදා: ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත, පරිගණක අපරාධ පනත, දත්ත ආරක්ෂණ ව්‍යවහාර පද්ධතිය. එමෙන්ම පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය සඳහා අතිරේක නීතිමය ආරක්ෂාවක් අවශ්‍ය දැයි විමසීම

(ඕ) ජාතික පුස්තකාල අංශය ශක්තිමත් කිරීම සඳහා වෙනත් නීති රීතිවල අවශ්‍යතාව පිළිබඳ වෘත්තිය සංවාදයකට නායකත්වය දීම

## 1.2. <u>ප්‍රමිති</u>

(අ) ජාතික පුස්තකාල පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිති සොයා බලා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සේවාවන් සමග ඒවා සැසඳීම

(ආ) ජාතික පුස්තකාල සේවාවන් තුළ දුර්වල හා ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ඒවා වර්ධනය කිරීමට සහාය වීම

(ඇ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සමග එක්ව ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ශ්‍රී ලංකාව සඳහා සුදුසු ජාතික පුස්තකාල ප්‍රමිති සංවර්ධනය කිරීම

## 1.3. <u>ඩිජිටල් පුස්තකාල සේවාවක් නිර්මාණය කිරීම</u>

(අ) මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය (OPAC)

(ආ) ඉහළ ගුණාත්මක බවකින් යුත් ජාතික පුස්තකාල වෙබ් අඩවිය, වේගවත් අන්තර්ජාල ප්‍රවේශය

(ඇ) ශ්‍රී ලංකා ඩිජිටල් ජාතික පුස්තකාලයක් සංවර්ධනය කිරීම සඳහා ජාතික පුස්තකාල එකතුවට දවස පුරා, දුරස්ථ සහ බහුවිධ ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීම

(ඈ) සම්පත් සංවර්ධනය සහ ප්‍රවේශය : ඉලෙක්ට්‍රොනික ග්‍රන්ථ, ඉලෙක්ට්‍රොනික සඟරා, ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත පදනම්, සම්පූර්ණ පෙළ සහිත දත්ත පදනම්, සංයුක්ත තැටි දත්ත පදනම්, ඉලෙක්ට්‍රොනික සම්පත් සහ පුස්තකාල කොන්සෝටියම

(ඉ) ඩිජිටල්කරණය : ජාතික පුස්තකාලයේ දුර්ලභ එකතුවෙහි වත්මන් ඩිජිටල්කරණය ව්‍යාප්ත කිරීම සහ ජාතික පුස්තකාලය තුළ ඩිජිටල්කරණ පහසුකම් ස්ථාපිත කිරීම

(ඊ) ඉලෙක්ට්‍රොනික විමර්ශන සේවාව : වරණීය තොරතුරු බෙදාහැරීම, ප්‍රවර්තන සම්ප්‍රජානන සේවා, අතථ්‍ය විමර්ශන මේස, පාඨක උපදේශන සේවා ආදිය

(එ) පාඨකයන්ගේ ඩෙස්ක්ටොප් පරිගණක, ලැප්ටොප් පරිගණක, ටැබ්ලට් හෝ ජංගම දුරකථනවලට තොරතුරු සැපයීම

(ඒ) පුස්තකාල කටයුතු සඳහා සමාජ මාධ්‍ය භාවිත කිරීම : මහජන සබඳතා වර්ධනය කිරීම, පාඨකයන් සමග සංවාද වර්ධනය කිරීම, ප්‍රචාරණය ආදිය

(ඔ) සම්පත් බෙදා හදා ගැනීම : ජාලකරණය, ඒකාබද්ධ සූචි, පුස්තකාල සහයෝගිතාව, ඉලෙක්ට්‍රොනික ලේඛන බෙදා හැරීම

(ඕ) මාර්ගගත තොරතුරු සාක්ෂරතා වැඩසටහන් සහ ඉලෙක්ට්‍රොනික් ඉගෙනුම් වැඩසටහන්

(ක) ප්‍රකාශන හිමිකම සහ බලපත්‍ර

(ග) බාකෝඩ්, RFID, ස්මාර්ට් කාඩ් තාක්ෂණයන් භාවිත කරමින් ජාතික පුස්තකාලයේ ආරක්ෂාව වැඩි කිරීම

(ච) අභියෝගවලට මුහුණ දීම : දුර්වල අරමුදල් සම්පාදනය, මෘදුකාංග හා දෘඩාංගවල නිරන්තර වෙනස්වීම, ප්‍රමාණවත් නොවන කලාප පළල (Bandwidth), කාර්ය මණ්ඩලයේ තාක්ෂණික දැනුම සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණික දැනුමෙහි අඩුව

## 1.4. <u>සංවිධානය තුළ පුස්තකාලයේ ස්ථානය</u>

(අ) වර්තමානයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට වඩා දෘශ්‍යමාන වන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයයි. ජාතික පුස්තකාලය ප්‍රමුඛ සංවිධානය විය යුතු අතර කළමනාකරණ දේහය ලෙස ජාතික පුස්තකාල හා ප්රලේඛන සේවා මණ්ඩලය ද්වීතියික තත්වය ගත යුතුය.

(ආ) මෙය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පනත මීළඟට සංශෝධනය කරන විට නිවැරදි කළ යුතුය.

## 1.5. <u>සංවිධානය තුළ පුස්තකාලයාධිපතිගේ තත්ත්වය</u>

(අ) ජාතික පුස්තකාලයාධිපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාය. ඔහු එහි ප්‍රධාන විධායක නිලධාරියා ද වේ.

## 1.6. <u>සම්පත් වෙන් කිරීම හා සම්පත් කළමනාකරණය</u>

(අ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ ජාතික පුස්තකාලය වෙනුවෙන් වාර්ෂිකව වෙන් කරන සම්පත් ඉහළ නැංවිය යුතුය.

(ආ) අයවැය සීමා හේතු කොට ගෙන ජාතික පුස්තකාලය සඳහා අවශ්‍ය සම්පත් සැපයීමට භාණ්ඩාගාරය මැලිකමක් දක්වන හෙයින් වෘත්තියවේදී සංවිධානය ලෙස ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, විද්වත් වෘත්තියවේදී සංගම් සංවිධානයේ වාර්ෂික අයවැය යෝජනා

හරහා, අධ්‍යාපන හෝ මුදල් ඇමතිවරු සමග සාකච්ඡා කිරීම හරහා අදාළ අරමුදල් ඉහළ නංවා ගැනීමට රජය පෙළඹවිය යුතුය.

(ඇ) නිලධාරීන් ව්‍යාපෘති සහ අවශ්‍ය සම්පත් ගෙන හැර දක්වමින් උපායමාර්ගික සහ වාර්ෂික සැලැස්ම සම්පාදනය කළ යුතුය.

(ඈ) දේශීය සම්පත්වලට අතිරේකව විදේශීය ආයතන සහ රටවලින් සම්පත් ලබා ගැනීමට උත්සාහ කළ යුතුය.

(ඉ) නිලධාරීන්ට සම්පත් තළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබා දිය යුතුය.

1.7. <u>කාර්ය මණ්ඩලය/කාර්ය මණ්ඩල සංඛ්‍යාව</u>

(අ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහ ජාතික පුස්තකාලයේ කාර්ය මණ්ඩලයේ වත්මන් බඳවා ගැනීම් පටිපාටි අධ්‍යයනය කිරීම, දුර්වලතා ඇත්නම් හඳුනා ගැනීම සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සලකා බැලීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කිරීම

(ආ) ජාතික පුස්තකාල සේවාවේ අනෙකුත් හවුල්කරුවන්ගේ පුස්තකාල හා තොරතුරු සේවා තනතුරු විභාග කිරීම සහ ඒවා ඉහළ නැංවීමට යෝජනා ඉදිරිපත් කිරීම

1.8. <u>පුහුණුව/ධාරිතා ගොඩනැංවීම</u>

(අ) ජාතික පුස්තකාල කටයුතු සඳහා අවශ්‍ය විශේෂ නිපුණතා හඳුනා ගැනීම

(ආ) ජාතික පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පුහුණු අවස්ථා සොයා දීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට සහාය වීම

1.9. <u>සංවිධානය හා ප්‍රවේශය</u>

(අ) ජාතික පුස්තකාල එකතුව සංවිධානමය සහ ප්‍රවේශමය දුර්වලතා හඳුනා ගැනීම සහ ඒවා විසඳා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම

(ආ) රටෙහි විශාලතම ජාතික එකතු ජාතික කෞතුකාගාර සහ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තු සතුව පවතී. මෙම එකතු මනාව සංවිධානය කළ යුතු අතර ඒ සඳහා ප්‍රවේශය ඉහළ නැංවිය යුතුය.

(ඇ) පුස්තකාල හා තොරතුරු විද්‍යා සිසුන්ගේ සහ වෙනත් පර්යේෂකයන්ගේ සහාය ඇතිව උරුම එකතු දෙකෙහි ග්‍රන්ථ විද්‍යාත්මක පාලන ව්‍යාපෘතියක් දියත් කළ යුතු අතර ග්‍රන්ථ නාමාවලි, අනුක්‍රමණිකා, තොරතුරු සංග්‍රහ සම්පාදනය කළ යුතුය.

(ඇ) ජාතික එකතුව සඳහා ප්‍රවේශ වීමට ඇති බාධක සහ දුෂ්කරතා තක්සේරු කිරීම

(ඉ) ජාතික එකතුව වෙත ප්‍රවේශය ඉහළ නැංවීම

(ඊ) ජාතික එකතුන් ඩිජිටල්ගත කිරීම ඇරඹීම. ජාතික එකතුන් වෙත දුරස්ථ ප්‍රවේශය ක්‍රමයෙන් වර්ධනය කිරීම

1.10. <u>පුස්තකාල ගොඩනැගිල්ල/ගෘහභාණ්ඩ</u>

(අ) ජාතික පුස්තකාල සඳහා අතිරේක ඉඩකඩ අවශ්‍යතා සපුරා ලීම. (උදා: වත්මන් ජාතික පුස්තකාල ගොඩනැගිල්ලට තවත් මහල් කිහිපයක් එක් කිරීම හෝ දෙවෙනි ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආදිය)

(ආ) නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධනයන් සලකා බලමින් ඉඩකඩ අවශ්‍යතා විශ්ලේෂණය කිරීම (එකතු ඉඩකඩ, පාඨක ආසන ඉඩකඩ, ඉලෙක්ට්‍රොනික සේවා ස්ථාන ඉඩකඩ, නැරඹීම් සහ සවන් දීම් කාමර, කාර්ය මණ්ඩල සේවා ඉඩකඩ, හමුවීම් ඉඩකඩ, විශේෂ භාවිත ඉඩකඩ, ශ්‍රවණාගාර ආදිය)

(ඇ) රැහැන් සහිත සහ රැහැන් රහිත සබඳතා ජාල, අන්තර්ජාලය, කලාපීය ජාල, ඩිජිටල් සේවා සපයන්නන් වෙත ප්‍රවේශ වීමට පොදු දුරකථන ජාල, ෆයිබර් ධාරිතාව යනාදියට සහාය වීම ඉලෙක්ට්‍රොනික සහ රැහැන් අවශ්‍යතා සපුරා ලීම

(ඈ) පුස්තකාල කාර්යයන්, පුස්තකාල තාක්ෂණයන් සහ තොරතුරු මාධ්‍ය අනුබද්ධ කරමින් අභ්‍යන්තර සැලැස්මක් සංවර්ධනය කිරීම

(ඉ) ජාතික පුස්තකාලයේ අභ්‍යන්තර සැලැස්ම සහ ගෘහභාණ්ඩ වර්ධනය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සමග සහයෝගයෙන් ව්‍යාපෘතියක් දියත් කිරීම

1.11. <u>උපායමාර්ගික සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම</u>

(අ) ගුණාත්මක උපායමාර්ගික සැලැස්මක් සංවර්ධනය කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට සහාය වීම

(ආ) එම ක්‍රියාවලියට සම්බන්ධ වන්නේ කව්ද, කවර අවස්ථාවකදී ද සහ කෙසේද යන්න නිශ්චය කිරීම සහ ජාතික පුස්තකාලය අනාගතයේ සිටිය යුතු ස්ථානය සහ එයට ළඟා විය යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම

(ඇ) ලිඛිත උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම

(ඈ) මෙම සැලසුම වාර්ෂිකව විමසුමට ලක් කිරීම

(ඉ) උපායමාර්ගික සැලැස්ම මත පදනම්ව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම

(ඔ) සැලැස්මේ ගුණාත්මක බව අනාවරණය කර ගැනීමට, දුර්වලතා හඳුනා ගැනීමට සහ ඒවා සකසා ගැනීමට සුදුසු පියවර ගැනීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පර්යේෂණ වැඩසටහනක් දියත් කිරීම

1.12. <u>උද්දේශන න්‍යාය පත්‍රයක් සංවර්ධනය කිරීම</u>

(අ) වගකීම් සපුරාලීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට හා ජාතික පුස්තකාලයට ප්‍රබල උද්දේශන වැඩසටහනක් අවශ්‍ය වේ.

(ආ) උද්දේශන න්‍යාය පත්‍රයක් සැකසීම

(ඇ) උද්දේශන කණ්ඩායමක් හඳුනා ගැනීම

(ඈ) අනෙකුත් පාර්ශ්වයන්ගෙන් සහාය ලබා ගැනීම

(ඉ) ප්‍රබල උද්දේශන ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම

1.13. <u>ආචාරධර්ම පද්ධතියක් අනුගමනය කිරීම</u>

(අ) ප්‍රධාන ක්ෂේත්‍ර : තොරතුරු වෙත ප්‍රවේශය, පුද්ගලයා සහ සමාජය වෙත වගකීම, පෞද්ගලිකත්වය, රහසිගත බව සහ විනිවිදිත බව, විවෘත ප්‍රවේශය සහ බුද්ධිමය දේපළ, ජාලකරණය, පුද්ගල අවංකත්වය සහ වෘත්තිය කුසලතා, වෘත්තිය සගයන්ගේ සහ සේවදායකයන්ගේ/සේවායෝජකයන්ගේ සබඳතාව

(ආ) ආචාරධර්ම පද්ධතිය ගැන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය/ජාතික පුස්තකාල කාර්ය මණ්ඩලය සහ කළමනාකරණය සඳහා දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම

(ඇ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වෘත්තියවේදී ආකාරයක් තුළ ආචාරධර්ම පද්ධතිය මෙහෙයවීම

1.14. <u>සේවා සහ තත්ත්ව තක්සේරුව</u>

(අ) ජාතික පුස්තකාලයේ සේවාවන් තක්සේරු කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් වාරික තත්ත්ව තක්සේරුවක් පැවැත්වීම

(ආ) අවම වශයෙන් වසර තුනකට වරක් ස්වකීය තත්ත්ව තක්සේරු වැඩසටහනක් පැවැත්වීමට ජාතික පුස්තකාලය යොමු කිරීම

(ඇ) තමන්ගේ ව්‍යාපෘති/නිබන්ධ සඳහා ජාතික පුස්තකාලයේ විවිධ ව්‍යාපෘති පිළිබඳ තත්ත්ව තක්සේරු ව්‍යාපෘති පැවැත්වීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ, කැලණිය විශ්වවිද්‍යාලයේ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව හදාරණ සිසුන් දිරිමත් කිරීම

(ඇ) ජාතික පුස්තකාලයේ සේවා තත්ත්වය මැනීම සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සේවා තත්ත්ව මානයන් සංවර්ධනය කිරීම/හඳුනා ගැනීම (උදා: මාර්ගෝපදේශනය, රැඳී සිටීමේ කාලය, සේවාවේ ගුණාත්මක බව, තොරතුරුවල ගුණාත්මක බව, උපකරණවල ගුණාත්මක බව, පුස්තකාල පරිසරයේ, ප්‍රතිචාරාත්මකභාවයේ, සන්නිවේදනයේ ගුණාත්මක බව)

(ඉ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහ ජාතික පුස්තකාලයේ කාර්ය මණ්ඩලය සඳහා තත්ත්ව තක්සේරුවක් පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම

## 2. පළාත් පුස්තකාල අංශය

පූර්විකාව : භූගෝලීය හෝ පරිපාලන කලාප මත පදනම්ව පුස්තකාල හා තොරතුරු සේවා සංවිධානය කිරීම පොදු ලක්ෂණයකි. ඒ අනුව ලොව පුරා වෙනත් රටවල කලාපීය, ප්‍රාන්ත හෝ පළාත් පුස්තකාල සේවා තිබේ. පළාත්වලට බලය විමධ්‍යගත කිරීමත් සමග දෙවන පරිපාලන මට්ටම ලෙස ශ්‍රී ලංකාවට පළාත් සභා ක්‍රමයක් ලැබිණි. පළාත් පුස්තකාල සේවා මණ්ඩල සහ පළාත් මධ්‍ය පුස්තකාල හඳුන්වා දෙන ලද්දේ ඒ අනුවය. පළාත් තුළ සියලු පුස්තකාල අංශවලට සහාය වීමට පළාත් පුස්තකාල සේවා මණ්ඩල සවිබල ගන්වන අතර එය පළාතේ මධ්‍ය පුස්තකාල ලෙස ක්‍රියා කරන පළාත් මධ්‍ය පුස්තකාලය පාලනය කරයි.

### 2.1. ව්‍යවස්ථා

(අ) සියලු පළාත්වලට පළාත් සභා පුස්තකාල ව්‍යවස්ථා හඳුන්වා දීම. වර්තමානයේ දී ව්‍යවස්ථා ඇත්තේ මධ්‍යම, ඌව, සබරගමුව සහ උතුරුමැද පළාත්වල පමණි.

(ආ) වත්මන් පළාත් පුස්තකාල ව්‍යවස්ථාවල දුර්වලතා සොයා ගැනීම සහ ඒවා සැකසීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම

(ඇ) පළාත් සභා පුස්තකාල ව්‍යවස්ථා සහ ඒවා යටතේ ස්ථාපිත කර ඇති ආයතන පළාත් මට්ටමේ පුස්තකාල සේවා සංවර්ධනයට දායකත්වය සපයන ආකාරය පිළිබඳ පර්යේෂණයක් දියත් කිරීම

(ඇ) මෙරට පළාත් සහා පුස්තකාල ව්‍යවස්ථා වෙනත් රටවල සමාන ව්‍යවස්ථා සමග සැසඳීම

2.2. **ප්‍රමිති**

(අ) පළාත් මධ්‍ය පුස්තකාල සඳහා පුස්තකාල ප්‍රමිති සම්පාදනයට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට සහාය වීම

(ආ) පළාත් මධ්‍ය පුස්තකාල ප්‍රමිති පිළිබඳ නිශ්චිත සැලැස්මක් සම්පාදනය කිරීම

(ඇ) වෙනත් රටවල පළාත්/ප්‍රාන්ත හෝ කලාප පුස්තකාල සඳහා ඇති පුස්තකාල ප්‍රමිති අධ්‍යයනය කිරීම

2.3. **ඩිජිටල් පුස්තකාල පරිසරයක් නිර්මාණය කිරීම**

(අ) මාර්ගගත පොදු ප්‍රවේශ සූචි (OPAC)

(ආ) ඉහළ ගුණාත්මක බවකින් යුත් පළාත් පුස්තකාල වෙබ් අඩවිය, වේගවත් අන්තර්ජාල ප්‍රවේශය

(ඇ) පළාත් ඩිජිටල් ජාතික පුස්තකාලයක් සංවර්ධනය කිරීම සඳහා පළාත් පුස්තකාල එකතුවට දවස පුරා, දුරස්ථ සහ බහුවිධ ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීම

(ඇ) සම්පත් සංවර්ධනය සහ ප්‍රවේශය : ඉලෙක්ට්‍රොනික ග්‍රන්ථ, ඉලෙක්ට්‍රොනික සඟරා, ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත පදනම්, සම්පූර්ණ පෙළ සහිත දත්ත පදනම්, සංයුක්ත තැටි දත්ත පදනම්, ඉලෙක්ට්‍රොනික සම්පත් සහ පුස්තකාල කොන්සෝටියම

(ඇ) පළාත් මධ්‍ය පුස්තකාලයට සහ පළාතේ අනෙක් ප්‍රධාන පුස්තකාලවලට ICTA වෙතින් නොමිලේ Wi-Fi සේවා ලබා ගැනීම

(ඉ) ඩිජිටල්කරණය : පළාත් මධ්‍ය පුස්තකාලවල දුර්ලභ එකතු ඩිජිටල්කරණය ඇරඹීම සහ පළාත් පුස්තකාලය තුළ ඩිජිටල්කරණ පහසුකම් ස්ථාපිත කිරීම

(ඊ) ඉලෙක්ට්‍රොනික විමර්ශන සේවාව : වරණීය තොරතුරු බෙදාහැරීම, ප්‍රවර්තන සම්ප්‍රජානන සේවා, අතථ්‍ය විමර්ශන මේස, පාඨක උපදේශන සේවා ආදිය

(එ) පාඨකයන්ගේ ඩෙස්ක්ටොප් පරිගණක, ලැප්ටොප් පරිගණක, ටැබ්ලට් හෝ ජංගම දුරකථනවලට තොරතුරු සැපයීම

(ඒ) පුස්තකාල කටයුතු සඳහා සමාජ මාධ්‍ය භාවිත කිරීම : මහජන සබඳතා වර්ධනය කිරීම, පාඨකයන් සමග සංවාද වර්ධනය කිරීම, ප්‍රචාරණය ආදිය

(ඔ) සම්පත් බෙදා හදා ගැනීම : ජාලකරණය, ඒකාබද්ධ සූචි, පුස්තකාල සහයෝගිතාව, ඉලෙක්ට්‍රොනික ලේඛන බෙදා හැරීම

(ඕ) මාර්ගගත තොරතුරු සාක්ෂරතා වැඩසටහන් සහ ඉලෙක්ට්‍රොනික් ඉගෙනුම් වැඩසටහන්

(ක) ප්‍රකාශන හිමිකම සහ බලපත්‍ර

(ග) බාකෝඩ්, RFID, ස්මාර්ට් කාඩ් තාක්ෂණයන් භාවිත කරමින් පළාත් මධ්‍ය පුස්තකාලයේ ආරක්ෂාව වැඩි කිරීම

(ච) අභියෝගවලට මුහුණ දීම : දුර්වල අරමුදල් සම්පාදනය, මෘදුකාංග හා දෘඩාංගවල නිරන්තර වෙනස්වීම, ප්‍රමාණවත් නොවන ක්ෂේත්‍ර පළල (Bandwidth), කාර්ය මණ්ඩලයේ තාක්ෂණික දැනුම සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණික දැනුමෙහි අඩුව

2.4. <u>සංවිධානය තුළ පුස්තකාලයේ ස්ථානය</u>

(අ) පළාත් පුස්තකාල සේවා මණ්ඩල, පළාත් මධ්‍ය පුස්තකාල පිහිටුවීමට ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දිය යුතුය

(ආ) පළාත් මධ්‍ය පුස්තකාලය පළාතේ ප්‍රධාන විමර්ශන පුස්තකාලය වේ

2.5. <u>සංවිධානය තුළ පුස්තකාලයාධිපතිගේ ස්ථානය</u>

(අ) පළාත් මධ්‍ය පුස්තකාලයේ පුස්තකාලයාධිපති විය යුත්තේ පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයාය.

(ආ) ඔහු/ඇය සංවිධානයේ ප්‍රධාන විධායක නිලධාරියා මෙන් ම ප්‍රධාන වෘත්තිය නිලධාරියා ද වේ.

2.6. <u>සම්පත් වෙන් කිරීම සහ සම්පත් කළමනාකරණය</u>

(අ) පළාත් සභාව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයට හා පළාත් මධ්‍ය පුස්තකාලයට ප්‍රමාණවත් සම්පත් වෙන් කළ යුතුය

(ආ) එය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ වෙනත් සංවිධානවල සහාය ඇතිව බලධාරීන් වෙත ප්‍රබල උද්දේශන ව්‍යාපාරයක් දියත් කළ යුතුය.

(ඇ) ව්‍යාපෘති සහ අවශ්‍ය සම්පත් දක්වමින් නිලධාරීන් උපායමාර්ගික සැලැස්ම සහ වාර්ෂික සැලැස්ම සම්පාදනය කළ යුතුය.

(ඇ) දේශීය සම්පත්වලට අමතරව විදේශීය ආයතන සහ විදේශීය රටවලින් සම්පත් ලබා ගැනීමට උත්සාහ කළ යුතුය.

(ඉ) නිලධාරීන්ට සම්පත් කළමනාකරණය පිළිබඳ පුහුණුවක් දිය යුතුය.

2.7. <u>කාර්ය මණ්ඩලය/ තනතුරු සංඛ්‍යාව</u>

(අ) පළාත් පුස්තකාල සේවා මණ්ඩල සහ පළාත් මධ්‍ය පුස්තකාලවල වත්මන් කාර්ය මණ්ඩල තනතුරු සහ බඳවා ගැනීම් පටිපාටි අධ්‍යයනය කිරීම සහ වර්ධනය කිරීමට අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගැනීම

(ආ) දුෂ්කර කලාපවල පළාත් මධ්‍ය පුස්තකාල සඳහා ගුණාත්මක කාර්ය මණ්ඩලයක් ලබා ගැනීමට යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම

(ඇ) පළාත් පුස්තකාල මණ්ඩල සහ පළාත් මධ්‍ය පුස්තකාල කාර්ය මණ්ඩල අවශ්‍යතා පිළිබඳ පර්යේෂණයක් පැවැත්වීම

2.8. <u>පුහුණු/ධාරිතා ගොඩනැංවීම</u>

(අ) පළාත් පුස්තකාල මණ්ඩල/ පළාත් මධ්‍ය පුස්තකාල පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම සහ පුහුණු සැලැස්මක් සංවර්ධනය කිරීම සඳහා ඔවුන්ට සහාය වීම

(ආ) පළාත් පුස්තකාල කාර්ය මණ්ඩලයේ අත්‍යවශ්‍ය නිපුණතා වර්ධනයට පුහුණු සහ ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම

(ඇ) ඔවුනට ජාතික සහ ජාත්‍යන්තර මට්ටම්වල පුහුණු අවස්ථා සුරක්ෂිත කිරීම සඳහා සහාය වීම

2.9. <u>සංවිධානය හා ප්‍රවේශය</u>

(අ) පළාත් පුස්තකාල එකතු සංවිධානය වර්ධනය කිරීම

(ආ) ගුණාත්මක ග්‍රන්ථ විද්‍යාත්මක පාලනයක් හඳුන්වා දීම

(ඇ) ගුණාත්මක තොරතුරු සේවාවක් සහ පාඨක සේවාවක් සංවර්ධනය කිරීම

(ඈ) ඩිජිටල්කරණ, අන්තර්ජාල පහසුකම් සහ වෙබ් පාදක සේවා හඳුන්වා දීම

(ඉ) පළාත් පුස්තකාලවල සේවා තක්සේරු කිරීමට සහ එය සිදු කරන ආකාරය පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම

(ඊ) ශ්‍රී ලංකාවේ පළාත් පුස්තකාල සේවාව අනෙක් රටවල එවන් සේවා සමග සැසඳීම

(ඔ) නව සේවා හඳුන්වා දීමට සහ පවත්නා සේවා දියුණු කිරීමට පළාත් පුස්තකාලවලට සහාය වීම

(ඕ) එකතු වෙත දුරස්ථ ප්‍රවේශය ක්‍රමයෙන් වර්ධනය කිරීම

2.10. <u>පුස්තකාල ගොඩනැගිලි සහ ගෘහභාණ්ඩ</u>

(අ) වත්මන් පළාත් පුස්තකාල ගොඩනැගිලිවල ප්‍රබලතා සහ දුබලතා තක්සේරු කිරීම

(ආ) නව තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධනයන් සලකා බලමින් ඉඩකඩ අවශ්‍යතා විශ්ලේෂණය කිරීම (එකතු ඉඩකඩ, පාඨක ආසන ඉඩකඩ, ඉලෙක්ට්‍රොනික සේවා ස්ථාන ඉඩකඩ, නැරඹීම් සහ සවන් දීම් කාමර, කාර්ය මණ්ඩල සේවා ඉඩකඩ, හමුවීම් ඉඩකඩ, විශේෂ භාවිත ඉඩකඩ, ශ්‍රවණාගාර ආදිය)

(ඇ) රැහැන් සහිත සහ රැහැන් රහිත සබඳතා ජාල, අන්තර්ජාලය, කලාපීය ජාල, ඩිජිටල් සේවා සපයන්නන් වෙත ප්‍රවේශ වීමට පොදු දුරකථන ජාල, ෆයිබර් ධාරිතාව යනාදියට සහාය වීම ඉලෙක්ට්‍රොනික සහ රැහැන් අවශ්‍යතා සපුරා ලීම

(ඈ) පුස්තකාල කාර්යයන්, පුස්තකාල තාක්ෂණයන් සහ තොරතුරු මාධ්‍ය අනුබද්ධ කරමින් අභ්‍යන්තර සැලැස්මක් සංවර්ධනය කිරීම

(ඉ) වෙනත් රටවල පළාත්, කලාපීය සහ ප්‍රාන්ත පුස්තකාලවල ගොඩනැගිලි සැලසුම් පිළිබඳ දත්ත පදනමක් සංවර්ධනය කිරීම

(ඊ) ජාතික/පළාත් තරගයක් හරහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහාය ඇතිව පළාත් මධ්‍ය පුස්තකාල ගොඩනැගිලි සැලසුම් ආදර්ශ සැකසීම

(ඔ) පළාත් මධ්‍ය පුස්තකාල සඳහා පුස්තකාල ගෘහ භාණ්ඩ පිළිබඳ දත්ත පදනමක් සංවර්ධනය කිරීම

2.11. <u>උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම</u>

(අ) උපායමාර්ගික සැලැස්ම සම්පාදනය කිරීමට පළාත් මධ්‍ය පුස්තකාල දිරිමත් කිරීම

(ආ) එම ක්‍රියාවලියට සම්බන්ධ වන්නේ කව්ද, කවර අවස්ථාවකදී ද සහ කෙසේද යන්න නිශ්චය කිරීම. පළාත් පුස්තකාල අනාගතයේ සිටිය යුතු ස්ථානය හා ඒ කරා ළඟා විය යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම

(ඇ) ලිඛිත උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම

(ඈ) මෙම සැලසුම් වාර්ෂිකව විමසුමට ලක් කිරීම

(ඉ) අවශ්‍ය පුහුණුව ලබා දෙමින් සහ ආදර්ශ සැලසුම් ප්‍රකාශයට පත් කරමින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සැලසුම් සම්පාදනයට පළාත් මධ්‍ය පුස්තකාලයාධිපතින්ට සහාය විය යුතුය

(ඔ) සැලැසුම්වල ගුණාත්මක බව අනාවරණය කර ගැනීමට, දුර්වලතා හඳුනා ගැනීමට සහ ඒවා සකසා ගැනීමට සුදුසු පියවර ගැනීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පර්යේෂණ වැඩසටහනක් දියත් කිරීම

## 2.12. <u>උද්දේශන න්‍යාය පත්‍රය</u>

(අ) ස්වකීය වගකීම් සපුරාලීමට පළාත් පුස්තකාල සේවා මණ්ඩලයට සහ පළාත් මධ්‍ය පුස්තකාලයට ප්‍රබල උද්දේශන වැඩසටහනක් අවශ්‍යය

(ආ) උද්දේශන න්‍යාය පත්‍රයක් සැකසීම

(ඇ) සියලු පාර්ශ්වයන්ගේ සහාය ඇතිව ශක්තිමත් උද්දේශන ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම

## 2.13. <u>ආචාරධර්ම පද්ධතියක් අනුගමනය කිරීම</u>

(අ) ප්‍රධාන ක්ෂේත්‍ර : තොරතුරු වෙත ප්‍රවේශය, පුද්ගලයා සහ සමාජය වෙත වගකීම, පෞද්ගලිකත්වය, රහසිගත බව සහ විනිවිදින බව, විවෘත ප්‍රවේශය සහ බුද්ධිමය දේපළ, ජාලකරණය, පුද්ගල අවංකත්වය සහ වෘත්තිය කුසලතා, වෘත්තිය සගයන්ගේ සහ සේවදායකයන්ගේ/සේවායෝජකයන්ගේ සබඳතාව

(ආ) ආචාරධර්ම පද්ධතිය ගැන පළාත් පුස්තකාල සේවා මණ්ඩලය/පළාත් මධ්‍ය පුස්තකාල කාර්ය මණ්ඩලය සහ කළමනාකරණය සඳහා දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම

(ඇ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වෘත්තියවේදී ආකාරයක් තුළ ආචාරධර්ම පද්ධතිය මෙහෙයවීම

## 2.14. <u>සේවා සහ තත්ත්ව තක්සේරුව</u>

(අ) පළාත් මධ්‍ය පුස්තකාලයේ සේවාවන් තක්සේරු කිරීමට පළාත් සභාව, පළාත් පුස්තකාල සේවා මණ්ඩලය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලයේ ස්තකාල හා විඥාපන විද්‍යා අංශය සහ එක්ව ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වාරික තත්ත්ව තක්සේරුවක් පැවැත්වීම

(ආ) අවම වශයෙන් වසර තුනකට වරක් තම තත්ත්ව තක්සේරු වැඩසටහන් පැවැත්වීමට මධ්‍ය පුස්තකාල යොමු කිරීම

(ඇ) තමන්ගේ ව්‍යාපෘති/නිබන්ධ සඳහා ජාතික පුස්තකාලයේ විවිධ ව්‍යාපෘති පිළිබඳ තත්ත්ව තක්සේරු ව්‍යාපෘති පැවැත්වීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ, කැලණිය විශ්වවිද්‍යාලයේ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව හදාරණ සිසුන් දිරිමත් කිරීම

(ඈ) පළාත් මධ්‍ය පුස්තකාලයේ සේවා තත්ත්වය මැනීම සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සේවා තත්ත්ව මානයන් සංවර්ධනය කිරීම/හඳුනා ගැනීම (උදා: මාර්ගෝපදේශනය, රැඳී සිටීමේ කාලය, සේවාවේ ගුණාත්මක බව, තොරතුරුවල ගුණාත්මක බව, උපකරණවල ගුණාත්මක බව, පුස්තකාල පරිසරයේ, ප්‍රතිචාරාත්මකභාවයේ, සන්නිවේදනයේ ගුණාත්මක බව)

(ඉ) පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සහ පළාත් පුස්තකාලයේ කාර්ය මණ්ඩලය සඳහා තත්ත්ව තක්සේරුවක් පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම

## 3. ශාස්ත්‍රීය පුස්තකාල ක්ෂේත්‍රය

**පූර්විකාව**

විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලට සම්බන්ධ ශාස්ත්‍රීය පුස්තකාල ආචාර්ය මණ්ඩලයට සහ සිසුන්ට සිය ඉගැන්වීම්, ඉගෙනුම් සහ පර්යේෂණ කටයුතුවලට සේවා සපයයි. අන්තර්ජාල යුගයට පෙර, විශ්වවිද්‍යාලයේ තොරතුරු සහ දැනුම මධ්‍යස්ථානය ලෙස සලකන ලද්දේ ශාස්ත්‍රීය පුස්තකාලයයි. විශේෂයෙන් Google, Google Scholar වැනි සෙවුම් යන්ත්‍ර සහ අන්තර්ජාලයේ බිහිවීම මගින් මෙම ඒකාධිකාරය නිමා කෙරිණි. වර්තමානයේ දී බොහෝ විට ආචාර්ය මණ්ඩලය මෙන්ම සිසුන් ද තොරතුරු සෙවීමේ පළමු තේරීම ලෙස අන්තර්ජාලය භාවිත කරති. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ සෙවුම් යන්ත්‍රවල ඉහළ ගුණාත්මක බවත් අන්තර්ජාල ප්‍රවේශය පුළුල් වීමත්, දිනෙන් දින ඉහළ යන ඩිජිටල් සාක්ෂරතාව සමග ස්මාර්ට් දුරකථන, ටැබ්ලට්, ලැප්ටොප් සහ ඩෙස්ක්ටොප් පරිගණකවල පැවතීමත්ය. එසේ වුවත් තොරතුරු මධ්‍යස්ථාන ලෙස උසස් අධ්‍යාපන ආයතනයන්හි ප්‍රමාණවත් බලයක් තවමත් ශාස්ත්‍රීය පුස්තකාල සතුව පවතී. නව සහ මතුවෙමින් පවතින තත්ත්වයට මුහුණ දීමට

ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය පුස්තකාලයාධිපතීන් ද මෙකී නව සුසමාදර්ශයට ගැලපීමට තම භූමිකාව යළි සොයා ගැනීමට උත්සාහ කළ යුතුය. තොරතුරු සාක්ෂරතාව සඳහා සීඝ්‍රයෙන් වැඩිවන උද්යෝගය, වෙබ් අඩවි සංවර්ධනය සහ මෙහෙයුම, ආචාර්ය මණ්ඩලයට සහ සිසුන්ට ඔවුන්ගේ පර්යේෂණ කටයුතුවලට සහාය වීම, ඉලෙක්ට්‍රොනික සහරා කොන්ටෝසියම සංවර්ධනය, පාඩම් සැලසුම්, විෂයමාලා සංවර්ධනය සහ ග්‍රන්ථ විද්‍යාත්මක උපදෙස් සැපයීම ශාස්ත්‍රීය පුස්තකාලවල සුසමාදර්ශ විතැන් වීමේ සලකුණු වේ.

3.1. <u>ව්‍යවස්ථා</u>

i. පවත්නා විශ්වවිද්‍යාල පනතට සංශෝධන හඳුන්වා දීම මගින් විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ තත්ත්වය ශක්තිමත් කිරීම. යෝජිත සංශෝධන වනුයේ

(අ) පුස්තකාලයාධිපති විශ්වවිද්‍යාල කවුන්සලයේ සහ සියලු පීඨ සභාවල සාමාජිකයෙකු වීම

(ආ) හැකිතාක් ප්‍රායෝගික ලෙස, ආචාර්ය මණ්ඩලයට සමාන ප්‍රතිලාභ සහ අයිතීන් සමග විශ්වවිද්‍යාලය තුළ පුස්තකාලයාධිපතිගේ සහ පුස්තකාල කාර්ය මණ්ඩලයේ අධ්‍යයන තත්ත්වය සහතික කිරීමට සුදුසු වෙනත් කළ හැකි නව සංශෝධන සවිස්තරාත්මකව සාකච්ඡා කළ යුතු අතර ඒවා ක්‍රියාකාරී සැලැස්මට යෙදීමට පෙර විශේෂඥ උපදෙස් ලබා ගැනීම.

3.2. <u>ප්‍රමිති</u>

i. ශාස්ත්‍රීය පුස්තකාල පිළිබඳ ඉෆ්ලා මගින් නිකුත් කරන ලද නියමු සොයා ගැනීම
ii. වෙනත් රටවල ශාස්ත්‍රීය පුස්තකාල පිළිබඳ ප්‍රමිති, නියමු සහ විශිෂ්ට ව්‍යවහාර අධ්‍යයනය කිරීම
iii. පුස්තකාල හා විඥාපන විද්‍යා ස්ථාවර කමිටුව (SCOLIS), තත්ත්ව සහතික පිළිගැනීම කමිටුව (QAAC), විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතීන්ගේ සංගමය (ULA) සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය යනාදියේ සහයෝගයෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය පුස්තකාල සඳහා ප්‍රමිති සහ නියමු සංවර්ධනය කිරීම

3.3. <u>ඩිජිටල් පුස්තකාල පරිසරයක් නිර්මාණය කිරීම</u>

i. මාර්ගගත පොදු ප්‍රවේශක සූචිය (OPAC)
ii. ඉහළ ගුණාත්මක බවින් යුත් පුස්තකාල වෙබ් අඩවිය, වේගවත් අන්තර්ජාල ප්‍රවේශය
iii. පුස්තකාලය සහ සමස්ත විශ්වවිද්‍යාල සඳහා Wi-Fi පහසුකම්
iv. ඩිජිටල් පුස්තකාලයක් ගොඩ නංවා විශ්වවිද්‍යාල පුස්තකාල එකතුව වෙත දවස පුරා ප්‍රවේශ, දුරස්ථ ප්‍රවේශ සහ බහුවිධ ප්‍රවේශ පහසුකම් සැපයීම
v. විශ්වවිද්‍යාලවල ඉලෙක්ට්‍රොනික සංචිත පිළිබඳ තොරතුරු සංග්‍රහ සම්පාදනය

vi. සම්පත් සංවර්ධනය සහ ප්‍රවේශය; විද්‍යුත් පොත්, විද්‍යුත් සඟරා, ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත පදනම්, සම්පූර්ණ පෙළ සහිත දත්ත පදනම්, විද්‍යුත් සම්පත් සහ පුස්තකාල සාමූහික
vii. අතථ්‍ය පුස්තකාල ගොඩනැංවීම (3D පුස්තකාල)
viii. දුර්ලභ එකතු, විශේෂ එකතු, පුස්කොළ පොත් සහ වෙනත් දුර්ලභ අත්පිටපත් ඩිජිටල්ගත කිරීම
ix. විද්‍යුත් විමර්ශන සේවාව: වරණීය තොරතුරු බෙදාහැරීම, ප්‍රවර්තන සම්ප්‍රජානන සේවාව, අතථ්‍ය විමර්ශන මේසය, පාඨක උපදේශක සේවා ආදිය
x. පාඨකයන්ගේ ඩෙස්ක්ටොප්, ලැප්ටොප්, ටැබ්ලට් හෝ ජංගම දුරකථනවලට තොරතුරු ලබා දීම
xi. පුස්තකාල කටයුතු සඳහා සමාජ මාධ්‍ය භාවිත කිරීම; මහජන සබඳතා වැඩිදියුණු කිරීම, ආචාර්ය මණ්ඩලය, සිසුන් සමග සංවාද, ප්‍රචාරණය ආදිය
xii. දැනුම බෙදාහැරීම සඳහා ඉන්ෆොග්‍රැෆික් යොදා ගැනීම
xiii. සම්පත් බෙදාහදා ගැනීම; ජාලකරණය, ඒකාබද්ධ සූචිය, පුස්තකාල සහයෝගීතාව, විද්‍යුත් ලේඛන බෙදා හැරීම, අනෙක් විශ්වවිද්‍යාල පුස්තකාල, ජාතික පුස්තකාලය, වෙනත් ප්‍රධාන පුස්තකාල, අධ්‍යාපන අමාත්‍යාංශය හා සම්බන්ධීකාරකයන් සමග සමීප සබඳතාව
xiv. මාර්ගගත තොරතුරු සාක්ෂරතා වැඩසටහන් සහ විද්‍යුත් ඉගෙනුම් වැඩසටහන් ඇතුළු උසස් ගුණාත්මක බවින් යුත් තොරතුරු සාක්ෂරතා වැඩසටහන්
xv. ප්‍රකාශන හිමිකම සහ බලපත්‍ර; පොදු නිර්මාණාත්මක කලාප, ලේඛන චෞරත්වයට එරෙහි භාවිතය වෙනුවෙන් පුස්තකාල සහයෝගීතාව සඳහා පොදු බලපත්‍ර මිල දී ගැනීම
xvi. තීරු කේත, විද්‍යුත් චුම්බක පටි, RFID, ස්මාර්ට් කාඩ් තාක්ෂණ භාවිත කරමින් පුස්තකාලයේ ආරක්ෂාව වර්ධනය කිරීම
xvii. අභියෝග ජය ගැනීම; දුර්වල අරමුදල් සම්පාදනය, මෘදුකාංග සහ දෘඩාංගවල නිරන්තර වෙනස්වීම, අප්‍රමාණවත් ක්ෂේත්‍රපළල, පුස්තකාල කාර්ය මණ්ඩලයේ අඩු තාක්ෂණිකසහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික දැනුම

### 3.4. <u>සංවිධානය තුළ පුස්තකාලයාධිපතීන්ගේ තත්ත්වය</u>

i. විශ්වවිද්‍යාලයන් හි පුස්තකාලයාධිපතීන්ගේ තත්ත්වය සහ ස්ථානය පිළිබඳ ලොව පුරා විශ්වවිද්‍යාල තුළ පුළුල් ලෙස සාකච්ඡා කර ඇත. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ආරම්භ යුගයේ පුස්තකාලයාධිපති එහි කවුන්සලයේ, සනාතන සභාවේ, පීඨ සභාවල සහ ප්‍රධාන කමිටුවල සාමාජිකත්වය දැරූ පුද්ගලයන් කීප දෙනාගෙන් කෙනෙකු විය. තවමත් පුස්තකාලයාධිපති විශ්වවිද්‍යාලයේ ප්‍රධාන නිලධාරීන්ගෙන් කෙනෙකු වුවද එම තත්ත්වය පසුගිය කාලය පුරා පහළ බැස ඇත. වර්තමානයේ පුස්තකාලයාධිපතීන්ට විශ්වවිද්‍යාල කවුන්සලයේ, පීඨ සභාවල සහ ඇතැම් වැදගත් කමිටුවල ස්ථානයක් හිමි

නොවේ. පුස්තකාලයාධිපති පීඨ විධායක සභාවේ සාමාජිකයෙකු නොවුණ ද බොහෝ පීඨ එහි රැස්වීම්වලට සහභාගී වීමට පුස්තකාලයාධිපතිට ආරාධනා කරයි. මෙම තත්ව දෙකෙහිම වාසි මෙන්ම අවාසි ද තිබේ. ඇතැම් පුස්තකාලයාධිපතීන් තම වටිනා කාලය කමිටු ගණනාවකට දැනටමත් යෙදීමට සිදුවීම ගැන කණස්සල්ල පළ කරන අතර තවත් අමතර කමිටුවලට සහභාගී වීමට කැමැත්තක් නොදක්වති. තවත් සමහරුන්ට විශ්වවිද්‍යාලය තුළ තමන්ගේ තත්ත්වය ශක්තිමත් කිරීමටත් තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පාර්ශ්වකරුවන් වීමටත් ප්‍රධාන, උපායමාර්ගික ස්ථානවලට යාමට අවශ්‍ය අතර ඒවා පුස්තකාලයට අරමුදල්, කාර්ය මණ්ඩලය සහ වෙනත් පහසුකම් ලබා ගැනීමට වාසිදායක වේ.

ii. අනෙක් ගැටලුව වන්නේ පුස්තකාල කාර්ය මණ්ඩලය අධ්‍යයන කාර්ය මණ්ඩල වර්ගය යටතට පැමිණිය ද ඔවුන් විදේශ පුහුණුව, පර්යේෂණ අරමුදල් බෙදා හදා ගැනීම, පුස්තකාල ධූරාවලිය තුළ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකුගේ තත්ත්වයට සමාන තත්වයක් නිර්මාණය නොවීම වැනි ආචාර්ය මණ්ඩලය සතු වරප්‍රසාද භුක්ති නොවිඳී. වඩාත් උචිත තත්ත්වය වන්නේ පුස්තකාල කාර්ය මණ්ඩලයට ආචාර්ය මණ්ඩලයේ සියලු වරප්‍රසාද සමග පූර්ණ අධ්‍යයන තත්ත්වයක් ලැබීමය.

iii. වත්මන් තත්ත්වයට ප්‍රධාන හේතුවක් වන්නේ තමන් හා සමාන අධ්‍යයන සුදුසුකම් හෝ ඉගැන්වීම සහ පර්යේෂණ සුදුසුකම් නොමැති පුස්තකාල කාර්ය මණ්ඩලවලට තමන්ට සමාන තත්ත්වයක් ලබා දීම ගැන ඇතැම් ආචාර්යවරුන් අතර පවත්නා නොකමැත්තයි. මෙය අනලස්ව හැසිරවිය යුතු, ලොව පුරා බොහෝ විශ්වවිද්‍යාලවලට පොදු ලක්ෂණයකි. මෙම තර්කයේ පදනමට අවම තාර්කිකත්වයක් නොමැත. ආචාර්යවරුන් සහ පුස්තකාලයාධිපතීන් තරමක වෙනස් කාර්යයන් දෙකක නියැලෙන අතර එය සැසඳීම ඇපල් හා දොඩම් සැසඳීමක් වැනිය. ස්වකීය ඉගැන්වීමේ කාර්යයේ කොටසක් ලෙස ආචාර්යවරුන් ඉගැන්වීම් සහ පර්යේෂණ කරනු ලබන අතර මූලික වශයෙන් සේවාභිමුඛ වූ පුස්තකාලයාධිපතීන් විශ්වවිද්‍යාලයේ ඉහළ ගුණාත්මක බවින් යුත් නවීන පුස්තකාල හා තොරතුරු සේවාවක් සඳහා වග කියනු ලැබේ. ආචාර්ය මණ්ඩලය තම ප්‍රඥාව හා දැනුම මගින් සිසුන්ට මගපෙන්වන අතර පුස්තකාලයාධිපතීන් ආචාර්යවරුන්ට/සිසුන්ට දැනුම විශ්වය විවර කරති. මෙම කාර්යයන් දෙකම උසස් අධ්‍යාපනයේ දී වැදගත් වන අතර ඒවා සැසඳීමට ලක් කළ නොහැක. ආචාර්යවරුන්ට දර්ශනසූරී උපාධි සහ වෙනත් උසස් සුදුසුකම් අවශ්‍ය වේ. මේවා පුස්තකාල ක්ෂේත්‍රයට ද ප්‍රයෝජනවත් වුව ද හැමවිටම අත්‍යවශ්‍ය නොවේ. පුස්තකාලයාධිපතීන්ගේ ගුණාත්මක බව සම්බන්ධ වන්නේ අත්‍යවශ්‍යයෙන් ම පුද්ගලයන්ගේ උසස් උපාධි සුදුසුකම් සමග නොව පුස්තකාල සහ එහි සේවාවේ ගුණාත්මක බව සමගය. ප්‍රධාන තොරතුරු සාක්ෂරතා වැඩසටහන් සමග උසස්

තත්ත්වයේ දත්ත පදනම්, උසස් විද්‍යුත් සඟරා, ග්‍රන්ථ විද්‍යාත්මක උපදෙස්, හොඳින් කළමනාකරණය කරන ලද වෙබ් අඩවි යනාදියෙන් තොරව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන තත්ත්වය ඉහළ නැංවීමට ආචාර්ය මණ්ඩලයට සැපයිය හැක්කේ සීමිත දායකත්වයක් පමණි.

iv. විශ්වවිද්‍යාලවල අධ්‍යයන තත්ත්වය පිළිබඳ වත්මන් විවාදයට පිළිතුරු සැපයීමට සැලකිය යුතු පුස්තකාල කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාවක් මෑත කාලයේ දර්ශනසූරි උපාධි ලබා ගැනීමට සමත්ව තිබේ. විශේෂයෙන් තරුණ පුස්තකාල කාර්ය මණ්ඩල සාමාජිකයන් දර්ශනසූරි උපාධිය හදාරමින් හෝ හැදෑරීමට සැලසුම් කරමින් සිටින අතර එය මෙම 'අර්බුදයේ' ධනාත්මක බලපෑමකි. ඔවුහු තොරතුරු සාක්ෂරතාව, ග්‍රන්ථ විඥාපන කටයුතු යනාදිය පිළිබඳව ඉගැන්වීමේ නිරතව සිටිති. එමෙන්ම පර්යේෂණ හා ප්‍රකාශන කාර්යයේ යෙදෙති. මෙම නව සංවර්ධනයන් තත්ත්වය මදක් සමනය කළ ද තවමත් ගැටලුව පවතී. අධ්‍යයන තත්ත්වයේ විශ්වීය මිනුමක් ලෙස පුද්ගල ශාස්ත්‍රීය සුදුසුකම්, ඉගැන්වීම් සහ පර්යේෂණ යොදා ගැනීම පිළිබඳව සමහරු ආචාර්ය මණ්ඩලයට දොස් පවරති. තවත් සමහරු තමන්ගේ වටිනාකම සහ රාජකාරි මනාව කිරීම ගැන වැටහීමෙන් තොරව විශ්වවිද්‍යාල පරිසරය තුළ 'අඩුකමේ සංකීර්ණය' (Inferiority complex) වෙතින් අනවශ්‍ය ලෙස විඳවීම ගැන පුස්තකාල කාර්ය මණ්ඩලයට දෝෂාරෝපණය කරති. මෙයට අමතරව පුස්තකාල කාර්ය මණ්ඩල සතුව තවත් දුර්වලතා පවතී. දුර්වල සන්නිවේදන කුසලතා, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අප්‍රමාණවත් දැනුම හෝ ප්‍රවීණත්වය, දුර්වල මෘදු කුසලතා, විශ්වවිද්‍යාල පරිසරය තුළ කමිටුවල හෝ ප්‍රභූ කණ්ඩායම්වල කටයුතු කිරීමේ දී බෙහෙවින් දර්ශනය වන කඩවසම් බවේ (Smartness) අඩුව මේ අතරින් සුවිශේෂ වේ.

3.5. **<u>සංවිධානය තුළ පුස්තකාලයේ තත්ත්වය</u>**

i. අන්තර්ජාලයේ ආගමනයත් සමග තොරතුරු මධ්‍යස්ථානය ලෙස විශ්වවිද්‍යාල පුස්තකාලයේ ස්ථානය අස්ථාවර බවට පත්ව ඇත. දැන් බොහෝ ආචාර්යවරු සහ සිසුන් ගූගල් හෝ ඊට සමාන සේවා සහ සපයන්නන් හරහා ස්වකීය තොරතුරු ගවේෂණ අරඹති.

ii. ශ්‍රී ලංකාව ද ඇතුළු ලොව පුරා ශාස්ත්‍රීය පුස්තකාල අන්තර්ජාලයෙන් එල්ල වන අභියෝග හඳුනාගෙන ඇති අතර එම අභියෝගවලට මුහුණ දීමට සුදුසු ආරක්ෂිත පියවර ගනිමින් සිටිති. ඇතැම් විට විශාලතම අභියෝගය වන්නේ සිසුන්ගේ දුර්වල තොරතුරු සාක්ෂර කුසලතාය. මෙයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ රටේ දුර්වල පාසල් පුස්තකාල පද්ධතිය සහ විභාගාභිමුඛ අධ්‍යාපන ක්‍රමයයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස

බොහෝ විශ්වවිද්‍යාල සිසුන්ට ආරම්භයේ සිටම තොරතුරු ගවේෂණය, ග්‍රන්ථ විඥාපන මෙවලම් ආදිය හඳුන්වා දීමට විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතීන්ට සිදු වනු ඇත.

iii. විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතීන් මෙම අභියෝග ජය ගැනීමට නිරන්තරයෙන් උත්සාහ කළ ද අප්‍රමාණවත් කාර්ය මණ්ඩල, දුර්වල අරමුදල් සම්පාදනය සහ වෙනත් කරුණු ගණනාවක් නිසා ඔවුන් නිරන්තර ගැටලුවලට මුහුණ දෙමින් සිටී.

iv. විශ්වවිද්‍යාල පුස්තකාල සඳහා විද්‍යුත් සඟරා සාමූහික හඳුන්වා දීම 21 සියවසේ ඉල්ලීම්වලට ගැලපීමට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල ගත් දැවැන්ත පියවරකි. එසේම පුස්තකාලවල ඇති ඉඩකඩ වඩාත් ලිබරල් භාවිතය සහ පාඨකයන්ගේ වැඩි නිදහස සඳහා ඇතැම් විශ්වවිද්‍යාල පුස්තකාල, පුස්තකාලය 2.0 (Library 2.0) සහ පුස්තකාල පොදු අවකාශ (Library Commons) වැඩසටහන් හඳුන්වා දී ඇත. එමෙන්ම සෑම අංශයකම ප්‍රශංසාවට ලක් වූ ඉහළ ගුණාත්මක අගයෙන් යුත් තොරතුරු සාක්ෂරතා වැඩසටහන් බොහෝ විශ්වවිද්‍යාල මගින් පවත්වා ගෙන යනු ලබයි. මෙම පියවර සියල්ල ශාස්ත්‍රීය පරිසරය තුළ පුස්තකාලයේ තත්ත්වය වැඩි දියුණු කිරීමට උපකාරී වේ. ඩිජිටල් පරිසරය තුළ කටයුතු කිරීමෙන් සහ නවතම තාක්ෂණික සංවර්ධන ව්‍යවහාරයන්ට අනුගත වීමෙන් මෙම තත්ත්වය තවදුරටත් ශක්තිමත් කළ හැකිය. සෑම සතියකම පාහේ තොරතුරු ක්ෂේත්‍රය තුළ නව සහ උණුසුම් සොයා ගැනීම් සිදුවේ. පුස්තකාලයාධිපතීන් දක්ෂ නම්, ඔවුන්ට 21 සියවසේ තොරතුරු ව්‍යවහාර යොදා ගනිමින් ශාස්ත්‍රීය ආයතන පාලනය කිරීමට හැකියාව ඇත.

### 3.6. <u>සම්පත් වෙන් කිරීම සහ සම්පත් කළමනාකරණය</u>

i. ප්‍රමාණවත් සම්පත් නොමැතිව කිසිදු ආයතනයකට පැවතිය නොහැක. ලොව පුරා පැතිර යන ආර්ථික දුෂ්කරතා සමග පුස්තකාල සඳහා සම්පත් වෙන් කිරීම නිරන්තර ගැටලුවක් වේ. පිරිවැය කප්පාදු කිරීමේ දී බොහෝ විට පුස්තකාල පහසු ඉලක්කයක් වේ. ස්වකීය බාහිර උපාධි වැඩසටහන්, පශ්චාත් උපාධි වැඩසටහන් සහ වෙනත් පාඨමාලා හරහා පීඨ හා ආයතනවලට මුදල් ඉපයිය හැකි වුව ද පුස්තකාලවලට එවන් මාර්ග නොමැත. පුස්තකාලවලට අඛණ්ඩව ප්‍රමාණවත් සම්පත් අවශ්‍ය බව කළමනාකරණයට ඒත්තු ගැන්වීමත් අතිරේක සම්පත් සඳහා විකල්ප මාර්ග සොයා ගැනීමත් පුස්තකාලයාධිපතීන්ට ඇති අභියෝගයකි.

ii. උසස් තත්ත්වයේ පුස්තකාල හා තොරතුරු සේවාවක් පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් වාර්ෂික ප්‍රතිපාදන විශ්වවිද්‍යාල පුස්තකාලවලට ලැබිය යුතුය. වර්තමානයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සෑම විශ්වවිද්‍යාලයකටම වාර්ෂික ප්‍රතිපාදන සපයන අතර, එහිදී විවිධ පීඨ සහ පරිපාලනයට ප්‍රමුඛත්වය ලැබේ. බොහෝ විට පුස්තකාලයට

ඊට හිමි සාධාරණ කොටස නොලැබේ. විශ්වවිද්‍යාල පුස්තකාලවල මෙහෙයුම් සහ සේවා සඳහා මෙය දැඩිව බලපායි.

iii. මෙම තත්ත්වය පිළිබඳ නිවැරදි චිත්‍රයක් ලබා ගැනීමට විශ්වවිද්‍යාල පුස්තකාල 15හිම තත්වය සොයා බැලීමට පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට පුළුවන. එමෙන්ම ලෝකයේ වෙනත් රටවල විශ්වවිද්‍යාලවලට වෙන් කරන සම්පත් පරීක්ෂා කර විශිෂ්ට ව්‍යවහාරයන් හඳුනා ගත යුතුය. සම්පත් වෙන් කිරීමේ වත්මන් විෂමතාව සමහන් කිරීමට එක්කෝ පුස්තකාල ප්‍රතිපාදන විශ්වවිද්‍යාලවලට වෙනම යැවිය හැකිය. නැතහොත් විශ්වවිද්‍යාලය, පුස්තකාලය සඳහා වාර්ෂික ප්‍රතිපාදනවලින් නියත ප්‍රතිශතයක් වෙන් කිරීමේ ප්‍රමිත ව්‍යවහාරය අනුගමනය කළ යුතුය. එසේත් නැත්නම් ඊටත් වඩා පිළිගත හැකි වෙනත් විසඳුමක් සොයා ගත යුතුය.

iv. විශ්වවිද්‍යාල පුස්තකාල වැඩිදියුණු කළ හැකි තවත් ක්‍රමයක් වන්නේ විවෘත බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ පොත් ආනයනය කිරීමට පහසුකම් සැලසීමය.

3.7. <u>කාර්ය මණ්ඩලය/සේවක සංඛ්‍යාව</u>

i. වෘත්තීය සහ අර්ධ වෘත්තීය පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා ඇති වත්මන් බඳවා ගැනීමේ ප්‍රතිපත්ති ඇගයීම. මෙම වර්ග දෙක සඳහාම බඳවා ගැනීමේ දී වෘත්තීය සුදුසුකම් වර්තමානයේ අවශ්‍ය නොවේ.

ii. විශ්වවිද්‍යාලීය ආචාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ සුදුසුකම්වලට මෙය සමාන බැවින් පුස්තකාලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයට අධ්‍යයන තත්ත්වය ලබා ගැනීමට මෙම ක්‍රමය උපකාර වී ඇත. ආචාර්ය මණ්ඩලය ඔවුන් ඉගෙන ගත් විෂය ඉගැන්වීමට බඳවා ගත් මොහොතේ සිට හැකි වුවද, පුස්තකාල කාර්ය මණ්ඩලයට ප්‍රවේශ වීමට සිදුවනුයේ පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය යන තමන් නොදන්නා කලාපයකටය.

iii. වෙනත් පුස්තකාල ක්ෂේත්‍රවල (ජාතික, විශේෂ, මහජන ආදී) අර්ධ වෘත්තීය කාර්ය මණ්ඩලයට පුස්තකාල හා විඥාපන විද්‍යා සුදුසුකම් අවශ්‍ය වේ. මෙම සුදුසුකම් ඔවුනට පුස්තකාල ද්‍රව්‍ය තේරීම, ඇණවුම් කිරීම, සුචිකරණය, වර්ගීකරණය, තාක්ෂණික සේවා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට සම්බන්ධ කටයුතු ඇතුළු පුස්තකාල කාර්යයන්ගෙන් විශාල කොටසකට උර දීමට හැකියාව ලබා දෙයි. විශ්වවිද්‍යාලයේ වෘත්තීය සුදුසුකම්වලින් තොර අර්ධ වෘත්තීය කාර්ය මණ්ඩලවලට අවශ්‍ය ප්‍රවීණත්වය ලබා ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් පුහුණුව ලබා දිය යුතුව ඇත. මෙම තත්වය විශ්වවිද්‍යාල පුස්තකාලවල කාර්ය සාධනයට බලපා ඇත. එසේම අර්ධ වෘත්තීය

කාර්ය මණ්ඩල බඳවා ගැනීම දේශපාලන නිර්දේශ මත සිදුවන්නකට වඩා ඔවුන්ගේ කුසලතා, නිපුණතා, ශාස්ත්‍රීය/වෘත්තීය සුදුසුකම් මත සිදු විය යුතුය.

3.8. <u>පුහුණුව/ධාරිතා ගොඩනැංවීම</u>

i. විශ්වවිද්‍යාල පුස්තකාල කාර්ය මණ්ඩලයට තොරතුරු සාක්ෂරතාව, ග්‍රන්ථ විද්‍යාත්මක උපදෙස්, වෙබ් අඩවි සැලසුම් කිරීම හා නඩත්තුව, පාඩම් සැලසුම් කිරීම, පර්යේෂණ කුසලතා ඇතුළු විශේෂ ක්ෂේත්‍ර ගණනාවක පුහුණුව සහ ධාරිතා ගොඩනැංවීම අවශ්‍ය වේ.

ii. ශාස්ත්‍රීය පුස්තකාලවල මතුවෙමින් පවත්නා භූමිකාව සමග පුස්තකාල තුළ නව තනතුරු ඇති කිරීමේ අවශ්‍යතාව මතු වී ඇත. උදා: විෂය විශේෂඥයන්, තොරතුරු සාක්ෂරතා විශේෂඥයන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/මාධ්‍ය විශේෂඥයන්, ඩිජිටල් පුස්තකාල කළමනාකරු ආදී

iii. විශ්වවිද්‍යාල පුස්තකාලයේ අර්ධ වෘත්තීය කාර්ය මණ්ඩලවලට පුස්තකාල හා තොරතුරු විද්‍යා වෘත්තීය සුදුසුකම් නොමැති නිසා ඔවුනට නිරන්තරයෙන් ධාරිතා ගොඩනැංවීම් සහ වෙනත් පුස්තකාල හා තොරතුරු විද්‍යා පුහුණු වැඩසටහන් අවශ්‍ය වේ. අර්ධ වෘත්තීය කාර්ය මණ්ඩලවලට වෘත්තීය සුදුසුකම් නොලත් පුද්ගලයන් බඳවා ගැනීමේ පැරණි ව්‍යවහාරය මුල් කාලයේ දීම ඉවත් කළ යුතුව තිබිණි. වර්තමානයේ රැකියා වෙළඳපොළ තුළ පුස්තකාල හා තොරතුරු විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ විශේෂ ක්ෂේත්‍රවල සුදුසුකම් ලත් පුද්ගලයන් සිටිති. එවන් පුද්ගලයන් බඳවා ගැනීම විශ්වවිද්‍යාල පුස්තකාවලට ඉමහත් ප්‍රයෝජනයක් වනු ඇත.

iv. ශාස්ත්‍රීය වටපිටාව තුළ ජ්‍යෙෂ්ඨ මෙන්ම මධ්‍යම මට්ටමේ කාර්ය මණ්ඩලයට පුස්තකාල හා තොරතුරු විද්‍යා කුසලතාවලට අමතරව භාෂා කුසලතා, මෘදු කුසලතා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා අවශ්‍ය වේ.

v. විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සිය ධාරිතා ගොඩනැංවීම සඳහා HETC, NODES සහ වෙනත් සමාන ව්‍යාපෘතිවලින් සහාය ගත යුතුය.

vi. ආචාර්ය මණ්ඩලයට ලබා දෙන පහසුකම්වලට සමානව විශ්වවිද්‍යාල පුස්තකාල කාර්ය මණ්ඩලයට ද විදේශ පුහුණුව සඳහා පහසුකම් ලබා ගැනීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය හඬ නැංවිය යුතුය.

3.9. <u>සංවිධානය සහ ප්‍රවේශය</u>

i. ඩිජිටල් එකතු සඳහා වැඩි අවධානයක් යොමු කරමින් විශ්වවිද්‍යාල පුස්තකාල එකතු සංවිධානය වර්ධනය කිරීම

ii. ගුණාත්මක ග්‍රන්ථ විඥාපන පාලනයක් හඳුන්වා දීම

iii. ගුණාත්මක තොරතුරු සේවාවක් සහ පාඨක සේවාවක් සංවර්ධනය කිරීම

iv. ඩිජිටල්කරණ, අන්තර්ජාල පහසුකම් සහ වෙබ් පාදක සේවා හඳුන්වා දීම

v. විශ්වවිද්‍යාල පුස්තකාලවල සේවා තක්සේරු කිරීමට සහ වැඩිදියුණු කළ යුතු ආකාරය පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම

vi. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලවල සේවා වෙනත් රටවල ඊට සමාන පුස්තකාල සමග සැසඳීම

vii. නව සේවා හඳුන්වා දීමටත් පවත්නා සේවා වැඩිදියුණු කිරීමටත් විශ්වවිද්‍යාල පුස්තකාලවලට සහාය වීම

viii. එකතුන් වෙත දුරස්ථ ප්‍රවේශය ක්‍රමයෙන් වර්ධනය කිරීම

3.10. <u>පුස්තකාල ගොඩනැගිලි/ගෘහ භාණ්ඩ</u>

<u>පුස්තකාල ගොඩනැගිලි</u>

i. විශ්වවිද්‍යාල පුස්තකාලය තොරතුරු හා සම්බන්ධිත ක්‍රියාකාරකම්වල හදවත මෙන්ම කේන්ද්‍රස්ථානය බව විශ්වවිද්‍යාල බලධාරීන් පිළිගත යුතුය. එය පර්යේෂණ මෙන්ම තොරතුරු බෙදාහැරීමේ මධ්‍යස්ථානය වන අතර පුළුල් තොරතුරු ලෝකය වෙතට කවුළුවකි. එහෙයින් විශ්වවිද්‍යාල පුස්තකාලය සියලු අවශ්‍ය පහසුකම් සහිත ආකර්ශනීය සහ ඉඩකඩ ඇති ගොඩනැගිල්ලක් විය යුතුය.

ii. වර්තමානයේ බොහෝ විශ්වවිද්‍යාල පුස්තකාලවලට වෙනම ගොඩනැගිල්ලක් තිබේ. එය මීට දශක කීපයකට පෙර තත්වය හා සැසඳීමේ දී සාධනීය තත්ත්වයකි.

iii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම යටතේ පවතින ඇතැම් පශ්චාත් උපාධි ආයතන හා ආයතනවල පුස්තකාල අවකාශ/ගොඩනැගිලි වැඩිදියුණු විය යුතුය.

iv. සිසුන් සඳහා වැඩි නිදහසක් සහ පහසුකම් සලසන (පුස්තකාලය 2.0, පුස්තකාල පොදු අවකාශ) නව පුස්තකාල අභ්‍යන්තර සැලසුම් පුළුල් ලෙස හඳුන්වා දිය හැකිය.

**පුස්තකාල ගෘහ භාණ්ඩ**

i. සියලුම විශ්වවිද්‍යාල පුස්තකාල පාඨකයන්ගේ ප්‍රයෝජනය මෙන්ම, පුස්තකාලයේ සහ විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය සඳහා නවීන, ගුණාත්මක ගෘහ භාණ්ඩ ලබා ගත යුතුය. වර්තමානයේ විශ්වවිද්‍යාල පුස්තකාල ගණනාවකට විශාල ගොඩනැගිලි පැවතිය ද ඒවායින් බහුතරයකට යෝග්‍ය හෝ ගුණාත්මක ගෘහභාණ්ඩ නොමැත. එය සමස්ත පුස්තකාලය පිළිබඳ නිශේධනාත්මක බලපෑමක් කරයි.

ii. දිගු වේලාවක් අධ්‍යයන හා පර්යේෂණයන් හි යෙදීම සඳහා සුවපහසුආසන පහසුකම් පාඨකයන්ට තිබිය යුතුය. එමෙන්ම දිගු වේලාවක් සේවය කිරීම සඳහා කාර්ය මණ්ඩලයට ද සුවපහසු ආසන ඇතුළු භාණ්ඩ පැවතිය යුතුය. විද්‍යාත්මකව සැලසුම් වූ පුස්තකාල ගෘහභාණ්ඩ ඒවා භාවිත කරන අයට ප්‍රියමනාප වන අතර ආකර්ෂණයෙන් ද වැඩිවේ.

iii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පුස්තකාල ගොඩනැගිලි සැලසුම්වල සහ නවීන පුස්තකාල ගෘහභාණ්ඩවල විවිධ වර්ග පිළිබඳ දත්ත පදනමක් පවත්වා ගෙන යා යුතුය.

3.11. **උපාය මාර්ගික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම**

විශ්වවිද්‍යාල පුස්තකාලය විශ්වවිද්‍යාලයේ කොටසක් නිසා විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලැස්මෙන් පුස්තකාලය ද ආවරණය වනු ඇත. එහෙත් පුස්තකාලය සඳහා වෙනම උපායමාර්ගික සැලැස්මක් ගොඩනැංවීම වාසිදායක වේ. උසස් අධ්‍යාපනය වෙත අවස්ථා හා ප්‍රවේශය ඉහළ නැංවීම සහ නව ලෝක මට්ටමේ විශ්වවිද්‍යාල වෙතට මෙරට වත්මන් විශ්වවිද්‍යාල පරිවර්තනය කිරීම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අභිමතාර්ථ වේ. ශාස්ත්‍රීය පුස්තකාලවල උපායමාර්ගික සහ ක්‍රියාකාරී සැලසුම්වල මෙම අභිමතාර්ථ පිළිඹිබු විය යුතුය.

i. ශාස්ත්‍රීය පුස්තකාලවලට ගුණාත්මක උපායමාර්ගික සැලසුම් සංවර්ධනය කිරීමට සහාය වීම

ii. මෙම ක්‍රියාවලියට කවරෙක්, කවර අවස්ථාවක සම්බන්ධ විය යුතුද, සංවිධානය කවර ස්ථානයක් වෙත ගමන් කළ යුතුද, එය කෙසේ කළ යුතුද යන්න නිශ්චය කළ යුතුය.

iii. ලිඛිත උපායමාර්ගික සැලැස්මක් සැකසීම

iv. මෙම සැලසුම් වාර්ෂිකව විමසුමට ලක් කිරීම

v. උපායමාර්ගික සැලසුම මත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම

vi. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මෙම උපායමාර්ගික සැලසුම්වල විශිෂ්ට ව්‍යවහාර අගය කිරීමට පියවර ගත යුතුය

3.12. <u>උද්දේශන න්‍යාය පත්‍රය</u>

i. සිය වගකීම් සපුරා ගැනීම සඳහා විශ්වවිද්‍යාල පුස්තකාලවලට ශක්තිමත් උද්දේශන වැඩසටහනක් අවශ්‍ය වේ.

ii. උද්දේශන න්‍යාය පත්‍රයක් සැකසීම

iii. උද්දේශන කණ්ඩායම හඳුනා ගැනීම

iv. අනෙක් පාර්ශ්වවලින් සහාය ලබා ගැනීම

v. ශක්තිමත් උද්දේශන ව්‍යාපාරයක් දියත් කිරීම

3.13. <u>ආචාරධර්ම පද්ධතිය අනුගමනය කිරීම</u>

i. ප්‍රධාන ක්ෂේත්‍ර : තොරතුරු වෙත ප්‍රවේශය, පුද්ගලයා සහ සමාජය වෙත වගකීම, පෞද්ගලිකත්වය, රහස්‍යභාවය හා විනිවිදභාවය, විවෘත ප්‍රවේශය සහ බුද්ධිමය දේපළ, ජාලකරණය, පුද්ගල අවංකත්වය සහ වෘත්තීය කුසලතා/ආචාරධර්ම, සමපදස්ථ සහ සේව්‍ය/සේවක සබඳතාව

ii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වෘත්තියවේදී ආකාරයක් තුළ ආචාරධර්ම පද්ධතිය මෙහෙයවීම

3.14. <u>සේවා සහ තත්ත්ව ඇගයීම</u>

i. ශාස්ත්‍රීය පුස්තකාලවලට සම්බන්ධ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ තත්ත්ව සහතික සහ පිළිගැනීම කවුන්සලයේ කාර්ය වැඩිදියුණු කිරීම

ii. විශ්වවිද්‍යාල පුස්තකාලවල සේවා තක්සේරු කිරීම සඳහා පුස්තකාල හා විඥාපන විද්‍යා ස්ථාවර කමිටුවේ (SCOLIS) සහයෝගය ඇතිව ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වාරික තත්ත්ව ඇගයීම් කිරීම

iii. අවම වශයෙන් වසර තුනකට වරක් ස්වකීය තත්ත්ව ඇගයීම් වැඩසටහන් පැවැත්වීමට විශ්වවිද්‍යාල පුස්තකාල ප්‍රවර්ධනය කිරීම

iv. ස්වකීය ව්‍යාපෘති/නිබන්ධන සඳහා විශ්වවිද්‍යාල පුස්තකාලවල විවිධ සේවා සහ අංශ තුළ තත්ත්ව ඇගයීම් ව්‍යාපෘති පැවැත්වීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ, කැලණිය විශ්වවිද්‍යාලයේ සහ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ සිසුන් දිරිමත් කිරීම

v. විශ්වවිද්‍යාල පුස්තකාලවල සේවා තත්ත්ය මැනීම සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සේවා තත්ත්ව මානයන් හඳුනා ගැනීම/සංවර්ධනය කිරීම (උදා: මාර්ගෝපදේශ, රැඳී සිටින වේලාව, සේවාවේ ගුණාත්මක බව, තොරතුරුවල ගුණාත්මක බව, උපකරණවල ගුණාත්මක බව, පුස්තකාල පරිසරයේ ගුණාත්මක බව, ප්‍රතිචාරාත්මක බව, සන්නිවේදනය)

vi. විශ්වවිද්‍යාල පුස්තකාලවල කාර්ය මණ්ඩල සඳහා තත්ත්ව ඇගයීම පිළිබඳ පුහුණු වැඩසටහන් මාලාවක් පැවැත්වීම

## 4. පාසල් පුස්තකාල අංශය

**පූර්විකාව**

පාසල් පුස්තකාලයේ අරමුණ වන්නේ ස්වකීය තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සිසුන්ට හා ගුරුවරුන්ට සහාය වීමය. එය අදාළ සහ විශ්වසනීය තොරතුරු සොයා ගැනීමට දන්නා ස්වයං-මෙහෙයවීමක් සහිත ඉගෙනුම්කරුවෙකු වන තොරතුරු සාක්ෂරතාවෙන් යුත් සිසුවකුගෙන් අපේක්ෂා කරනුයේ පාසල් මට්ටමේ දී සිය අධ්‍යයනයන් සාර්ථකව සම්පූර්ණ කර පසුව රටෙහි වගකිව යුතු සහ ආදර්ශ පුරවැසියෙකු බවට පත් වීමය.

### 4.1. ව්‍යවස්ථා

(අ) ගුරුපුස්තකාලයාධිපති කාර්ය මණ්ඩලය ගුරු සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම සඳහා ගුරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුය. පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථාන පවත්වා ගෙන යාමට පාසල්වලට ගුරුපුස්තකාලයාධිපතීන් පත් කිරීමට මෙය තීරණාත්මක පූර්ව කොන්දේසියක් වේ.

(ආ) මධ්‍යම රජයේ සහ පළාත් සභා පාසල්වල පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම අනිවාර්ය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය හඬ නැගිය යුතුය

(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශ්‍ය සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය පාසල් පුස්තකාලවල සේවය කිරීම සඳහා යොදවන ගුරුපුස්තකාලයාධිපතීන් හා රජයේ පුස්තකාලයාධිපතීන්ගේ අනුපාත ක්‍රමයක් හඳුන්වා දිය යුතුය.

### 4.2. ප්‍රමිති

(අ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධණ අංශය නිකුත් කර ඇති පාසල් පුස්තකාල ප්‍රමිති ප්‍රවර්ධනය කිරීම

(ආ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, මෙරට තුළ අන්තර්ජාතික පුස්තකාල සංගමය සහ ඉෆ්ලා මගින් හඳුන්වා දෙන ලද පාසල් පුස්තකාල ප්‍රමිති ප්‍රවර්ධනය කළ යුතුය

(ඇ) නව සහ මතුවෙමින් පවත්නා තත්ත්වයන් සලකා බලමින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් සම්පාදනය කරන ලද වත්මන් පාසල් පුස්තකාල ප්‍රමිති වර්ධනය කිරීම

(ඈ) අන්තර්ජාතික සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල ප්‍රමිති සලකා බලමින් (අවශ්‍ය නම්) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ස්වකීය වූ පාසල් පුස්තකාල ප්‍රමිති හඳුන්වා දීම

(ඉ) පවත්නා පාසල් පුස්තකාල ප්‍රමිති අනුගමනය කිරීමට ඇතැම් පාසල් බලධාරීන්ගේ නොහැකියාව සඳහා හේතු හඳුනා ගැනීමට පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම සහ එහි ප්‍රතිඵල අධිකාරීන්ට දැනුම් දීම

(ඊ) පවත්නා පාසල් පුස්තකාල ප්‍රමිති වර්ධනය කර ඒවා අනුගමනය කිරීමටත් පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීමටත් පාසල් පුස්තකාල බලධාරීන්ට බලපෑම් කිරීම

(එ) පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානයට මනා ප්‍රමිති උකහා ගැනීම සඳහා උපකාර වීමට සහ එය අධීක්ෂණය කිරීමට කලාප අධ්‍යාපන බලධාරීන්, පාසල් පුස්තකාල කමිටු, ගුරු දෙගුරු සංගම් සහ (අවශ්‍ය අවස්ථාවල) මහජන පුස්තකාල කමිටු හරහා ප්‍රාදේශීය ප්‍රජාව සහභාගි කර ගැනීම

(ඒ) පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානවලට විකල්ප ලෙස කුඩා පාසල් සඳහා පංති පුස්තකාල, පොත් මුළු යනාදිය වෙන්වෙන් නියමු සැකසීම

(ඔ) ශාස්ත්‍රීය සඟරා, පුවත් පත්‍රිකා, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා හරහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වෙනත් සාමාජිකයන් සමග ස්වකීය අත්දැකීම් බෙදා හදා ගැනීමට පාසල් පුස්තකාල අංශයේ පුස්තකාලයාධිපතීන් දිරිමත් කිරීම

(ඕ) රට තුළ ජාත්‍යන්තර පාසල්වල සහ පෞද්ගලික පාසල්වල පුස්තකාලයන්හි ගුණාත්මකභාවය සොයා බැලීමට පර්යේෂණ පැවැත්වීම

(උ) ජාත්‍යන්තර පාසල්වල සහ පෞද්ගලික පාසල්වල පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීමට උද්දේශන වැඩසටහනක් දියත් කිරීම

(ඌ) හොඳින් සංවර්ධිත හා ඌණ සංවර්ධිත පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථාන අතර (රජයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද) සබඳතා වැඩසටහන් දියත් කිරීම මෙන්ම චාරිකා හා අත්දැකීම් බෙදා හදා ගැනීමට පියවර ගැනීම

## 4.3. <u>පරිපාලන සහ සහායක යාන්ත්‍රණය ශක්තිමත් කිරීම</u>

රටෙහි පාසල් පුස්තකාල අංශය වර්ධනය කිරීමට දැනටමත් ගුණාත්මක පරිපාලන හා සහායක යාන්ත්‍රණයක් තිබේ. මෙම යාන්ත්‍රණය බෙහෙවින් අක්‍රීයය. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට වෘත්තියවේදී සංසදය ලෙස අනෙකුත් බලධාරීන්ගේ සහාය ඇතිව මෙම යාන්ත්‍රණය ක්‍රියාකාරී කිරීමට විශාල කාර්යයක් කළ හැකිය.

(අ) අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය ශක්තිමත් කිරීම (පාසල පුස්තකාල සංවර්ධන ඒකකයේ වැදගත්කම හඳුනා ගැනීමටත් එය සුදුසුකම් ලත් මෙන්ම උද්‍යොගිමත් කාර්ය මණ්ඩලයකින් සමන්විත කිරීමටත් එය මනාව ක්‍රියාත්මක වීම සඳහා ප්‍රමාණවත් සම්පත් ලබා දීමටත් අධ්‍යාපන අමාත්‍යාංශයට බල කිරීම)

(ආ) පළාත් සහ කලාපීය මට්ටමේ පාසල් පුස්තකාල ඒකක ශක්තිමත් කිරීම (මේවා සමහරක අතීතයේ දී මැනවින් ක්‍රියාත්මක වූ අතර ඒවා තවදුරටත් ශක්තිමත් කිරීමට අධීක්ෂණය කිරීමත් අවශයය)

(ඇ) පළාත් පුස්තකාල සේවා මණ්ඩල ශක්තිමත් කිරීම (වර්තමානයේ පළාත් හතරක පුස්තකාල සේවා මණ්ඩල ක්‍රියාත්මක වේ. මෙම ආයතනවලට මෙහෙයවීම, වෘත්තීය මගපෙන්වීම සහ සම්පත් අවශ්‍යය. පවත්නා පළාත් පුස්තකාල සේවා මණ්ඩලවල කාර්ය සාධනය ඉහළ නැංවීමටත් අනෙක් පළාත්වල පුස්තකාල සේවා මණ්ඩල අලුතින් පිහිටුවීමටත් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සමග එක්ව ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ඒකාබද්ධ ව්‍යාපෘතියක් දියත් කළ යුතුය. වඩාත් සාධනීය ආකාරවලින් පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානවලට උපකාර කිරීමට මෙම මණ්ඩලවලට හැකියාව ඇත.)

(ඇ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ එහි වෘත්තිය සේවා අංශය ශක්තිමත් කිරීම. (පළාත් සභා පුස්තකාල ව්‍යාපෘතිය හඳුන්වා දීමේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය නායකත්වය සපයා මූලිකත්වය ගත් අතර ලෝක බැංකු ආධාර සහිත පාසල් පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතීන්හි ද ප්‍රධාන භූමිකාවක් රඟ දැක්වීය)

(ඉ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාසල් පුස්තකාල කණ්ඩායම ශක්තිමත් කිරීම

(ඊ) පාසල්වල පුස්තකාල කමිටු ශක්තිමත් කිරීම

## 4.4. <u>පාසල් පුස්තකාල ගොඩනැගිලි/ගෘහ භාණ්ඩ හා උපකරණ</u>

(අ) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පළාත් මට්ටමින් ස්ථාපිත කරන ලද ආදර්ශ පළාත් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථාන වර්ධනය හා නවීකරණය කළ යුතුය. මෙම ආදර්ශය විශාල පාසල්වලට සුදුසු වන අතර මධ්‍යම හා කුඩා පාසල්වලට අවම වශයෙන් තවත් ආදර්ශ දෙකක් හඳුන්වා දිය යුතුය. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට මෙම ආදර්ශ දෙක නිර්මාණය කර සලකා බැලීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට සහ පළාත් සභාවලට යැවිය හැකිය.

(ආ) පළාත් සහ ජාතික මට්ටමින් කලින් කලට පාසල් පුස්තකාල ගොඩනැගිලි පිළිබඳ වෘත්තියවේදී සංවාදයක් දියත් කිරීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට පුළුවන. මේ සඳහා බලධාරීන්ට සහාය වීමට පාසල් පුස්තකාල ගොඩනැගිලි/ගෘහ භාණ්ඩ සැලසුම් පිළිබඳ ජාතික තරඟයක් පැවැත්වීමට එයට හැකි අතර රටේ ප්‍රමුඛ ගෘහනිර්මාණ ශිල්පීන්ට සහ ගෘහ නිර්මාණ ශිල්පය හදාරණ සිසුන්ට ඊට සහභාගී වීමට දිරිමත් කළ හැකිය. මෙම මෙම සැලසුම් ප්‍රදර්ශනයක් ඉදිරිපත් කළ හැකි අතර හොඳම සැලසුම්වලට පිළිගැනීමක් ලබා දිය හැකිය. මේ සඳහා අනුග්‍රාහකයන් සොයා ගැනීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට හැකි වේ නම් එය ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වසර කීපයකට වරක් පවත්වන ප්‍රධාන කාර්යයක් වනු ඇත.

(ඇ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වෙනත් රටවල ගුණාත්මක පාසල් පුස්තකාල ගොඩනැගිලි සහ පාසල් පුස්තකාල ගෘහ භාණ්ඩ පිළිබඳ දත්ත පදනමක් ගොඩ නැංවිය යුතුය.

## 4.5. <u>පුස්තකාලයේ ස්ථානය සහ සංවිධානය තුළ එහි භූමිකාව</u>

පාසල් අධ්‍යාපන පද්ධතිය තුළ තමන්ට නිසි ස්ථානය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල ආරම්භයේ සිටම එතරම් සාර්ථකත්වයෙන් තොර අරගලයක යෙදී සිටී. පාසල්

විශාල ප්‍රමාණයකට පුස්තකාල නොමැති අතර පුස්තකාල තිබෙන පාසල් පවා වෘත්තියවේදී පුස්තකාලයාධිපතීන්ගේ හිඟය, සම්පත් හිඟය වැනි දුෂ්කරතාවලට මුහුණ දෙමින් සිටී.

(අ) පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහාය ඇතිව ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පාසල් පද්ධතිය තුළ පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානයේ වටිනාකම පිළිගැනීම සඳහා බලධාරීන්ට බලපෑම් එල්ල කිරීම

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් සභා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ එක් රැස් කර අධ්‍යයනය කිරීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය කටයුතු කිරීම සහ කලින් කලට ඒවා වැඩි දියුණු කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම

(ඇ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පාසල් පුස්තකාල ප්‍රවර්ධනය සඳහා ජාතික ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම

(ඈ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පාසල් පුස්තකාල සේවාවන්හි ගුණාත්මක බව සොයා බැලීමට බිම්මට්ටමෙන් (කලාප, දිස්ත්‍රික්ක) වාරික සමීක්ෂණ පැවැත්වීම සහ ඒවා ප්‍රකාශයට පත් කිරීම

4.6. <u>සංවිධානය තුළ පුස්තකාලයාධිපතිගේ තත්ත්වය</u>

(අ) සෑම පාසල් පුස්තකාල සම්පත් මධ්‍යස්ථානයකටම වෘත්තීය සුදුසුකම් ලත් ගුරුපුස්තකාලයාධිපතිවරයෙකු හෝ පාසල් පුස්තකාලයාධිපතිවරයෙකු මෙන්ම සහායක කාර්ය මණ්ඩලයක් සිටිය යුතු බවට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය බලධාරීන්ට ඒත්තු ගැන්වීම

(ආ) පාසල් ආචාර්ය මණ්ඩලය හා සමානව ගුරුපුස්තකාලයාධිපතිට සහ පාසල් පුස්තකාලයාධිපතීන්ට සැලකීමට උපදේශක චක්‍රලේඛ හරහා පාසල් බලධාරීන් දැනුවත් කිරීමට අධිකාරින් පෙළඹවීම

(ඇ) පුස්තකාලයාධිපති ගුණාත්මක පුස්තකාල හා තොරතුරු සේවාවක් පවත්වා ගෙන යා යුතු අතර ගුරුවරුන් සහ සිසුන් තොරතුරු අවශ්‍යතා සපුරා ලීමට සහාය විය යුතුය

(ඈ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය සමග එක්ව ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මෙම විෂය පිළිබඳ පාසල් බලධාරීන් දැනුවත් කිරීමට අවශ්‍ය නියමු, චක්‍රලේඛ නිකුත් කළ යුතුය

(ඉ) දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මට්ටමින් පවත්නා තත්ත්වය සොයා බැලීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සමීක්ෂණ පැවැත්වීම

## 4.7. <u>කෙටිකාලීන හා දිගුකාලීන අභිමතාර්ථ සහ සැලසුම්</u>

(අ) ගුරු පුස්තකාලයාධිපති/පාසල් පුස්තකාලයාධිපති පාසල් කළමනාකරණයේ, ගුරුවරුන්ගේ, සිසුන්ගේ සහ පුස්තකාල කමිටුවේ අදහස් සහිතව පසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානය සඳහා වාර්ෂික සැලැස්මක් සම්පාදනය කළ යුතුය.

(ආ) මෙම සලසුම් වාර්ෂිකව විමසුමට ලක් කළ යුතුය

(ඇ) අවශ්‍ය පුහුණුව සැපයීමෙන් සහ ආදර්ශ සැලසුම් ප්‍රකාශයට පත් කිරීම මගින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පුස්තකාලයාධිපතීන්ට සහාය විය යුතුය

(ඈ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මෙම සැලසුම්වල ගුණාත්මක බව සොයා බැලීමටත් දුර්වලතා හඳුනා ගැනීමටත් එම දුර්වලතා සකසා ගැනීමට පියවර ගැනීම සඳහාත් පර්යේෂණ වැඩසටහනක් දියත් කළ යුතුය

## 4.8. <u>කාර්ය මණ්ඩලය (බඳවා ගැනීම් පටිපාටිය, කාර්ය මණ්ඩල තත්ත්වය, පාරිතෝෂික, උසස්වීම්, අවස්ථා, වගකීම්, සුබසාධනය, පුහුණුව ආදිය)</u>

(අ) පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානය සුදුසුකම් ලත් පාසල් පුස්තකාලයාධිපතිවරයෙකු හෝ ගුරු පුස්තකාලයාධිපතිවරයෙකු යටතේ පැවතිය යුතුය. එය වෘත්තීය නොවන සහ පහළ ශ්‍රේණිවල කාර්ය මණ්ඩල විසින් පවත්වා ගෙන නොයා යුතුය

(ආ) ගුරු පුස්තකාලයාධිපතීන් සංඛ්‍යාව ස්ථාපිත කිරීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය හඬ නැංවිය යුතුය. ඉගැන්වීමේ කටයුතුවල යෙදෙන අතර පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානය පවත්වා ගෙන යාමට හොඳින්ම සන්නද්ධව සිටිනුයේ ගුරු පුස්තකාලයාධිපතිය

(ඇ) සියලුම ගුරු කාර්ය මණ්ඩල අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු සේවා ව්‍යවස්ථාවේ පරිපාලනය යටතට පැමිණේ. එහෙයින් ගුරු පුස්තකාලයාධිපති තනතුරු ස්ථාපිත කිරීමට එය ගුරු සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතුය

(ඇ) වර්තමානයේ සියලුම ගුරුවරුන්ට අධ්‍යාපනවේදී උපාධියක් සහ අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව තිබිය යුතු වේ. ගුරු පුස්තකාලයාධිපතීන්ට සුදුසු පටිපාටියක් සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය අධ්‍යාපන අමාත්‍යාංශය සමග සාකච්ඡා කළ යුතුය

(ඉ) (ඕනෑම විෂයකින් ප්‍රථම උපාධියක් සමග ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයෙන් පශ්චාත් උපාධි හෝ ඩිප්ලෝමා සුදුසුකමක් සහිතව) ගුරු සේවා ව්‍යවස්ථාවට ගුරු පුස්තකාලයාධිපතීන් අන්තර් ග්‍රහණය කිරීමට සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය මගින් දරන ලද උත්සාහයන් ව්‍යර්ථ වී තිබේ

(ඊ) අප දන්නා පරිදි, මෙම දුර්වල සබඳතාව 1996-2005 ලෝක බැංකු ආධාර ලද පාසල් පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතිය අතථ්‍ය ලෙස විභාග කරන ලදී. මෙයට විසඳුම් සෙවීම ඉදිරි වර්ෂ කීපය තුළ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ (ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ) විශාලතම අභියෝගයක් වනු ඇත

(එ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ජාත්‍යන්තර පාසල්වල සහ පෞද්ගලික පාසල්වල පුස්තකාල කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර සෙවීමට සමීක්ෂණයක් පවත්වා දත්ත පදනමක් ගොඩ නැංවිය යුතුය

(ඒ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පාසල් පුස්තකාලවල ප්‍රමිති, කාර්ය මණ්ඩල සුදුසුකම්, පුහුණුව, පාරිතෝෂික, වගකීම් ආදිය පිළිබඳ පෞද්ගලික පාසල්වල කළමනාකරණය දැනුවත් කළ යුතුය

4.9. <u>පුහුණුව</u>

(අ) වඩාත් නිපුණතා සහිත ගුරු/පාසල් පුස්තකාලයාධිපතීන් බිහි කිරීම සඳහා පුහුණු මධ්‍යස්ථානවල විෂයමාලා වැඩි දියුණු කිරීම සහ අධීක්ෂණය කිරීමට සහාය වීම

(ආ) පාසල් පුස්තකාල කළමනාකරණ වැඩි දියුණු කිරීමට සේවයේ නියුතු පුස්තකාලයාධිපතීන් සඳහා විශේෂ පුහුණු වැඩසටහන් දියත් කිරීම

(ඇ) ගුරු/පාසල් පුස්තකාලයාධිපතීන්ගේ ඩිජිටල් නිපුණතා වර්ධනය කිරීමට සහාය වීම

4.10. <u>සම්පත් වෙන් කිරීම සහ සම්පත් කළමනාකරණය</u>

(අ) පාසල් පුස්තකාලවල මනා අරමුදල් සම්පාදනය සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය උද්දේශන වැඩසටහන් දියත් කළ යුතුය

(ආ) පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථාන සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීමට මධ්‍යම රජය සහ පළාත් සභා පෙළඹවීම

(ඇ) වෙනත් මූලාශ්‍රවලින් අරමුදල් සොයා ගැනීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානයට උදව් කළ යුතුය

(ඈ) පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානය වෙනුවෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විශේෂ ව්‍යාපෘති ප්‍රවර්ධනය කළ යුතුය. උදා: පාසල් පුස්තකාල සතිය

4.11. <u>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය සහ ප්‍රවේශය</u>

සමහර පාසල්වලට තොරතුරු තාක්ෂණ විද්‍යාගාර තිබෙන අතර පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථාන සහ තොරතුරු තාක්ෂණ විද්‍යාගාර එක්ව කටයුතු කළ යුතුය. පාසල් පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානයට අන්තර්ජාල පහසුකම් තිබිය යුතු අතර සම්පත් වෙත ප්‍රවේශය ඉහළ නැංවීමටත් ගුරුවරුන් සහ සිසුන් සඳහා තොරතුරු සාක්ෂරතාව සැපයීමටත් එය යොදා ගත යුතුය

4.12. <u>ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේආචාරධර්ම පද්ධතිය අනුගමනය කිරීම</u>

(අ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය එහි ආචාරධර්ම පද්ධතිය පිළිබඳ ජාතික හා පළාත් මට්ටමේ අධ්‍යාපන බලධාරීන් මෙන්ම විදුහල්පතිවරුන් සහ පාසල් පුස්තකාල කමිටු දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය

(ආ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ආචාරධර්ම පද්ධතිය සමග පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ සියලු කාර්ය මණ්ඩල සංවාදගත වීම ගැන ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහතික කළ යුතුය

(ඇ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ආචාරධර්ම පද්ධතියට සම්බන්ධ විනය යාන්ත්‍රණයේ මනා ක්‍රියාකාරීත්වය සහතික කළ යුතුය

## 5. විශේෂ පුස්තකාල ක්ෂේත්‍රය

<u>**පූර්විකාව**</u>

විශේෂ පුස්තකාල ඒවා අයත්වන සංවිධානවල විවිධත්වය නිසා ඒවාට ආවේණික මට්ටමක පවතී. මෙම පුස්තකාලවල අභිමතාර්ථ සහ අරමුණු සංවිධානයේ අභිමතාර්ථ සහ අරමුණුවලට සමාන වන අතර පුස්තකාලයේ අභ්‍යන්තර මෙහෙයුම්වල ස්වාධීනත්වය ඊට සාපේක්ෂව සීමා

වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, ඒවා මුහුණ දෙන ගැටලු සහ ප්‍රශ්න විවිධ වන අතර ඒවායේ ඒකීයත්වයක් දැකිය නොහැක. එහෙයින් එම ගැටලු හා ප්‍රශ්නවලට පොදු විසඳුම් සැපයිය නොහැක. සංවිධානය තුළ පුස්තකාලයේ/තොරතුරු මධ්‍යස්ථානයේ තත්ත්වය එය රජයේ ද පොදු ද පෞද්ගලික ද රාජ්‍ය නොවන ද වෘත්තිය ද වෙනත් ආකාරයක් ද යන්න මත විවිධ වේ. සංවිධානය තුළ අනෙක් පරිපාලන, කළමනාකරණ හෝ පර්යේෂණ සගයන්ට සම්බන්ධ පුස්තකාල වෘත්තිකයන්ගේ තත්ත්වය පුස්තකාලයෙන් පුස්තකාලයට වෙනස්වන අතර එය පුස්තකාලයේ කාර්යයන් මත කැපී පෙනෙන ලෙස රඳා පවතී. එහෙයින් සංගමයේ උපාය මාර්ගික සැලසුම් සැකසීමට සහාය වීමේදී සහ විශේෂ පුස්තකාලවල අවශ්‍යතා තක්සේරු කිරීමේ දී මෙම සීමාවන් මතකයේ තබා ගත යුතු වේ.

## 5.1. <u>ව්‍යවස්ථා</u>

(අ) විශේෂ පුස්තකාල මව් සංවිධානයක කොටසක් හෝ ඒකකයක් නිසා මව් සංවිධානයේ ව්‍යවස්ථා පවතින්නේ නම් පුස්තකාලය ඊට යටත් වේ.

(ආ) පුස්තකාල සේවාව දියුණු කිරීමට අනුකූලව විශේෂ පුස්තකාලවල සෑම මව් සංවිධානයක්ම පවතින ව්‍යවස්ථා ශක්තිමත් කිරීමේ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා ව්‍යාපෘතියක් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විශේෂ පුස්තකාල කමිටුව විසින් දියත් කළ යුතුය.

(ඇ) එම ව්‍යාපෘතියෙන් පසු ශ්‍රී ලංකා පුස්තකාල සංගමය අවශ්‍ය ව්‍යවස්ථා සංශෝධනය කිරීම පිළිබඳ අදාළ බලධාරීන්ට උපදෙස් දීම

## 5.2. <u>පුස්තකාල ප්‍රමිති</u>

(අ) විශේෂ පුස්තකාල සඳහා ප්‍රමිති සම්පාදනය කිරීම පිළිබඳ IFLA මග පෙන්වීම් අධ්‍යයනය කිරීම

(ආ) විශේෂ පුස්තකාල සඳහා අනෙකුත් රටවල ඇති ප්‍රමිති අධ්‍යයනය කිරීම

(ඇ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සමග එක්ව විශේෂ පුස්තකාල වර්ග දෙකක් (මධ්‍යම සහ කුඩා) සඳහා පුස්තකාල ප්‍රමිති සංවර්ධනය කිරීම

## 5.3. <u>ඩිජිටල් පුස්තකාල පරිසරයක් නිර්මාණය කිරීම</u>

(අ) මාර්ගගත පොදු ප්‍රවේශ සූචි (OPAC)

(ආ) ඉහළ ගුණාත්මක බවකින් යුත් පුස්තකාල වෙබ් අඩවිය, වේගවත් අන්තර්ජාල ප්‍රවේශය

(ඇ) ඩිජිටල් පුස්තකාලයක් සංවර්ධනය කිරීම සඳහා පුස්තකාල එකතුවට දවස පුරා, දුරස්ථ සහ බහුවිධ ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීම

(ඉ) ඩිජිටල්කරණය : ජාතික පුස්තකාලයේ දුර්ලභ එකතුවෙහි වත්මන් ඩිජිටල්කරණය ව්‍යාප්ත කිරීම සහ ජාතික පුස්තකාලය තුළ ඩිජිටල්කරණ පහසුකම් ස්ථාපිත කිරීම

(ඊ) ඉලෙක්ට්‍රොනික විමර්ශන සේවාව : වරණීය තොරතුරු බෙදාහැරීම, ප්‍රවර්තන සම්ප්‍රජානන සේවා, අතථ්‍ය විමර්ශන මේස, පාඨක උපදේශන සේවා ආදිය

(එ) පාඨකයන්ගේ ඩෙස්ක්ටොප් පරිගණක, ලැප්ටොප් පරිගණක, ටැබ්ලට් හෝ ජංගම දුරකථනවලට තොරතුරු සැපයීම

(ඒ) පුස්තකාල කටයුතු සඳහා සමාජ මාධ්‍ය භාවිත කිරීම : මහජන සබඳතා වර්ධනය කිරීම, පාඨකයන් සමග සංවාද වර්ධනය කිරීම, ප්‍රචාරණය ආදිය

(ඔ) සම්පත් බෙදා හදා ගැනීම : ජාලකරණය, ඒකාබද්ධ සූචි, පුස්තකාල සහයෝගිතාව, ඉලෙක්ට්‍රොනික ලේඛන බෙදා හැරීම

(ඕ) මාර්ගගත තොරතුරු සාක්ෂරතා වැඩසටහන් සහ ඉලෙක්ට්‍රොනික් ඉගෙනුම් වැඩසටහන්

(ක) ප්‍රකාශන හිමිකම සහ බලපත්‍ර

(ග) බාකෝඩ්, RFID, ස්මාර්ට් කාඩ් තාක්ෂණයන් භාවිත කරමින් ජාතික පුස්තකාලයේ ආරක්ෂාව වැඩි කිරීම

(ච) අභියෝගවලට මුහුණ දීම : දුර්වල අරමුදල් සම්පාදනය, මෘදුකාංග හා දෘඩාංගවල නිරන්තර වෙනස්වීම, ප්‍රමාණවත් නොවන ක්ෂේත්‍ර පළල (Bandwidth), කාර්ය මණ්ඩලයේ තාක්ෂණික දැනුම සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණික දැනුමෙහි අඩුව

5.4. <u>සංවිධානය තුළ පුස්තකාලයේ ස්ථානය</u>

(අ) සංවිධානයේ පිළිගැනීමක් ඇති උචිත ධූරාවලි ව්‍යුහයක් තුළ පුස්තකාලය ස්ථානගත කළ යුතුය. (කෙසේ වෙතත් මානව සම්පත්, ව්‍යවහාරයන්, සමාගම් සැලසුම් ආදිය සම්පාදනයේ කොටසක් ලෙස පුස්තකාලය පවතින නිසා සමහර පුස්තකාලවල මෙය වෙනස් වේ.)

(ආ) වටිනාකම් ස්ථාපිත කිරීම හා සංවිධානයට අත්‍යවශ්‍යයෙන් අනුබද්ධ වූවක් ලෙස පුස්තකාලයේ ස්ථානය පවත්වා ගෙන යාමට එහි වටිනාකම් පිළිබඳ සාධක සහ එහි පැවැත්මේ අවශ්‍යතාව කළමනාකරණයට/අනුග්‍රාහකයන්ට සැපයිය යුතුය.

(ඇ) පිළිගැනීම - සංවිධානය තුළ සුවිශේෂ ස්ථානයක් ලෙස පිළිගැනීම හැමවිටම දෙන ලද්දක් නොවේ. එය ආමන්ත්‍රණය කළ යුතු දෙයකි.

5.5. <u>සංවිධානය තුළ පුස්තකාලයාධිපතිගේ තත්ත්වය</u>

(අ) පුස්තකාලයාධිපති සංවිධානයේ අනෙක් අංශ ප්‍රධානීන් හා සම මට්ටමක සිටිය යුතුය.

5.6. <u>සම්පත් වෙන් කිරීම සහ සම්පත් කළමනාකරණය</u>

(අ) සංවිධානය, පුස්තකාලය සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන් කළ යුතුය.

(ආ) පුස්තකාලයාධිපති විසින් ව්‍යාපෘති සහ අවශ්‍ය සම්පත් දක්වමින් උපායමාර්ගික සහ වාර්ෂික සැලසුම් සම්පාදනය කළ යුතුය.

(ඇ) දේශීය සම්පත්වලට අමතරව විදේශීය ආයතන හා විදේශීය රටවල්වලින් සම්පත් ලබා ගැනීමට උත්සාහ කළ යුතුය.

5.7. <u>කාර්ය මණ්ඩල/තනතුරු සංඛ්‍යාව</u>

(අ) පූර්විකාවේ සඳහන් කළ පරිදි, සෑම පුස්තකාලයකම පුස්තකාලයාධිපතිගේ තත්ත්වය පුස්තකාලයෙන් පුස්තකාලයට විශාල වශයෙන් වෙනස් වේ. කෙසේ වෙතත්, වත්මන් වැටුප්/තනතුරු සංඛ්‍යා/කළමනාකරණ නිලතල සමග තැබීමේ දී සංවිධානය තුළ පුස්තකාල කාර්ය මණ්ඩලයේ ස්ථාවර වෘත්තිය ප්‍රගතිය සහතික කිරීමට නියෝජනයන් කළ හැකි වේ. බොහෝ සංවිධානවල උසස්වීම සඳහා තීරණාත්මක සාධකය වන්නේ උපාධියක් තිබීමය. එවන් උසස් වීම් සඳහා පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමාවට පිළිගැනීමක් දිය හැකි වේ.

(ආ) අදාළ වනවිට, සංවිධානයේ බඳවා ගැනීම් නියමුවලට සමාන්තරව පුස්තකාලයේ සුදුසුකම්වලට නියමිත තත්ත්වය දිය යුතුය.

(ඇ) විශේෂ පුස්තකාලවල වත්මන් තනතුරු සංඛ්‍යා සහ බඳවා ගැනීම් පටිපාටි පිළිබඳ අධ්‍යයනයක් දියත් කිරීම සහ වර්ධනය කිරීමට අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගැනීම

(ඈ) දුෂ්කර කලාපවල විශේෂ පුස්තකාල සඳහා ගුණාත්මක කාර්ය මණ්ඩලයක් ලබා ගැනීමට යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම

5.8. <u>පුහුණුව/ධාරිතා ගොඩ නැංවීම</u>

(අ) විශේෂ පුස්තකාලවල පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම සහ පුහුණු සැලැස්මක් සංවර්ධනය කිරීමට ඔවුන්ට සහාය වීම

ආ) පළාත් පුස්තකාල කාර්ය මණ්ඩලයේ අත්‍යාවශ්‍ය නිපුණතා වර්ධනයට පුහුණු සහ ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම

(ඇ) ඔවුනට ජාතික සහ ජාත්‍යන්තර මට්ටම්වල පුහුණු අවස්ථා සුරක්ෂිත කිරීම සඳහා සහාය වීම

5.9. <u>සංවිධානය හා ප්‍රවේශය</u>

(අ) විශේෂිත ක්ෂේත්‍රයක් තුළ මනා යාවත්කාලීන එකතුවක් තිබීම විශේෂ පුස්තකාලයක ලක්ෂණයකි. පොදුවේ මූල්‍ය ප්‍රතිපාදන සීමා වීම නිසා ඉලෙක්ට්‍රොනිකව ප්‍රකාශන බෙදා හදා ගැනීමේ සතුටුදායක ක්‍රමයක් සැකසීම වැදගත් වේ.

(ආ) සෑම තොරතුරු අවශ්‍යතාවක් සඳහාම පාඨකයන් තවදුරටත් පුස්තකාලයට නොපැමිණෙන අතර ඔවුන් එම තොරතුරු තම පරිගණකය වෙත ඍජුවම සැපයෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. පුස්තකාලයාධිපතිගේ වගකීම වන්නේ එම තොරතුරු අප්‍රමාදව සැපයීමය. විවිධ ක්ෂේත්‍ර හරහා තොරතුරු බෙදා හදා ගැනීම ප්‍රවර්ධනය කිරීමේ දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පූර්ව ක්‍රියාකාරී විය යුතුය.

(ඇ) තොරතුරු, භාණ්ඩයක් ලෙස - බොහෝ සංවිධාන ලාභ ලැබීමට හුවමාරු කළ හැකි භාණ්ඩයක් ලෙස තොරතුරු දකී. මෙය ගෝලීය ප්‍රවණතාවක් වුව ද ඇතැම් විට තොරතුරු දැන ගැනීමේ අයිතිය සහ මූලධර්මයටත් පුස්තකාල අතර සහයෝගිතා ගිවිසුම්වලටත් එරෙහි වෙයි.

(ඈ) විශේෂ පුස්තකාල එකතු සංවිධානය වැඩි දියුණු කිරීම

(ඉ) ගුණාත්මක ග්‍රන්ථ විඥාපන පාලනයක් හඳුන්වා දීම

(ඊ) ගුණාත්මක තොරතුරු සේවා සහ පාඨක සේවා සංවර්ධනය කිරීම

(උ) ඩිජිටල්කරණ, අන්තර්ජාල පහසුකම් සහ වෙබ් පාදක සේවා හඳුන්වා දීම

(ඌ) විශේෂ පුස්තකාලවල සේවා තක්සේරු කිරීමට සහ එය සිදු කරන ආකාරය පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම

(එ) ශ්‍රී ලංකාවේ විශේෂ පුස්තකාල සේවාව අනෙක් රටවල එවන් සේවා සමග සැසඳීම

(ඒ) නව සේවා හඳුන්වා දීමට සහ පවත්නා සේවා දියුණු කිරීමට විශේෂ පුස්තකාලවලට සහාය වීම

(ඔ) එකතු වෙත දුරස්ථ ප්‍රවේශය ක්‍රමයෙන් වර්ධනය කිරීම

5.10. <u>පුස්තකාල ගොඩනැගිලි සහ ගෘහභාණ්ඩ</u>

(අ) පාඨක තෘප්තිය සහතික කිරීමට පුස්තකාලයක් විසින් සපයන පරිමණ්ඩලය සහ පහසුකම් ප්‍රමුඛ වන බව පිළිගත් සාධකයකි. මෙම ක්ෂේත්‍රය වෙත බොහෝ පුස්තකාල වැඩි අවධානයක් යොමු කර නොමැත.

(ආ) නව තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධනයන් සලකා බලමින් ඉඩකඩ අවශ්‍යතා විශ්ලේෂණය කිරීම (එකතු ඉඩකඩ, පාඨක ආසන ඉඩකඩ, ඉලෙක්ට්‍රොනික සේවා ස්ථාන ඉඩකඩ, නැරඹීම් සහ සවන් දීම් කාමර, කාර්ය මණ්ඩල සේවා ඉඩකඩ, හමුවීම් ඉඩකඩ, විශේෂ භාවිත ඉඩකඩ, ශ්‍රවණාගාර ආදිය)

(ඇ) රැහැන් සහිත සහ රැහැන් රහිත සබඳතා ජාල, අන්තර්ජාලය, කාලාපීය ජාල, ඩිජිටල් සේවා සපයන්නන් වෙත ප්‍රවේශ වීමට පොදු දුරකථන ජාල, ෆයිබර් ධාරිතාව යනාදියට සහාය වීම ඉලෙක්ට්‍රොනික සහ රැහැන් අවශ්‍යතා සපුරා ලීම

(ඈ) විශේෂ පුස්තකාල සමග එම සංවිධානවල ප්‍රයෝජනය සඳහා කුඩා හා මහා පරිමාණ විශේෂ පුස්තකාල ආදර්ශ සැලසුම් දෙකක් සැකසීම

(ඉ) පුස්තකාල කාර්යයන්, පුස්තකාල තාක්ෂණයන් සහ තොරතුරු මාධ්‍ය අනුබද්ධ කරමින් අභ්‍යන්තර සැලැස්මක් සංවර්ධනය කිරීම

(ඊ) වෙනත් රටවල විශේෂ පුස්තකාලවල ගොඩනැගිලි සැලසුම් පිළිබඳ දත්ත පදනමක් සංවර්ධනය කිරීම

(උ) විශේෂ පුස්තකාල සඳහා පුස්තකාල ගෘහ භාණ්ඩ පිළිබඳ දත්ත පදනමක් සංවර්ධනය කිරීම

5.11. <u>උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම</u>

(අ) උපායමාර්ගික සැලැස්ම සම්පාදනය කිරීමට විශේෂ පුස්තකාල දිරිමත් කිරීම

(ආ) එම ක්‍රියාවලියට සම්බන්ධ වන්නේ කව්ද, කවර අවස්ථාවකදී ද සහ කෙසේද යන්න නිශ්චය කිරීම

(ඇ) ලිඛිත උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම

(ඈ) මෙම සැලසුම් වාර්ෂිකව විමසුමට ලක් කිරීම

(ඉ) අවශ්‍ය පුහුණුව ලබා දෙමින් සහ ආදර්ශ සැලසුම් ප්‍රකාශයට පත් කරමින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සැලසුම් සම්පාදනයට පුස්තකාලයාධිපතිට සහාය විය යුතුය

(ඔ) සැලැස්මේ ගුණාත්මක බව අනාවරණය කර ගැනීමට, දුර්වලතා හඳුනා ගැනීමට සහ ඒවා සකසා ගැනීමට සුදුසු පියවර ගැනීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පර්යේෂණ වැඩසටහනක් දියත් කිරීම

5.12. <u>**උද්දේශන න්‍යාය පත්‍රය**</u>

(අ) ස්වකීය වගකීම් සපුරාලීමට විශේෂ පුස්තකාලවලට ප්‍රබල උද්දේශන වැඩසටහනක් අවශ්‍යය

(ආ) උද්දේශන න්‍යාය පත්‍රයක් සැකසීම

(ඇ) සියලු පාර්ශවයන්ගේ සහාය ඇතිව ශක්තිමත් උද්දේශන ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම

5.13. <u>**ආචාරධර්ම පද්ධතියක් අනුගමනය කිරීම**</u>

(අ) ප්‍රධාන ක්ෂේත්‍ර : තොරතුරු වෙත ප්‍රවේශය, පුද්ගලයා සහ සමාජය වෙත වගකීම, පෞද්ගලිකත්වය, රහසිගත බව සහ විනිවිදින බව, විවෘත ප්‍රවේශය සහ බුද්ධිමය දේපළ, ජාලකරණය, පුද්ගල අවංකත්වය සහ වෘත්තිය කුසලතා, වෘත්තිය සගයන්ගේ සහ සේවදායන්ගේ/සේවායෝජකයන්ගේ සබඳතාව

(ආ) ආචාරධර්ම පද්ධතිය ගැන විශේෂ පුස්තකාල කාර්ය මණ්ඩලය සහ කළමනාකරණය සඳහා දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම

(ඇ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වෘත්තියවේදී ආකාරයක් තුළ ආචාරධර්ම පද්ධතිය මෙහෙයවීම

5.14. <u>**සේවා සහ තත්ත්ව තක්සේරුව**</u>

(අ) විශේෂ පුස්තකාල සේවාවන් තක්සේරු කිරීමට පළාත් සභාව, පළාත් පුස්තකාල සේවා මණ්ඩලය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ එක්ව ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වාරික තත්ත්ව තක්සේරුවක් පැවැත්වීම

(ආ) අවම වශයෙන් වසර තුනකට වරක් ස්වයං තත්ත්ව තක්සේරු වැඩසටහන් පැවැත්වීමට විශේෂ පුස්තකාල යොමු කිරීම

(ආ) තමන්ගේ ව්‍යාපෘති/නිබන්ධ සඳහා විශේෂ පුස්තකාලවල විවිධ ව්‍යාපෘති පිළිබඳ තත්ත්ව තක්සේරු ව්‍යාපෘති පැවැත්වීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ, කැලණිය විශ්වවිද්‍යාලයේ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව හදාරණ සිසුන් දිරිමත් කිරීම

(ඇ) විශේෂ පුස්තකාලවල සේවා තත්ත්වය මැනීම සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සේවා තත්ත්ව මානයන් සංවර්ධනය කිරීම/හඳුනා ගැනීම (උදා: මාර්ගෝපදේශනය, බලා සිටීමේ කාලය, සේවාවේ ගුණාත්මක බව, තොරතුරුවල ගුණාත්මක බව, උපකරණවල ගුණාත්මක බව, පුස්තකාල පරිසරයේ, ප්‍රතිචාරාත්මකභාවයේ, සන්නිවේදනයේ ගුණාත්මක බව)

(ඇ) විශේෂ පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා තත්ත්ව තක්සේරුවක් පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම

## 6. <u>මහජන පුස්තකාල අංශය</u>

<u>පූර්විකාව</u>

තොරතුරු පිළිබඳ ප්‍රාදේශීය මධ්‍යස්ථාන ලෙස මහජන පුස්තකාලය ප්‍රාදේශීය ප්‍රජාව සඳහා අගනා සේවාවක් සපයයි. එය වයස, ජනවර්ගය, ලිංගික, ආගම, ජාතිකත්වය, භාෂාව හෝ සමාජ තත්ත්වය පිළිබඳ සැලකීමකින් තොරව සැමට සේවය කරයි. කියවීමේ පුරුදු වැඩි දියුණු කිරීම, අධ්‍යාපනයට සහාය වීම, තොරතුරු සහ ඩිජිටල් සාක්ෂර කුසලතා සංවර්ධනය කිරීමට සහාය වීම, ප්‍රජාවේ සැමට ගුණාත්මක තොරතුරු සේවාවක් සැපයීම මහජන පුස්තකාලයේ ප්‍රධාන අරමුණ වේ.

### 6.1. <u>ව්‍යවස්ථා</u>

i. පළාත් පාලන අංශයේ වත්මන් ව්‍යවස්ථා ශක්තිමත් කර සියලු පළාත් පාලන අධිකාරීන් සඳහා පුස්තකාල හා තොරතුරු සේවා අනිවාර්ය කිරීම

ii. රටේ සියලු ප්‍රජාවන්ට ගුණාත්මක පුස්තකාල සේවාවක් සැපයීමට සියලු මහජන පුස්තකාල වෙත ප්‍රමාණවත් සම්පත්, වෘත්තීය කාර්ය මණ්ඩල, නූතන පුස්තකාල ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් සහතික කිරීමට නවීන පළාත් පාලන පුස්තකාල ව්‍යවස්ථා සැපයීම

iii. පළාත් සභා පුස්තකාල ආඥා පනත් නොමැති පළාත් සභාවලට ඒවා හඳුන්වා දීම සහ එම ආඥා පනත් දැනටමත් හඳුන්වා දීම සහ එම ආඥා පනත් දැනටමත් හඳුන්වා දී ඇති පළාත් සභාවල එකී ආඥා පනත් ශක්තිමත් කිරීම

iv. මහජන පුස්තකාල අංශයට වැඩි සහායක් සැපයීමට ජාතික මට්ටමේ පුස්තකාල ව්‍යවස්ථා වැඩිදියුණු කිරීම

v. අදාළ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල චක්‍රලේඛ වර්ධනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවල නව චක්‍රලේඛ හඳුන්වා දීම
(අ) පුස්තකාලවල නැති වූ පොත් (ආ) පුස්තකාල ප්‍රමිති සහ ශ්‍රේණිගත කිරීම් (ඇ) පළාත් පුස්තකාල මණ්ඩල පළාත් මධ්‍ය පුස්තකාල පිහිටුවීම (ඇ) ප්‍රාදේශීය සභා සහ සමාන මට්ටම් තුළ පුස්තකාල කමිටු ආරම්භ කිරීම

6.2. <u>ප්‍රමිති</u>

i. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මහජන පුස්තකාල ප්‍රමිති ක්‍රියාත්මක කිරීමට බලධාරීන්ට බල කිරීම

ii. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මහජන පුස්තකාල ප්‍රමිති වැඩිදියුණු කිරීම

iii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් මහජන පුස්තකාල ප්‍රමිති පිළිබඳ නිශ්චිත සැලැස්මක් සැකසීම

iv. මහජන පුස්තකාල පිළිබඳ යුනෙස්කෝ සහ ඉෆ්ලා විසින් නිකුත් කරන ලද ප්‍රමිති සහ නියමු සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම

v. මහජන පුස්තකාල ප්‍රමිති පිළිබඳ වෙනත් රටවල විශිෂ්ට ව්‍යවහාර අධ්‍යයනය කිරීම

vi. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය යුනෙස්කෝ සහ ඉෆ්ලා විසින් හඳුන්වා දෙන ලද මහජන පුස්තකාල ප්‍රමිති ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කළ යුතු වීම

vii. පවත්නා මහජන පුස්තකාල ප්‍රමිති අනුගමනය කිරීමට ඇතැම් පළාත් පාලන බලධාරීන්ගේ නොහැකියාව සඳහා හේතු හඳුනා ගැනීමට පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම සහ එහි ප්‍රතිඵල බලධාරීන්ට දැනුම් දීම

viii. පවත්නා මහජන පුස්තකාල ප්‍රමිති ප්‍රවර්ධනය කිරීම සහ ඒවා අනුගමනය කිරීමටත් මහජන පුස්තකාල සේවාවේ ගුණාත්මක බව වර්ධනය කිරීමටත් පුස්තකාල බලධාරීන්ට බල කිරීම

6.3. <u>ජාලකරණය</u>

i. පළාත් සභා මට්ටමින් මහජන පුස්තකාල ක්ෂේත්‍රයෙහි ජාලකරණය දිරිමත් කිරීම

ii. ජාලකරණයේ සහයෝගීතාවේ ප්‍රතිලාභ පිළිබඳ පළාත් සභා අධිකාරීන් සහ පුස්තකාලයාධිපතීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත් කිරීම

iii. මහජන පුස්තකාල ජාලකරණය පිළිබඳ නියමු හඳුන්වා දීම

## 6.4. <u>මහජන පුස්තකාල කාර්ය මණ්ඩල</u>

i. පළාත් සභා විසින් හඳුන්වා දෙන ලද මහජන පුස්තකාලයාධිපතීන්ගේ සේවා ව්‍යවස්ථාව වැඩිදියුණු කිරීම

ii. වර්තමානයේ විවිධ පළාත්වල මහජන පුස්තකාලයාධිපතීන් සඳහා විවිධ සේවා ව්‍යවස්ථා ක්‍රියාත්මක වේ. සියලු පළාත් සඳහා පොදු සේවා ව්‍යවස්ථාවක් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍යය.

iii. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මහජන පුස්තකාල ප්‍රමිතිවලට අනුව පුස්තකාල කාර්ය මණ්ඩල සංඛ්‍යාව නිර්මාණය කිරීමට භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා ඒකකයට බල කිරීම. වර්තමානයේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් ඇතැම් මහජන පුස්තකාල අධි ශ්‍රේණයට සහ වෙනත් ඉහළ ශ්‍රේණිවලට උසස් කර තිබුණ ද එම පුස්තකාලවල අධිශ්‍රේණියේ සහ වෙනත් උසස් තනතුරු ගණනාවක් නිර්මාණය කර නොමැත.

iv. මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභාවල පුස්තකාල කාර්ය මණ්ඩල ඇබෑර්තු පිළිබඳ දත්ත පදනමක් නිර්මාණය කිරීම

v. කාර්ය මණ්ඩල ඇබෑර්තු සම්පූර්ණ කිරීමට බලධාරීන්ට බල කිරීම

vi. මහජන පුස්තකාල භාරව සිටින වෘත්තීය නොවන පුද්ගලයන් ඉවත් කිරීමටත් පුස්තකාල සඳහා අනියම්/තාවකාලික වෘත්තීය නොවන පුද්ගලයන් බඳවා ගැනීම නවතාලීමටත් හඬ නැංවීම

## 6.5. <u>පුහුණුව/ධාරිතා ගොඩනැංවීම</u>

i. ජාතික, පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ධාරිතා ගොඩනැංවීමේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සැපයීම

ii. දුර බැහැර ප්‍රදේශවල සිටින මහජන පුස්තකාලයාධිපතීන් සඳහා පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කිරීමට විශේෂ වැඩපිළිවෙළක් සැකසීම

iii. ස්වකීය සේවා සුදුසුකම් නිසා ජ්‍යොෂ්ඨ තනතුරු දරන පුස්තකාලයාධිපතීන් පුස්තකා හා විඥාපන විද්‍යා ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීමට පෙළඹවීම

iv. වෙනත් පුස්තකාල අධිකාරීන් සමග (ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල, පළාත් පුස්තකාල සේවා මණ්ඩල, පළාත් සභා) හැකිතාක් දුරට ප්‍රායෝගික ඒකාබද්ධ පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීම)

v. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ, පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහාය ඇතිව පුස්තකාල ස්වයංක්‍රියකරණය සහ මහජන පුස්තකාලවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳ විශේෂ ව්‍යාපෘතියක් දියත් කිරීම

## 6.6. උද්දේශනය

i. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මහජන පුස්තකාල කණ්ඩායම මහජන පුස්තකාල සඳහා උද්දේශන සැලැස්මක් සකස් කළ යුතුය
ii. ජාතික හා පළාත් මට්ටමේ උද්දේශන කණ්ඩායම් ගොඩ නැංවීම
iii. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, පළාත් පුස්තකාල සේවා මණ්ඩල, පළාත් පාලන අමාත්‍යාංශය සහ වෙනත් අධිකාරීන් සමග සමීප සම්බන්ධයක් ගොඩ නංවා ගැනීම

## 6.7. පුස්තකාල ගොඩනැගිලි

i. නූතන, හරිත මහජන පුස්තකාල ගොඩනැගිලි ප්‍රවර්ධනය කිරීම
ii. නූතන මහජන පුස්තකාල ගොඩනැගිලිවල සැලසුම් සහ ඡායාරූප එක්රැස් කිරීම
iii. කුඩා සහ මධ්‍යම පරිමාණයේ මහජන පුස්තකාල ගොඩනැගිලි සඳහා ප්‍රමිති සහ සැලසුම් සකස් කිරීම

## 6.8. තොරතුරු සාක්ෂරතා සහ ඩිජිටල් සාක්ෂරතා වැඩසටහන්

i. පාඨකයන් සඳහා තොරතුරු සාක්ෂරතා වැඩසටහන් පැවැත්වීමට පුස්තකාල කාර්ය මණ්ඩල පෙළඹවීම
ii. පුහුණු වැඩසටහන් සහ ප්‍රවර්ධන සාහිත්‍ය හරහා පුස්තකාල කාර්ය මණ්ඩලයට අවශ්‍ය කුසලතා සහ දැනුම සැපයීම
iii. මහජන පුස්තකාලවල ඩිජිටල් සාක්ෂරතා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම
iv. වැඩසටහන් සඳහා පුස්තකාල කාර්ය මණ්ඩලයට අවශ්‍ය සහාය සැපයීම

## 6.9. ආදර්ශ මහජන පුස්තකාල

i. කුඩා, මධ්‍යම සහ මහා පරිමාණ මහජන පුස්තකාල වර්ග තුනක් සඳහා නිශ්චිත සැලැස්මක් සංවර්ධනය කිරීම
ii. සෑම දිස්ත්‍රික්කයකටම ත්‍රිවිධ වර්ගයේ ආදර්ශ මහජන පුස්තකාල ස්ථාපිත කිරීමට බලධාරීන් පෙළඹවීම
iii. එකතු සංවර්ධනය, සංවිධානය සහ සේවා සඳහා වෘත්තීය සහාය සහ අවශ්‍ය පුහුණුව සැපයීම
iv. මෙම පුස්තකාලවල තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, සමාජ මාධ්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම

v. මෙම ආදර්ශ පුස්තකාල ප්‍රවර්ධනය කිරීම සහ ස්වකීය පුස්තකාල වැඩිදියුණු කිරීමට වෙනත් පුස්තකාල බලධාරීන්, පුස්තකාලයාධිපතීන් පෙළඹවීම

6.10. <u>මහජන පුස්තකාල අතර ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීම</u>

i. සැලකිය යුතු මහජන පුස්තකාලයාධිපතීන් සංඛ්‍යාවක් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට සම්බන්ධ නොවීමට හේතු අනාවරණය කර ගැනීඹ සඳහා සමීක්ෂණයක් පැවැත්වීම

ii. ඔවුන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට ආකර්ශනය කර ගැනීම සඳහා ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කිරීම

iii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වැදගත්කම පුස්තකාලයාධිපතීන්ට ඒත්තු ගැන්වීම සඳහා මහජන පුස්තකාල ක්ෂේත්‍රය ඉලක්ක කර වෘත්තීය ක්‍රියාකාරකම් දියත් කිරීම

6.11. <u>ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ආචාරධර්ම පද්ධතිය අනුගමනය කිරීම</u>

i. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය තම ආචාරධර්ම පද්ධතිය පිළිබඳ පළාත් පාලන බලධාරීන්, පුස්තකාල කාර්ය මණ්ඩල දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය

ii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ආචාරධර්ම පද්ධතියට සම්බන්ධ විනය යාන්ත්‍රණයේ මනා ක්‍රියාකාරීත්වය සහතික කළ යුතුය

6.12. <u>ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ භූමිකාව</u>

i. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ මහජන පුස්තකාල ක්ෂේත්‍රය අතර සම්බන්ධකය ලෙස ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මහජන පුස්තකාල කණ්ඩායම ස්වකීය භූමිකාව පිළිබඳ වඩාත් වගවිය යුතුය.

ii. මහජන පුස්තකාල ක්ෂේත්‍රය පිළිබඳ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් මහජන පුස්තකාල කණ්ඩායමට තිබිය යුතු වීම සහ වර්ෂ අවසානයේ අවශ්‍ය උපදෙස්/මගපෙන්වීම් සමග ප්‍රගති වාර්තාවක් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට ඉදිරිපත් කළ යුතු වීම

iii. මහජන පුස්තකාල කණ්ඩායම සැලැස්මේ ප්‍රගතිය සහ අභියෝග පිළිබඳ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති සමග සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යා යුතුය.

6.13. <u>පරිපාලන හා සහායක යාන්ත්‍රණය ශක්තිමත් කිරීම</u>

i. පළාත් පුස්තකාල සේවා මණ්ඩල ශක්තිමත් කිරීම

ii. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ව්‍යාප්ති සේවා අංශය ශක්තිමත් කිරීම

iii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මහජන පුස්තකාල කණ්ඩායම ශක්තිමත් කිරීම

iv. මහජන පුස්තකාලවල පුස්තකාල කමිටු ශක්තිමත් කිරීම

6.14. <u>සංවිධානය තුළ මහජන පුස්තකාලයේ ස්ථානය සහ භූමිකාව</u>

i. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හා පළාත් පුස්තකාල සේවා මණ්ඩලවල සහාය ඇතිව ප්‍රජා සංවර්ධනය, අධ්‍යාපනය, ආර්ථික සංවර්ධනය සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ දී මහජන පුස්තකාලයේ වටිනාකම පිළිගැනීමට බලධාරීන්ට බල කළ යුතුය.

ii. පළාත් පාලන අමාත්‍යාංශය සහ පළාත් සභා විසින් නිකුත් කරන ලද මහජන පුස්තකාලවලට සම්බන්ධ චක්‍රලේඛ එක් රැස් කර අධ්‍යයනය කිරීම සහ කලින් කලට ඒවා වැඩිදියුණු කිරීමට යෝජනා ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය කටයුතු කළ යුතුය.

iii. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, මහජන පුස්තකාල ප්‍රවර්ධනය සඳහා ජාතික ප්‍රචාරක වැඩසටහනක් දියත් කිරීම

iv. මහජන පුස්තකාල සේවාවල ගුණාත්මක බව සොයා බැලීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වාරික සමීක්ෂණ පැවැත්වීම සහ ඒවා ප්‍රකාශයට පත් කිරීම

6.15. <u>සංවිධානය තුළ පුස්තකාලය ස්ථානය</u>

i. සෑම මහජන පුස්තකාලයකටම වෘත්තීය පුස්තකාලයාධිපතිවරයෙකු සහ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටිය යුත් බවට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය බලධාරීන්ට බල කළ යුතුය

ii. අනෙකුත් වැදගත් අංශවල ප්‍රධානීන්ට සමාන මට්ටමෙහි ලා පුස්තකාලයාධිපතීන්ට සැලකීමට උපදේශ චක්‍රලේඛ හරහා පළාත් පාලන බලධාරීන් දැනුවත් කිරීමට අධිකාරීන් පෙළඹවීම

iii. පුස්තකාලයාධිපති ගුණාත්මක පුස්තකාල හා තොරතුරු සේවාවක් පවත්වා ගෙන යා යුතු අතර ප්‍රාදේශීය ප්‍රජාවගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීමට සහාය විය යුතුය